# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014** ජූනි **17** වන අඟහරුවාදා
2014 ஆணி 17 செவ்வாய்க்கிழமை
Tuesday 17th June 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.43 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.43 க்கு சபை கூடியது
The Provincial Council met at 09.43 a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"පසුගිය සභා රැස්වීම් දින එනම් 2014/06/03 වන දින සභාවේ වැඩ කටයුතු සම්බන්ධයෙන්, ඇතැම් පුවත්පත්වල එවකට වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමාගේ ආසනය සම්බන්ධයෙන් සභාවේ ලේකම්වරයා විසින් නියෝගයක් කළ බවත් ඇතැම් මාධ්‍යවල එය සභා ලේකම්වරයාගේ මැදිහත්වීමක් සිදු වූ බවත් වාර්තා වී තිබුණා.*

*2014 ජූනි මස 05 වන දින "ලංකාදීප" පුවත්පතේත්, 2014 ජූනි මස 06 දින "ලංකාදීප" පුවත්පතේත්, 2014 ජූනි මස 08 වන දින "දිවයින" ඉරිදා සංග්‍රහයේද, තවත් පුවත්පත් කිහිපයකද එය පළ වී තිබුණා.*

*මෙම සභාවේ කාර්ය පාටිපාටි රීති අංක 03(2) හා 03(3) ට අනුව සභාවේ අසුන් සම්බන්ධයෙන් මැදිහත් වනුයේ, මෙම සභාවේ සභාපතිවරයායි. එමෙන්ම සභාව පවත්වාගෙන යැමේදී සභා ගර්භයේ සියලු කටයුතු කෙරෙනුයේ රීති අංක 109(2) හා (3) අනුව වගකීම් පැවරී ඇති මෙම සභාවේ සභාපතිවරයා හෝ සභාපතිවරයා වෙනුවෙන් මූලාසනාරූඪ වී සිටින නියෝජ්‍ය සභාපතිවරයා හෝ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීවරයායි.*

*ඇතැම් මන්ත්‍රීවරුන්ට මේ නිසා යම් කුකුසක් ඇතිවන්නට පුළුවන්. සභා රීති උල්ලංඝණය වුවාද, සභාවේ ගරුත්වයට හානියක් වූවාද කියලා. ඒ නිසා එය නිවැරැදි කිරීමට මට යුතුකමක් තිබෙනවා. සභා රීති 14 (4) හි පළාත් සභාවේ හෝ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝණය වන වාර්තාවන් හෝ අසත්‍ය වාර්තාවන් පුවත්පත් මාධ්‍යයක පළ කළහොත් අවවාද කිරීම් හෝ සභාපතිතුමාගේ අභිමතය පරිදි කටයුතු කළ හැකි යැයි සඳහන් වෙනවා.*

*ඒ නිසා මම නැවතත් ප්‍රකාශ කරනවා. එදින සභාවේ අසුන් සම්බන්ධව කිසිදු මැදිහත්වීමක්, නියෝග කිරීමක් සභා ලේකම්වරයා විසින් නොකළ බවත්, එසේ සිදු වූවා යැයි පැවසීම සත්‍යයෙන් තොර බවත්. ඒ නිසා එවැනි වාර්තා පළ කළ මාධ්‍යවල නියෝජිතයන්ගෙන් එය නිවැරැදි කිරීමට පියවර ගන්නා ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.*

*සමහරවිට එම මාධ්‍ය නියෝජිතයන් ආධුනිකයන් වන්නටත් පුළුවන්. ඒ නිසා ඒ අයටත් සෙසු සියලු පාර්ශවයන්ටත් අයහපතක්, අගතියක් නොවන පරිදි සභාවේ ගෞරවය රැක ගැනීම උදෙසා නැවත නිවැරැදි කිරීමක් පළ කිරීමට කටයුතු කරන මෙන් එතුමන්ලාගෙන් සද්භාවයෙන් යුතුව නැවතත් කාරුණිකව ඉල්ලා සිටිනවා."*

*ii*

*අමාත්‍යාංශ උපදේශක කාරක සභා සහ අනෙකුත් කාරක සභා සඳහා ගරු මන්ත්‍රීවරුන් නම් කිරීම.*

***උපදේශක කාරක සභා පත් කිරීම :***

***බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය***

*සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා*
*ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා*

ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමා
මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා
මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා
ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා
රොජර් සෙනෙවිරත්න ගරු මන්ත්‍රීතුමා
මොහොමඩ් ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමා
සහන් ප්‍රදීප් විතාන ගරු මන්ත්‍රීතුමා
මල්ෂා කුමාරණතුංග ගරු මන්ත්‍රීතුමිය
සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමා
කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා
නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා
මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා
ඇඩ්වඩ් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා
එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා
රොඩ්නි ප්‍රේසර් ගරු මන්ත්‍රීතුමා
මනෝ ගනේෂන් ගරු මන්ත්‍රීතුමා
ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා
ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා

**බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය**

සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමා
ලලිත් වනිගරත්න ගරු මන්ත්‍රීතුමා
ලයනල් ජයසිංහ ගරු මන්ත්‍රීතුමා
උපාලි ගුණරත්න ගරු මන්ත්‍රීතුමා
සුමිත් ලාල් මැන්දිස් ගරු මන්ත්‍රීතුමා
ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා
ජගත් කුමාර ගරු මන්ත්රීතුමා
හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ගරු මන්ත්‍රීතුමිය
සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා
ලක්ෂ්මන් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා
ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා
පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා
උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමා
උදාර රත්නායක ගරු මන්ත්‍රීතුමා
අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා
ජී. නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමා
සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා
කේ.ඩී. ලාල්කාන්ත ගරු මන්ත්‍රීතුමා
සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා
අනුරුද්ධ ලේකම්ගේ ගරු මන්ත්‍රීතුමා

**බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය**

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා
ආනන්ද රංජිත් රූපසිංහ ගරු මන්ත්‍රීතුමා
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා ගරු මන්ත්‍රීතුමා
චන්දන ජයකොඩි ගරු මන්ත්‍රීතුමා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමිය
පියල් නිශාන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා
සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා
ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා
සමන්මලී සකලසූරිය ගරු මන්ත්‍රීතුමිය
මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා
රෝහණ අබේගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා
මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා
යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා
සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා
එම්.එස්.එම්. ෆයිරූස් ගරු මන්ත්‍රීතුමා
ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා
ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා
අරුණ දීපාල් කටුවාවලගේ ගරු මන්ත්‍රීතුමා
මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා
රජිත රංගන හපුආරච්චි ගරු මන්ත්‍රීතුමා

**බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**

යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා
ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා
සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමිය
අමල් පුෂ්පකුමාර ගරු මන්ත්‍රීතුමා
ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා
ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා
රවින්ද්‍ර ප්‍රසාද් විජේසේකර ගරු මන්ත්‍රීතුමා
ඇන්ටනී උපුල් රාජිත ගරු මන්ත්‍රීතුමා
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා

*නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය*
*හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා*
*ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*ජයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා*
*රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා*
*විජිත් ප්‍රියන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා*
*ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා ගරු මන්ත්‍රීතුමා*
*අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා*
*නලින් ප්‍රදීප් උඩුවෙල ගරු මන්ත්‍රීතුමා*
*රවීන්ද්‍ර යසස් කුමානායක ගරු මන්ත්‍රීතුමා*

**බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය**

*සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා*
*නවුසර් ෆවුසි ගරු මන්ත්‍රීතුමා*
*නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා*
*කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා*
*මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමා*
*අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමා*
*නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා*
*ලලන්ත ගුණසේකර ගරු මන්ත්‍රීතුමා*
*තුෂාර වජිර පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා*
*සුනේත්‍රලාල් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා*
*ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය*
*ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා*
*කාවින්ද හේෂාන් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා*
*ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා*
*එස්. කුහවර්ධන් ගරු මන්ත්‍රීතුමා*
*නලීන්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා*
*නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා*
*අසෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා*

**කාරක සභා පත් කිරීම :**

**පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව :**

**සාමාජික සංඛ්‍යාව - 11**

*ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා -කාරක සභාවේ සභාපති (නිලබලයෙන්)*
*මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා*
*ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා*
*ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා*
*මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා*
*සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමා*
*යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*එම්.එස්.එම්. ෆයිරුස් ගරු මන්ත්‍රීතුමා*
*සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා*
*සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා*

**මහජන පෙත්සම් කාරක සභාව :**

**සාමාජික සංඛ්‍යාව - 11**

*සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා - කාරක සභාවේ සභාපති (නිලබලයෙන්)*
*සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමිය*
*සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා*
*ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා*
*පියල් නිශාන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා*
*සහන් ප්‍රදීප් විතාන ගරු මන්ත්‍රීතුමා*
*සුනේත්‍රලාල් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා*
*ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා*
*එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා*
*ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා*
*රවීන්ද්‍ර යසස් කුමානායක ගරු මන්ත්‍රීතුමා*

**අවදි කාරක සභාව :**

**සාමාජික සංඛ්‍යාව - 11**

*සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා - කාරක සභාවේ සභාපති (නිලබලයෙන්)*
*යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා*
*ප්‍රදීප් උඳුගොඩ ගරු මන්ත්‍රීතුමා*
*ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා*
*සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා*
*තුෂාර වජිර පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා*
*මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා*
*ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*ඇඩ්වඩ් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා*
*අරුණ දීපාල් කටුවාවලගේ ගරු මන්ත්‍රීතුමා*

**ප්‍රඥප්ති හා නීති කාරක සභාව :**

**සාමාජික සංඛ්‍යාව - 11**

*සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා*
*කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා*
*හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ගරු මන්ත්‍රීතුමිය*
*සමන්මලී සකලසූරිය ගරු මන්ත්‍රීතුමිය*
*සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමා*
*ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා*
*රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය*
*ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා*
*ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා*

**කාර්ය පටිපාටි රීති කාරක සභාව :**

**සාමාජික සංඛ්‍යාව - 11**

*සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා - කාරක සභාවේ සභාපති (නිලබලයෙන්)*
*යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*ගරු සභානායකතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමා*
*උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා*
*මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා*
*රෝහණ අබේගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා*
*මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමා*
*අනුරුද්ධ ලේකම්ගේ ගරු මන්ත්‍රීතුමා*

**ගෘහ කාරක සභාව**

**සාමාජික සංඛ්‍යාව - 11**

*සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා - කාරක සභාවේ සභාපති (නිලබලයෙන්)*
*රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*ගරු සභානායකතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා ගරු මන්ත්‍රීතුමා*
*ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා*
*ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා*
*මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා*
*අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා*

**සභා කටයුතු කාරක සභාව**

**සාමාජික සංඛ්‍යාව - 11**

*සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා - කාරක සභාවේ සභාපති (නිලබලයෙන්)*
*රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*ගරු සභානායකතුමා - කාරක සභාවේ සාමාජික(නිලබලයෙන්)*
*ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා - කාරක සභාවේ සාමාජික(නිලබලයෙන්)*
*සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමා*
*හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා*
*සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා*
*සුමිත් ලාල් මැන්ඩිස් ගරු මන්ත්‍රීතුමා*
*හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා - කාරක සභාවේ සාමාජික (නිලබලයෙන්)*
*රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය*
*නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා*
*නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා*

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද යටතේ මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ. අධ්‍යාපන උපදේශක කාරක සභාවට මගේ නම නැති වගක් කියැවුණා. පොඩ්ඩක් බලන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂයය භාර ගරු ප්රධාන අමාත්‍යතුමා තමයි මට මේ නාම ලේඛනය ඉදිරිපත් කළේ. එතුමා -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මගේ නම තියෙනවාද කියලා පොඩ්ඩක් බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොළඹ දිස්ත්‍රික්කයේ ඔබතුමාගේ නම නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමා මගින් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒක Group Meeting ඒකේදී කියන්න. මෙතැන කථා කරන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

කවුද ඒ කථා කරන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි, අපි. මෙහෙ මෙහේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

පොඩ්ඩක් පඩියා වෙන්නේ නැතුව ඉන්න කෝ? මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මම හිතන්නේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම නොකඩවා අධ්‍යාපන උපදේශක කාරක සභාවේ හිටියා. ඒ නිසා මගේ නම ඇතුළත් කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඊයේ කණ්ඩායම් රැස්වීමට ආවා නම් - ඒ පිළිබඳව ගරු ප්‍රධාන ඇමැතිතුමා පැහැදිලි කිරීමක් කළා. මම හිතන්නේ ඔබතුමා ආවා නම් ආණ්ඩු පක්ෂ රැස්වීමට -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ආණ්ඩු පක්ෂ රැස්වීමට ආපු නැති එක වෙනත් කාරණයක් ගරු සභාපතිතුමනි. මේක වෙනත් කාරණයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දින පස්වරු 01.30 ට මෙම සභාව අවසන් වීමෙන් පසු මාගේ නිල කාමරයේදී සභා කටයුතු කාරක සභා රැස්වීම පැවැත් වෙනවා. මම සභා කටයුතු කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරු සියලු දෙනාටම ආරාධනා කරනවා එකී කාරක සභාවට සහභාගී වන ලෙසට.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මම සභා කටයුතු කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට සිටිනවා. අපට ඒ කාරක සභාව පවත්වාගෙන යන්න ලොකු ගැටළුවක් තිබෙනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියට මම ඒ කාරක සභාවට සහභාගී වෙනවා. නමුත් ආණ්ඩු පක්ෂයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ ඒක ඔබතුමාට අදාළ නැති ප්‍රශ්නයක්. වරප්‍රසාද නොවෙයි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඒක ගැටළුවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ගැටළුවක් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයෙක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36 (1) රීතියට අදාළ නැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ආණ්ඩු පක්ෂයේ සභානායකවරයෙක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාපති ඉන්නවා නේ?

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

එතකොට ගරු සභාපතිතුමනි, අපි කාරක සභාව කරගෙන යන්නේ කොහොමද? ඉතින් මම ඉල්ලීමක් කරනවා, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමා මේ සභාව විහිළුවට ලක් කරන්න එපා. කරුණාකරලා වාඩි වෙන්න. න්‍යාය පත්‍රයේ තව වැඩ කටයුතු ගොඩක් තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ආණ්ඩුවේ ලොකු ගැටළුවක් තිබෙනවා. තමන්ට ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයෙක් පත් කර ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. එහෙම ප්‍රශ්නයක් නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.)

ඒකෙන් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩ වෙන්නේ කොහොමද කියලා එතුමා මුලින්ම පැහැදිලි කරලා -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඇයි -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

වරප්‍රසාද කඩවීමක් තිබෙනවා නම් -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඔව්. වරප්‍රසාද කඩ වීමක් තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළොත් ඒකේ යම් පැහැදිලි කිරීමක් අපට කරන්න පුළුවන්.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඇමැතිතුමාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කොහෙත්ම අදාළ නැහැ. සංවිධායකතුමා කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමා විපක්ෂය බලා ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේදී අනවශ්‍ය දේවල් කථා කරන්න එපා. ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මේ ගැටළුව අපට විසඳලා දෙන්න. අපට ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයෙක් නැතුව මේ සභා කටයුතු කාරක සභාව කරගෙන යන්න විධියක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services and Information)

ගරු සභාපතිතුමනි, මේකෙන්ම පැහැදිලි වෙනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතුමා මතු කරපු කාරණාවෙන්ම පැහැදිලි වෙනවා, මොන තරම් දුර්වලද, මොන තරම් භයද ආණ්ඩු පක්ෂයේ අය නැති වුණාම කියලා. මේ වාගේම සභාවකවත් වාඩි වෙන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

නැහැ, කිසිම භයක් නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අවස්ථාවක් දෙනවා, පුළුවන් නම් ඔබතුමන්ලාගෙන් ගණපූරණය තියලා පෙන්වන්න. කරන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයෙක් පත් කරන්න මොකක්ද තිබෙන ගැටළුව?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමන්ලා භයයි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඇයි සන්ධානයේ ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ අපේ සන්ධානයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අපි කාරක සභාවට යන්න ඕනෑ. සභා කටයුතු කාරක සභාවේ සාමාජිකයෝ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. 36 (1) කියලා අනවශ්‍ය කාරණාවලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, තවම බොදු බල සේනාවේ අනුමැතිය ලැබිලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ඊළඟ නිවේදනය,

[ගරු සභාපතිතුමා]

*iii*

*"VI වන පළාත් සභාවේ සඳහා තේරී පත් වූ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහනක් 2014 ජුනි 20, 21 සහ 22 දිනවලදී පැවැත්වෙනවා. දැනටමත් ඒ පිළිබඳව දැනුවත් කිරීමේ ලිපියක් ගරු මන්ත්‍රීවරුන්ට ලැබෙන්නට සලස්වා තිබෙනවා. ඒ අනුව මම ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා එම වැඩ මුළුවට සහභාගී වන ලෙසත්, එම වැඩමුළුම සාර්ථක කර ගැනීමට නියමිත වේලාවට සහභාගී වන ලෙසත්, ඒ සඳහා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සහයෝගය ලබා දෙන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිනවා."*

## කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014.06.03 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant report are placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
## PETITIONS

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, කඳාන, දකුණු බඩගම, අංක 270 හි පදිංචි ඒ. අසෝකා මල්මාලිකා පීරිස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඇස්.කේ. කිඳෙල්පිටිය**
Hon. S.K. Kindelpitiya

ගරු සභාපතිතුමනි, රාජගිරිය, රාජගිරිය පාර, අංක 51/2 හි පදිංචි ගාමිණී හෙට්ටිආරච්චි යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

## බස්නාහිර පළාත් සභාවට අයත් පාසල්වල 2013 වසරේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල
## G.C.E. (ORDINARY LEVEL) RESULTS OF YEAR 2013 OF SCHOOLS CONTROLLED UNDER WESTERN PROVINCIAL COUNCIL

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**01.**

**අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/14/01)**

අ. බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුනෙහි බස්නාහිර පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල 2013 වසරේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල අනුව එම දිස්ත්‍රික් 03 සඳහා ශ්‍රී ලංකාවේ හිමි වී ඇති ස්ථානය තුන කවරේද?

ආ. බස්නාහිර පළාත් සභාව යටතේ 2013 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද?

ඇ. පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වලින් ගණිතය විෂයයන් අසමත් වූ සිසු සිසුවියන් සංඛ්‍යාව කීයද?

ඈ. පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල ඉංග්‍රීසි විෂයයන් අසමත් වූ සිසු සිසුවියන් කීයද?

ඉ. එම ප්‍රතිඵල පිළිබඳ ඔබතුමා සෑහීමකට පත්වේද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද? ගත් පියවර කවරේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. අ.පො.ස. (සා. පෙළ) ප්‍රතිඵල පළාත් මට්ටමින් විශ්ලේෂණය නොකරන බැවින්, පිළිතුරක් ලබා දිය

නොහැක. මේ පිළිබඳව අමාත්‍යාංශයේ ලේකම් විසින් විභාග කොමසාරිස් ජනරාල් ගෙන් විමසූ විට ලබා දෙන ලද පිළිතුර මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් 01 - විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක RD/16/03/09/2014 හා 2014.05.19 දිනැති ලිපිය)[1]

ආ. සිසුන් සංඛ්‍යාව - 46,724 කි.

ඇ. අසමත් සිසුන් සංඛ්‍යාව - 22,744 කි.
අසමත් ප්‍රතිශතය - 48.79%

*ගරු සභාපතිතුමනි, මේ සමග පසුබිම් වාර්තාවේ තිබෙනවා, 2008 බස්නාහිර පළාතේ උසස් පෙළට සමත් වෙන්නේ 47% යි. ඒ ප්‍රමාණය වර්ධනය වෙලා 2013 වනකොට 58.5% යි. මේ පළාත් පාසල්වල තත්ත්වය වර්ධනය වෙලා තිබෙනවා. මම හිතන්නේ ඒකේ ගෞරවය අධ්‍යාපන දෙපාර්තමේන්තුවට, විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට ලැබෙන්න ඕනෑ. ඊළඟට අපේ ඉලක්කය අපි මේකේ කියනවා.*


ඇ. අසමත් සිසුන් සංඛ්‍යාව - 23,458 කි.
අසමත් ප්‍රතිශතය - 50.30%

ඉ. සෑහීමට පත් නොවේ.

ඊ. සෑහීමට පත් වීමට නම් සිසුන්ගේ විභාග සමත්වීමේ ප්‍රගතිය 100% ක් විය යුතුය. එහෙත් 2008 සිට 2013 වසර දක්වා අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵලවල වර්ධනයක් වී ඇති බව ඇමුණුම් 2[2] මගින් පැහැදිලි වේ.

පළාතේ සිසුන්ගේ ප්‍රතිඵල සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා

1. 11 ශ්‍රේණියේ පළමු වාරයේ ප්‍රතිඵල විශ්ලේෂණය කර දැනට අඩු සාධන මට්ටමක් පෙන්වන එහෙත් අවශ්‍යා සාධන මට්ටම කරා ගෙන ආ හැකි සිසුන් හඳුනාගෙන ඔවුන් සඳහා විශේෂ කඩිනම් ප්‍රතිකාරය (Remedial) වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
2. පළාතේ ඉහළ ප්‍රතිඵල අත්කර ගත් ගුරු භවතුන් මගින් විෂයය භාර ගුරුවරුන් යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.
3. ද්විතියික මට්ටමේ පන්තිවල ඉගෙනුම් ක්‍රියාවලියේ යෙදෙන ගුරු භවතුන් යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.
4. ගුරු පුහුණුව හා පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කර ඇත.
5. ගැටළු හඳුනා ගැනීම හා විසඳුම් ලබා දීම සඳහා ජාතික මට්ටමේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීනයන්ගෙන් යුත් කමිටුවක් මගින් ලැබෙන උපදෙස් මත තවදුරටත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.


ඇමුණුම් -

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
Department of Examinations, Sri Lanka
NATIONAL EVALUATION AND TESTING SERVICE
පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்ல
Pelawatta, Battaramulla.

මගේ අංකය / எனது இல / MY No: RD/16/03/09/2014
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2014.05.19

දුරකතන / தொலைபேசி / Telephone: 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206, 2787207
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503 කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O. Box 1503 Colombo
අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Web Address: www.docnets.lk
E-mail : examd@sltnet.lk

ලේකම්,
අධ්‍යාපන, පළාත් පාලන හා ඉඩම් අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

2013 අ.පො.ස.(සා.පෙළ) විභාගයේ බස්නාහිර පළාතට අදාළ තොරතුරු ලබා ගැනීම

උක්ත කරුණට අදාළව ඔබගේ අංක. සීඑම්/ ඩබ්පී/ඊ 10/1 - 1 හා 2014.05.16 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු මේ සමඟ එවමි.

(I) බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුනෙහි බස්නාහිර පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල 2013 වසරේ අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල අනුව එම දිස්ත්‍රික්ක 3 සඳහා ශ්‍රී ලංකාවේ හිමි වී ඇති ස්ථාන 03 කවරේද?
කොළඹ දිස්ත්‍රික්කය - 01
කළුතර දිස්ත්‍රික්කය - 09
ගම්පහ දිස්ත්‍රික්කය - 11

(II) බස්නාහිර පළාත් සභාව යටතේ 2013 සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද?
එම සංඛ්‍යාව 71357 කි.

(III) පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වලින් ගණිතය විෂයයන් අසමත් වූ සිසු සිසුවියන් සංඛ්‍යාව කීයද?
එම සංඛ්‍යාව 27007 කි.

(IV) පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල ඉංග්‍රීසි විෂයයන් අසමත් වූ සිසු සිසුවියන් සංඛ්‍යාව කීයද?
එම සංඛ්‍යාව 26712 කි.

ඉහත සංඛ්‍යා ගණනය කර ඇත්තේ පළමුවරට විභාගය සඳහා පෙනී සිටි පාසල් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු පදනම් කරගෙන බව වැඩිදුරටත් දන්වමි.

ගයාත්‍රි අබේගුණසේකර
විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
විභාග කොමසාරිස් ජනරාල් වෙනුවට

*අමුණුම් **02 :***

*ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 අතුරින් බස්නාහිර පළාතට අයත් කොළඹ, කළුතර, ගම්පහ දිස්ත්‍රික්ක සඳහා පිළිවෙළින් අංක 01, 09, 11 ස්ථාන ලැබී ඇත. සමස්ත ශ්‍රී ලංකා ප්‍රතිඵලය අනුව දිවයිනේ 2013 අ.පො.ස. (සා.පෙළ) සමත් වූවන්ගේ සමස්ත ප්‍රතිශතය 66.67% කි.*

[1] පිළිතුර අවසානයේ පළ කර ඇත.
[2] - එම -

*නමුත් බස්නාහිර පළාතේ 2013 අ.පො.ස. (සා.පෙළ) සමත් ප්‍රතිශතය 68.71% කි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රතිඵලය සලකා බැලීමේ දී බස්නාහිර පළාත ඉහළින් සිටියි.*

| | විෂයය | පෙනී සිටි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | අසමත් සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | අසමත් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| පළාත් සභා පාසල් | ගණිතය | 46,615 | 23,871 | 22,744 | 51.21% | 48.79% |
| | ඉංග්‍රීසි | 46,639 | 23,181 | 23,458 | 49.70% | 50.30% |

2008 - 2013 දක්වා අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල (උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ)

| වර්ෂය | පෙනී සිටි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2008 | 29,649 | 13,995 | 47.2% |
| 2009 | 30,060 | 13,892 | 46.21% |
| 2010 | 30,420 | 16,812 | 55.27% |
| 2011 | 29,391 | 15,037 | 51.16% |
| 2012 | 31,106 | 17,504 | 56.27% |
| 2013 | 46,724 | 27,335 | 58.5% |

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාට අතුරු ප්‍රශ්න යොමු කරනවා. දැන් මධ්‍යම රජයේ අධ්‍යාපන ඇමැතිතුමා ප්‍රකාශයක් කරලා තිබුණා, බස්නාහිර පළාතේ ප්‍රතිඵල වැටිලා තිබෙනවා. වෙනත් දිස්ත්‍රික්කවල ප්‍රතිඵල ඉහළට ඇවිල්ලා තිබෙනවා කියලා. ඒ පිළිබඳ ඔබතුමාගේ අදහස කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, පළමුවැනි කාරණාව ප්‍රතිඵල වැටීමක් නැහැ. අදටත් බස්නාහිර පළාත එකට ඉන්නවා. පහේ ශිෂ්‍යත්වය සමත් වෙලා වැඩිම දරුවෝ ප්‍රමාණයක් ජාතික පාසල්වලට යන්නේ බස්නාහිර පළාතෙන්. ඒ මට්ටමක තිබියදීත්, අපේ ප්‍රතිඵල ඉහළ මට්ටමකින් තියාගෙන වැඩි මට්ටමක් කරා යන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. නමුත් එක තැනකට ගියාම, එක සීමාවකට ගියාම එතැනින් එහාට කඩාගෙන යන්න, ශිෂ්‍යයන්ට වැඩි ක්‍රමවේදයක් උගන්වන්න මේ වනකොට කලාප මට්ටමෙන් ප්‍රතිඵල විශ්ලේෂණය රැස්වීම් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් පවත්වාගෙන යනවා. ඉදිරියේදී ඒකේ ප්‍රතිඵල අපට බලාගන්න පුළුවන්කම ලැබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතකොට මධ්‍යම රජයේ අධ්‍යාපන ඇමැතිතුමාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබතුමා -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම හිතන්නේ එතුමා ඒ ප්‍රකාශය කළේ, එතුමාගේ ආසනය සම්බන්ධව. ආසනයේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵලින් පහළ මට්ටමක ඉන්නවා කියන කාරණය ඉදිරිපත් කිරීම සඳහා කරපු ප්‍රකාශයක්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතකොට බස්නාහිර පළාතේ වැඩ බලන විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය පිළිබඳව ඔබතුමා දරන මතය කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒකට උත්තරය අනෙක් ප්‍රශ්නයේදී ලැබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුන සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යවරයා කරපු ප්‍රකාශය පිළිබඳව ඔබතුමා කියන්නේ, ආසනයට අදාළව කළා කියලාද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, මම එතුමා කරපු ප්‍රකාශයේ පසුබිම දන්නේ නැති නිසා මම මුකුත් ප්‍රකාශ කරන්නේ නැහැ. නමුත් එතුමා කිව්වා නම් බස්නාහිර පළාතේ වැටිලා කියලා. එහෙම එකක් නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

බොහොම ස්තුතියි.

# උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම
RECRUITMENT OF GRADUATE TEACHERS

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**02.**

**ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/14/02)**

අ. i. උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමට පියවර ගනු ලැබුවේද?
ii. තෝරා ගැනීම සිදු කළේ කවර පදනමකින්ද?
iii. ගුරුවරුන් ලෙස කී දෙනෙකු බඳවා ගනු ලැබුවේද?
iv. කුමන විෂයයන් වෙනුවෙන්ද?

ආ. i. ඒ ඒ විෂයයන්ට අනුව තවදුරටත් පළාතේ ගුරුවරුන්ගේ පුරප්පාඩු කවරේද?
ii. එකී විෂයයන් වෙනුවෙන් උපාධිධාරීන් බඳවා ගැනීමට පියවර ගන්නේද?
iii. බඳවා ගැනීමට කටයුතු කරන ක්‍රමවේදය කවරේද?
iv. අවශ්‍ය පියවර ගන්නා කාල වකවානුව සඳහන් කරන්නේද?

ඇ. නොඑසේ නම් මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. i. ඔව්.
ii. 2008/2011 වසරවල පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද තරග විභාගයේ ප්‍රතිඵල පදනම් කර ගනිමින්.
iii.

| | | |
|---|---|---|
| 2008 වසරේ සිංහල මාධ්‍යයෙන් ගුරුවරුන් | - | 3,546 ක් |
| 2011 වසරේ සිංහල මාධ්‍යයෙන් ගුරුවරුන් | - | 5,421 ක් |
| 2011 වසරේ දෙමළ මාධ්‍යයෙන් ගුරුවරුන් | - | 761 ක් |
| එකතුව | - | 9,728 ක් |

බඳවා ගෙන ඇත.

iv. කලා උපාධි / වාණිජ / විද්‍යා / ගණිතය / කෘෂි විද්‍යාව / ප්‍රාථමික / තොරතුරු තාක්ෂණය / සෞන්දර්ය / දෙවන බස (දෙමළ/සිංහල) යන විෂයයන් වෙනුවෙනි.

ආ. i. 2014.05.12 දිනට බස්නාහිර පළාතේ පහත සඳහන් විෂයන්ගේ පුරප්පාඩු වාර්තා වී ඇත.

| | **මාධ්‍ය අනුව පුරප්පාඩු** | |
|---|---|---|
| **විෂයය** | **සිංහල** | **දෙමළ** |
| ගණිතය | 115 | 27 |
| තොරතුරු තාක්ෂණය | 20 | 05 |
| බටහිර සංගීතය | 06 | 02 |
| චිත්‍ර | 50 | 07 |
| **එකතුව** | **191** | **41** |

මීට අමතරව 2015.12.31 දින දක්වා විශ්‍රාම යාමට නියමිත ගුරුවරුන් නිසා ඇති වන පුරප්පාඩු සංඛ්‍යාව 1579 පමණ වේ.

ii. ඔව්. දැනටමත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අයදුම්පත් කැඳවා තරග විභාගය පැවැත්වීමට අදාළව පුවත්පත් දැන්වීම් පළ කර ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු කරනු ඇත.

iii. පුවත්පත් දැන්වීමක් මගින් ප්‍රසිද්ධ කර අයදුම්පත්‍ර කැඳවා පවත්වන විවෘත තරග විභාගයක් තුළින් විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛනය අනුව ඉහළ ලකුණු පදනම් කර ගනිමිනි.

iv. විභාග දෙපාර්තමේන්තුව ප්‍රතිඵල නිකුත් කර දැන්වූ වහාම.

ඇ. අදාළ නොවේ.

[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා]

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම සඳහා පසුබිම් වාර්තාව ප්‍රකාශ කරනවා. මේ වනකොට ගණිතය, IT ඇතුළු විෂයයන් හතරකට අපි කැඳවා තිබෙනවා. 20 වැනිදායින් පස්සේ අනෙක් උපාධිධාරීන්ව කැඳවන්න කටයුතු කරනවා. එසේ කැඳවලා ලකුණු මට්ටම අනුව පුහුණු වීම් ලබා දෙමින්, පසුගිය වසර 05 ගුරුවරු බඳවා ගත් ආකාරයට මාස 1 ½ න් හෝ දෙකෙන් දෙකට හෝ මාසෙන් මාසෙට ඇති වන පුරප්පාඩුවලට ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා, ඔබතුමා කියන්නේ දැනට විභාග පෙනී ඉඳලා සුදුසුකම් ලබපු පිරිසක් ඉන්නවා නේ? ඒ අයගෙන් බඳවා ගැනීමක් කරනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔව්, දැන් 2008 වසරේ විභාගය සමත් ඔක්කෝටම පත්වීම් දුන්නා. 2011 විභාගය සමත් අයටත් හෙට අනිද්දා - දැනට 450 ක් පුහුණුවේ ඉන්නවා. ඉතුරු පත්වීම් ටික අපි 20 වැනිදායින් පස්සේ දෙනවා. ඒ දුන්නාට පස්සේ විභාගය සමත් සියලු දෙනාටම ගුරු පත්වීම් ලැබෙනවා. ගුරු විභාගය අසමත් වුණු අයට සංවර්ධන සහකාර පත්වීම් දුන්නා. හේතුව, උපාධිධාරීන් හිටියා අවුරුදු 45 සීමාවට කිට්ටුවෙන්, විභාගය අසමත් අය. සමහර විට ඒ අයට ඒ අවස්ථාව නොලැබුණා නම්, ඒ අයට කවදාවත් රාජ්‍ය සේවයට එන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා ඒ තනතුර දීලා, මේ වනකොට සියලුම අසමත් උපාධිධාරීන්ටත් පත්වීම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. මේ පළාත් සභාවේ 2011 විභාගයට පෙනී සිටි සියලු දෙනාටම ඉදිරි මාස තුන ඇතුළත පත්වීම් ලැබිලා අවසන් වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

බොහොම ස්තුතියි.

# පළාත් පාලන මාර්ග විෂයයට අදාළ කටයුතු
AFFAIRS RELATED TO THE SUBJECT OF LOCAL GOVERNMENT ROADS

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**03.**

**ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/14/04)**

අ. i. පළාත් පාලන මාර්ග විෂයයට අදාළ කටයුතු කවරේද? යන්නත්,

ii. එකී කටයුතු වලට අනුව වැඩ සැලසුමක් තිබේද? යන්නත්,

iii. සැලසුමට අදාළ කාර්යයන් මොනවාද? යන්නත්, සභාවට දන්වන්නේද?

ආ. පළාත් පාලන ආයතනවලට අයිති මාර්ග බොහොමයක් මාර්ග සංවර්ධනය පැත්තෙන් සතුටුදායක නොවන බව පිළිගන්නේද?

ඇ. පිළිගන්නේ නම් ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද?

ඈ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. i. වෙනත් අධිකාරීත්වයකට අයිතිවාසිකම් නොමැති පෞද්ගලික දේපළ නොවන පොදු මංමාවත්, විධිමත් කිරීම හා පරිපාලනය කිරීම.

ii. ඔව්.

පළාත් පාලන ආයතන විසින් වාර්ෂික අයවැය ලේඛනය යටතේ වෙන් වන ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් හා වෙනත් ප්‍රභවයන් යටතේ පළාත් පාලන ආයතන වෙත ලබා දෙන මුදල් ප්‍රතිපාදනවලට අනුව බල ප්‍රදේශය තුළ මංමාවත් නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම

උදෙසා ඒ ඒ පළාත් පාලන ආයතන විසින් වැඩ සැලසුම් සකස් කර ඇත.

iii. * පළාත් පාලන ආයතනයන් හී පොදු අධිකාරී බලය යටතට මෙතෙක් පත් නොවුණු මාර්ග පොදු අධිකාරී බලය යටතට පත් කර ගැනීම සඳහා කටයුතු කිරීම.

* අධිකාරී බලයට අයත් මාර්ග සංවර්ධන කටයුතු.

* අධිකාරී බලයට අයත් මාර්ග නඩත්තු කටයුතු.

ආ. පිළිනොගනිමි.

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවලට අයිති මාර්ග බොහොමයක් පළාත් පාලන ආයතනයන්හී අරමුදල් හා රජයේ හා පළාත් සභා විසින් නිශ්චිතව ඒ සඳහා වෙන් කර දෙනු ලබන අරමුදල් යොදවා දැනටමත් සතුටුදායක ලෙස සංවර්ධනය කර ඇති බව සඳහන් කරමි.

*ගරු සභාපතිතුමනි, අද මාර්ග පද්ධතිය දිහා බැලුවොත් මීට අවුරුදු හත අටකට පෙර තිබුණු පද්ධතියට වඩා නියම මාර්ග පද්ධතියක් ඇති වෙලා තිබෙනවා කියන එක මම හිතන්නේ, ඔබතුමා වුණත් පිළිගන්නවා ඇති. අඩුපාඩු තිබෙනවා. නමුත් අපි ඉදිරි වර්ෂවලත් ඒ මාර්ග සංවර්ධනය කරන්න කටයුතු කරනවා. මේ පසුගිය පළාත් සභා මැතිවරණවලදී මේ පාරවල් කන්නද කියලා අහපු අයත් හිටියා. නමුත් එහෙම අහන අපිම මේවාවලදී ප්‍රශ්නත් කරනවා. කමක් නැහැ ගරු සභාපතිතුමනි.*

ඇ. අදාළ නොවේ.

ඈ. අදාළ නොවේ.

***පසුබිම් වාර්තාව :***

*පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි පවත්නා වෙනත් අධිකාරිත්වයකට අයිතිවාසිකමක් නොමැති (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය / මාර්ග සංවර්ධන අධිකාරිය වැනි) පෞද්ගලික දේපළ නොවන පොදු මංමාවත් සම්බන්ධයෙන් වූ අධිකාරී බලය ඒ ඒ පළාත් පාලන ආයතන සතු වෙයි.*

*එලෙස පළාත් පාලන ආයතන සතු මාර්ග සංවර්ධනය හා නඩත්තු කිරීම තුළින් විධිමත්ව පවත්වා ගෙන යාම පළාත් පාලන ආයතනය සතු කාර්යයක් වන අතර, ඒ අනුව එම පළාත් පාලන ආයතන විසින් ස්වකීය අයවැය ලේඛන යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන මත එකී කාර්යයන් සිදු කරනු ලබයි.*

*ඊට අතිරේකව මේ වන විට රජය විසින් ක්‍රියාත්මක වැඩ සටහන් යටතේ හා පළාත් සභා විසින් ක්‍රියාත්මක උපමාන පාදක ප්‍රදාන යටතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ මාර්ග සංවර්ධනය සඳහා මුදල් යෙදවෙන අතර, සංවර්ධනය කරන මාර්ග නඩත්තු කාර්යයන් යටතේ පවත්වා ගැනීම උදෙසා වාර්ෂික අයවැය ලේඛන යටතේ පළාත් පාලන ආයතන විසින් මුදල් යෙදවීම ද ඊට සමාන්තරව සිදු කරනු ලබයි.*

*තවද පළාත් පාලන ආයතන යටතේ නඩත්තු ඒකක පවත්වාගෙන යාම උදෙසා විශේෂ කර ප්‍රතිපාදන බස්නාහිර පළාත් සභා අරමුදලින් දැනටමත් ලබා දී ඇති අතර, එම තත්ත්වය තුළ බොහොමයක් පළාත් පාලන ආයතන විසින් මාර්ග නඩත්තු ඒකක පවත්වා ගෙන යනු ලබයි.*

*මෙම සියලු කරුණු සැලකීමේදී පළාත් පාලන බල ප්‍රදේශයන්හී මාර්ග සංවර්ධනය හා නඩත්තුව සතුටුදායක නොවේය යන්න පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව පිළිගත නොහැකි අතර, තවදුරටත් එකී කාර්යයන් විධිමත්ව පවත්වාගෙන යාම උදෙසා පළාත් පාලන ආයතන වෙත පළාත් පාලන කොමසාරිස් (බ.ප) මගින් උපදෙස් හා මග පෙන්වීම ලබා දීමට ක්‍රියා කරනු ඇත.*

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා කියන විධියට ගම්වල තිබෙන පාරවල් හදන එකට කවුරුවත් දොස් කීමක් කරන්නේ නැහැ. එහෙම එකක් නැහැ. ඔබතුමා පිළිගන්නේ නැහැ, ඇත්තටම පළාත් පාලන ආයතනවලට අදාළ මාර්ග බොහොමයක් නඩත්තු කරලා නැහැයි කියලා. නමුත් ගරු ආණ්ඩුකාරතුමා ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන්ම එතුමා පිළිගන්නවා 25% ක වාගේ ප්‍රමාණයක් තමයි ඒ පාරවල්වල හරියට නඩත්තු කරලා තිබෙන්නේ කියලා. එතකොට ඒකේ පරස්පරයක් තිබෙනවා. ඒකේ ඔබතුමාගේ -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ඒක අවබෝධ කරගන්න ඕනෑ. අපි කියන්නේ, ලැබුණු ප්‍රතිපාදනවලින් වැඩ සටහන් ක්‍රියාත්මක කරද්දී කටයුතු වෙලා තිබෙනවා. හැබැයි අපි පිළිගන්නවා - ඒකයි මම ප්‍රශ්නයේදී කිව්වේ. තව කළ යුතු දේවල් තිබෙනවා. උදාහරණයක් හැටියට තාර දමපු පාරවල් වැස්සක් ගියාම මාස හයෙන් හයට Repair කරන තත්ත්වයට පත් වෙනවා. නමුත් කොන්ක්‍රීට් කරපු පාරවල්වල දීර්ඝකාලීන පැවැත්මක් තිබෙනවා.

ඒ නිසා වර්තමාන වැඩ පිළිවෙළ තුළ හොඳ සාර්ථක ප්‍රතිඵල ගන්න පුළුවන්. අඩුපාඩු කියන ඒවා පළාත් සභාවෙන්, රජයෙන් හා පළාත් පාලන ආයතන ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කරනවා. ඒ කෙරෙන කොට සම්පූර්ණ මාර්ග පද්ධතිය, මම හිතන්නේ ABCD පාරවල්වලට වඩා වැඩි මාර්ග කිලෝ මීටර් ප්‍රමාණයක් පළාත් පාලන ආයතනවලට තිබෙනවා. ඒ සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් - අපි රජයක් හැටියට AB පාරවල් කරනවා. මම හිතන්නේ, පළාත් සභා පාරවල් 80% ක් 85% ක් විතර මේ වනකොට කාපට් කරලා තිබෙනවා. ඉතුරු ටික මේ අවුරුද්ද ඇතුළත අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඊට පස්සේ පළාත් පාලන මාර්ගවලට විශේෂ අවධානයක් යොමු කරන්න කටයුතු කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඇත්තටම මගේ ප්‍රශ්නය වුණේ, ගරු ප්රධාන ඇමැතිතුමනි, මේ පළාත් පාලන කියන විෂයය ඔබතුමාට වෙනමම වෙන් වෙලා තිබෙන නිසා ඒ යටතේ මොකක්ද හරි සැලසුමක් තිබෙනවාද? ඒ අනුව මේ පාරවල් නඩත්තු කිරීම සඳහා පියවර ගන්නවාද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපට ලොකු මුදලක් වෙන් කරන්නේ නැහැ. තිබෙන මුදල අපි පළාත් පාලන ආයතනවලින් යෝජනා අරගෙන සංවර්ධන කටයුතුවලට යොදවනවා.

## ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ කටයුතු
AFFAIRS OF THE CHIEF MINISTRY AND MINISTRY OF FINANCE AND PLANNING, LAW AND ORDER, LAND, EDUCATION, LOCAL GOVERNMENT AND PROVINCIAL ADMINISTRATION, MANPOWER AND EMPLOYMENT, ENGINEERING SERVICES AND INFORMATION

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**04.**

**යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/14/05)**

අ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක සභා රැස්වීම් පවත්වන්නේ මාසයකට වරක්ද? මාස 03 කට වරක්ද? නොඑසේ නම් කාල වකවානුව ලබා දිය හැකිද?

ආ. දිස්ත්‍රික් 3 හි අධ්‍යාපන කලාප හා කොට්ඨාශ මට්ටමේ මන්ත්‍රී ව්‍යුහ කමිටු පවත්වන්නේ කෙසේද? එම වැඩ පිළිවෙළ ඉදිරිපත් කරනවාද?

ඇ. එම මන්ත්‍රී ව්‍යුහ කමිටු සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවාද?

ඈ. පාසල්වල කලාප හා කොට්ඨාශ මට්ටමේ විදුහල්පති රැස්වීම් පවත්වන්නේද? එම කාල පරිච්ඡේදය සඳහන් කළ හැකිද?

ඉ. කලාපවල සහ කොට්ඨාශවල සිටින ගුරු උපදේශකවරුන්ට රැස්වීම් පවත්වන්නේද? ඒ කුමන ආකාරයටද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ප්‍රතිපත්තිමය වශයෙන් සෑම මාසයකට එක් වරක් පැවැත් වෙනවා.

ආ. සෑම මාසයකම අවසන් සතියේ සඳුදා දින කලාප මට්ටමින් පැවැත් වෙනවා. *මේක උදේ වරුවේ පවත්වන්න කියලා අපි උපදෙස් දීලා තිබෙනවා.*

මෙම කලාප මට්ටමේ ව්‍යුහ කමිටු රැස්වීමට කලාපය නියෝජනය කරන දේශපාලන අධිකාරියද, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු මාණ්ඩලික නිලධාරීන් ද සහභාගී වෙනවා. එහිදී කලාපයේ පාසල්වල භෞතික සම්පත් හා අධ්‍යාපන සංවර්ධනයට අදාළ ගැටළු සාකච්ඡා කර නිර්දේශයන් ඉදිරිපත් කරයි.

ඇ. ඔව්.

ඈ. ඔව්. කලාප මට්ටමින් සහ කොට්ඨාශ මට්ටමින් අවම වශයෙන් මාසිකව එක් විදුහල්පති රැස්වීමක් පැවැත් වෙනවා.

ඉ. ඔව්. කලාප මට්ටමින් මසකට වරක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් හා කොට්ඨාශ මට්ටමින් මසකට දින තුනක් කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් ගුරු උපදේශකවරුන් සඳහා රැස්වීම් පැවැත් වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කරනවා. මම මේක සද්භාවයෙන් ඉදිරිපත් කළේ. ගරු සභාපතිතුමනි, හේතු ගණනාවක් තිබෙනවා. මම ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත් කරනවා. රැස්වීම් තියෙනවා කියලා විදුහල්පතිවරු ලොග් සටහන්වත් නොදා පිටත් වෙනවා. ඔබතුමා ඒ ගැන දන්නවාද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අපි පැහැදිලිව චක්‍රලේඛයක් යවලා තිබෙනවා, පාසල් කාලසීමාව තුළ සහභාගී වෙන්න පුළුවන් රැස්වීම් මොනවාද? අනෙක් කටයුතු කරද්දී පාසල් කාලසීමාවෙන් පස්සේ කරන්න කියන කාරණය. මේ පිළිබඳව වෘත්තීය සමිති ගැටළුත් මතු වෙලා තිබෙනවා. නමුත් වැඩි අවධානයක් දරුවන් කෙරෙහි යොමු කරන්න ඕනෑ නිසා පාසලේ පරිපාලනය විදුහල්පතිවරයා යටතේ තිබෙන නිසා අපි ගොඩක් වෙලාවට විදුහල්පති රැස්වීම් පාසල් කාලයෙන් පස්සේ පවත්වන්න කියලා උපදෙස් දීලා තිබෙනවා. නමුත් මාසයකට එක දවසක් නිසා, සමහර පරිපාලන ගැටළු නිසා ඒවා පවත්වන්න වෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් අපට පැමිණිල්ලක් ආවොත් පරීක්ෂණයක් කරන්න පුළුවන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව කථා කරනවා නම්, විදුහල්පතිවරු ගණනාවක්, මම නම් වශයෙන් කියන්නේ නැහැ. විදුහල්පති රැස්වීම් කියයි, නැත්නම් උපදේශක රැස්වීම් කියයි, ගුරු උපදේශක රැස්වීම් කිය කියා තමයි යන්නේ. කොහොම යනවාද මම දන්නේ නැහැ. ඉස්කෝල කඩා වැටෙන්න හේතුවක් වෙනවා ඒක. ඒක එකක්. අනෙක් එක මේ දක්වා මන්ත්‍රී ව්‍යුහ කමිටු රැස්වීම් කොට්ඨාශ මට්ටමින් පවත්වා නැති බව ඔබතුමා පිළිගන්නවාද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔව්. මේ පළාත් සභාවේ තවම පවත්වලා නැහැ. අද තමයි මේ කමිටු වාර්තාවත් එක්කම ලබා දෙන්න -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

තුන්වැනි අතුරු ප්රශ්නය -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

හැබැයි, මම ඔබතුමන්ලාටත් ලියුමක් එවලා තිබෙනවා කොට්ඨාශ, කලාප නම් කරලා එවන්න කියලා. දැන් ඒක ලැබෙමින් පවතිනවා. මොකද, කැඳවීම සඳහා කලාපවලට ඒ නම් ටික අරින්න ඕනෑ. නැත්නම් වෙනත් ආරවුල් ඇති වෙනවා. ඒක තවම ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ට යොමු කරපුවාට පිළිතුරු -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අපි යොමු කළා. තුන්වැනි අතුරු ප්‍රශ්නය. අපට ආරංචියක් තිබෙනවා විපක්ෂය වශයෙන් වෙනදා නම් අපට

[ගරු යූ. ජෝර්ජ් පෙරේරා]

ව්‍යූහ කමිටු රැස්වීම්වලට ආරාධනා කළා. තුන්වැනි ප්‍රශ්නයෙන් මම ඔබතුමාගෙන් අහලා තිබෙනවා. ඔබතුමා ඒකට උත්තර දුන්නේ දේශපාලන අධිකාරිය කියලා. එතකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් සහභාගී වෙන්න පුළුවන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සහභාගී වෙන්න පුළුවන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

බොහොම ස්තුතිය.

## ගම්පහ දිස්ත්‍රික්කය : බස්නාහිර පළාත් සභාවට අයත් විශේෂ අධ්‍යාපන ඒකක
GAMPAHA DISTRICT: SPECIAL EDUCATION UNITS CONTROLLED UNDER WESTERN PROVINCIAL COUNCIL

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**05.**

**අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/14/06)**

අ. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ බස්නාහිර පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක කොපමණ ප්‍රමාණයක් තිබේද?

ආ. එක් පන්ති කාමරයක සිටිය හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

ඇ. එක් ගුරුවරියක් සඳහා භාරදෙන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

ඈ. විශේෂ අධ්‍යාපන ඒකක සඳහා වෙනම ප්‍රතිපාදන බස්නාහිර පළාත් සභාව තුළින් ලබා දෙන්නේද?

ඉ. විශේෂ අධ්‍යාපන ඒකක වල ගුරුවරුන් සඳහා විශේෂ පුහුණු වීම් ලබා දෙන්නේද?

ඊ. පාසල්වල පවත්වාගෙන යන විශේෂ අධ්‍යාපන ඒකකවල වත්මන් ක්‍රියාකාරීත්වය සම්බන්ධව ඔබතුමා සෑහීමකට පත්වන්නේද?

උ. දරුවන්ගේ මානසික වර්ධනය වෙනුවෙන් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඔබතුමාගේ ඒකඟතාවය කෙසේද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඒකක 56 කි.

ආ. අංක 2003/38 දරන 2003.11.07 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ දැක්වෙන පරිදි අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් දැක්වේ. එනම් එක් ගුරුභවතෙකුට අවම ශිෂ්‍ය සංඛ්‍යාව 05 කි. උපරිම සංඛ්‍යාවක් සඳහන් නොවේ.

ඇ. චක්‍රලේඛයට අනුව එක් ගුරුවරියක් සඳහා සිසුන් 05 කි.

ඈ. ඔව්.

ඉ. ඔව්.

ඊ. සෑහීමකට පත් නොවේ. මන්ද ගුරුවරුන් යාවත්කාලීනව පුහුණු කිරීම, විශේෂ අධ්‍යාපන ඒකකවල යටිතල පහසුකම් තවදුරටත් ලබා දීම සහ භෞතික සම්පත්වල ගුණාත්මක භාවය තවදුරටත් වර්ධනය කිරීමට කටයුතු කළ යුතුව ඇත.

උ. එකඟ වෙමි.

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු සභාපතිතුමනි, ගම්පහ අධ්‍යාපන කලාපයේ පාසල් 48 ක් තිබෙනවා. දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් 48 ක් තිබෙනවා. අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් 50 ක් තිබෙනවා. විශේෂ අධ්‍යාපන ඒකක 10 ක් තිබෙනවා. මේ විශේෂ අධ්‍යාපන ඒකක

10 තුළ ගෝතමී කණිෂ්ට විද්‍යාලයේ දරුවෝ 12 යි. එක ගුරුවරියයි. කැප්පෙටිපොළ, හෙනරත්ගොඩ මධ්‍ය මහ විද්‍යාලයේ දරුවෝ 26 යි. ගුරුවරියන් 02 යි. ඉඹුල්ගොඩ දරුවෝ 12 දෙනයි. එක ගුරුවරියයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉඹුල්ගොඩ සුජාතා විද්‍යාලය නේද?

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

කිරිදිවැල දරුවෝ 21 යි. එක ගුරුවරියයි. ඔය ආදී වශයෙන් ඉතාමත්ම අඩු ගුරුවරුන් සංඛ්‍යාවක් සමග මේ දරුවෝ වැඩි පිරිසක් ඉතාමත්ම -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ළමයින් 12 කට එක ගුරුවරයෙක් වාගේ ඉන්නවා නේද?

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ඔව්. මේ තත්ත්වය තුළ මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි මේ පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවලට විශේෂ සුදුසුකම් ඇති ගුරුවරුන් පත් කරන්න. ඒ වාගේම විශාල අඩුපාඩුකම් තිබෙනවා. මම මේ සියලුම ඉස්කෝලවලට ගිහිල්ලා පෞද්ගලිකවම බැලුවා. මට මේ වනකොට විශාල ලිස්ට් එකක් දීලා තිබෙනවා. මම හිතන්නේ ඒ ලිස්ට් එක සපුරන්න ලක්ෂ 10 ක ප්‍රමාණයක් විතර අවශ්‍යයයි. එම නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ඉදිරිපත් කිරීම මට, උපදේශක කාරක සභාවට යොමු කරන්න. මම ඒ සම්බන්ධව මැදිහත් වෙන්නම්. නමුත් ඔබතුමා දකිනවා මම මේ ප්‍රශ්නයට පිළිතුරු දෙනකොට අවමයෙන් ළමයින් 05 ක් ඉන්න ඕනෑ කියලා. සාමාන්‍යයෙන් අපට උපරිමයක් සඳහන් වෙන්නේ නැහැ. ළමයින් 12 කට එක ගුරුවරයෙක් තියාගෙන වාගේ තමයි යන්නේ. ගුරුවරුන්ගේ අඩුවක් මම දකින්නේ නැහැ. මම හිතන්නේ ගුරුවරුන්ගේ පුහුණුව හා දරුවන්ට අවශ්‍ය කරන භෞතික සම්පත් ලබා දීම තමයි කළ යුතු වෙන්නේ. ඒ සඳහා අපේ අවධානය යොමු කරන්න පුළුවන්.

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 06 යටතේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නය සඳහා පිළිතුරු දීමට කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සති කීයක්ද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ගියවරත් මම මතක් කළා බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව එකතු කරන ලද මුද්දර මුදල් පිළිබඳව නීත්‍යානුකූලභාවය සම්බන්ධ ප්‍රශ්නයක්. ඒ නිසා ලබන සභා වාරයේදී අනිවාර්යයෙන් -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අපි තොරතුරු ලබා ගන්න කටයුතු කරලා තිබෙනවා. ඒක ලබන සභාවට ඉදිරිපත් කරන්න උපරිම උත්සාහයක් දරන්නම්.

***අනතුරුව ප්‍රශ්නය ඊළඟ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*Later, the Hon. Chairman ordered to refer the question to the next Council sitting.*

# බස්නාහිර පළාත් සභාව : පාසල්
WESTERN PROVINCIAL COUNCIL: SCHOOLS

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**07.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/14/08)**

අ. බස්නාහිර පළාත් සභාවට අයත් පාසල් සංඛ්‍යාව කලාප මට්ටමින් කොපමණද?

ආ. එම පාසල් සංඛ්‍යාව පාසල් වර්ගය අනුව ඒ ඒ වර්ගයෙන් කොපමණ සංඛ්‍යාවක් බැගින් තිබේද?

ඇ. ඒ ඒ පාසල් වර්ගය අනුව විදුහල්පති පුරප්පාඩු කොපමණ සංඛ්‍යාවක් තිබේද?

ඈ. පාසල් වර්ගය අනුව වැඩ බලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද?

ඉ. විදුහල්පතිවරුන් ලෙස කටයුතු නොකරන ඒ ඒ ශ්‍රේණි අනුව විදුහල්පති පත්වීම්ලාභීන් කොපමණ ප්‍රමාණයක් පළාත තුළ සිටීද?

ඊ. නිසි ක්‍රමවේදයෙන් බැහැරව පාසල් කීයකට විදුහල්පතිවරුන් පත් කර තිබේද?

උ. විධිමත් ආකාරයෙන් හා විනිවිද පෙනෙන සේ ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ හරහා පාසල් වර්ගයට අනුව නියමිත සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් තෝරා පසාල්වලට විදුහල්පතිවරුන් පත් කිරීමට තිබෙන බාධාව කුමක්ද?

ඌ. බාධාවක් නොමැති නම් එසේ නොකරන්නේ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරු තිබෙන්නේ. මම මේක සභාගත කරන්නම්.

* ***[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

අ. බස්නාහිර පළාත් සභාවට අයත් පාසල් සංඛ්‍යාව.

| දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | පළාත් පාසල් |
|---|---|---|
| | කොළඹ | 103 |
| | හෝමාගම | 95 |
| කොළඹ | පිලියන්දල | 84 |
| | ශ්‍රී ජයවර්ධනපුර | 85 |
| **කොළඹ දිස්ත්‍රික්කයේ එකතුව** | | **367** |
| | ගම්පහ | 141 |
| | කැලණිය | 108 |
| ගම්පහ | මිනුවන්ගොඩ | 154 |
| | මීගමුව | 111 |
| **ගම්පහ දිස්ත්‍රික්කයේ එකතුව** | | **514** |
| | හොරණ | 127 |
| කළුතර | කළුතර | 134 |
| | මතුගම | 128 |
| **කළුතර දිස්ත්‍රික්කයේ එකතුව** | | **389** |
| **බස්නාහිර පළාතේ එකතුව** | | **1270** |

ආ. පාසල් වර්ගය අනුව ඒ ඒ වර්ගයෙන් ඇති පාසල් සංඛ්‍යාව

*මෙතැන ලේඛනගත කරලා තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. මේක සභාගත කරන්නම්. කියවන්න ගියොත් සෑහෙන වෙලා යනවා.*

* ***[සභාගත කරන ලද "ආ" පිළිතුර]***
*[Tabled Answer]*

| දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | 1ABS | 1AB | 1C | TYPE 2 | TYPE 3 | පළාත් පාසල් |
|---|---|---|---|---|---|---|---|
| | කොළඹ | 0 | 8 | 38 | 45 | 12 | 103 |
| | හෝමාගම | 4 | 1 | 11 | 46 | 33 | 95 |
| කොළඹ | පිලියන්දල | 2 | 12 | 15 | 35 | 20 | 84 |
| | ශ්‍රී ජයවර්ධනපුර | 5 | 12 | 11 | 35 | 22 | 85 |
| **කොළඹ දිස්ත්‍රික්කයේ එකතුව** | | **11** | **33** | **75** | **161** | **87** | **367** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ගම්පහ | 0 | 10 | 29 | 56 | 46 | 141 |
| | කැලණිය | 1 | 11 | 25 | 43 | 28 | 108 |
| ගම්පහ | මිනුවන්ගොඩ | 2 | 5 | 28 | 67 | 52 | 154 |
| | මීගමුව | 0 | 9 | 30 | 44 | 28 | 111 |
| **ගම්පහ දිස්ත්‍රික්කයේ එකතුව** | | **3** | **35** | **112** | **210** | **154** | **514** |
| | හොරණ | 0 | 7 | 25 | 47 | 48 | 127 |
| | කළුතර | 0 | 14 | 29 | 66 | 25 | 134 |
| කළුතර | මතුගම | 1 | 5 | 16 | 57 | 49 | 128 |
| **කළුතර දිස්ත්‍රික්කයේ එකතුව** | | **1** | **26** | **70** | **170** | **122** | **389** |
| **බස්නාහිර පළාතේ එකතුව** | | **16** | **95** | **264** | **542** | **363** | **1270** |

1 ABS යනු උසස් පෙළ තාක්ෂණ විෂයය ධාරාව සහිත පාසල්.

1 AB යනු උසස් පෙළ විද්‍යා, වාණිජ, කලා විෂයය ධාරාව සහිත පාසල්.

1C යනු උසස් පෙළ වාණිජ, කලා විෂයය ධාරාව සහිත පාසල්.

TYPE 2 - 1- 11 ශ්‍රේණි සහිත පාසල්

TYPE 3 - 1- 5 ශ්‍රේණි සහිත පාසල් (ප්‍රාථමික)

1C කලා, වාණිජ

ඈ. නැත

ඇ. *ඒකත් වගුවක් හැටියට දාලා තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. පිළිතුර සභාගත කළාම බලන්න පුළුවන්.*

***[සභාගත කරන ලද පිළිතුර]***
*[Tabled Answer]*

| පාසල් වර්ගය | වැඩ බලන විදුහල්පතිවරුන් සංඛ්‍යාව |
|---|---|
| 1AB | 04 |
| 1C | 30 |
| TYPE 2 | 177 |
| TYPE 3 | 135 |

ඉ. අංක 2003/38 චක්‍රලේඛය පරිදි පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල්වලට විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති හා සහකාර විදුහල්පතිවරුන් පත් කිරීමට බලය ලබා දී ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය අනුව විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති සංඛ්‍යාව 1,688 කි. ඒ අනුව බස්නාහිර පළාතේ පළාත් සභා පාසල් 1,270 තුළ එකී ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සියළු දෙනාම නිත්‍ය තනතුරු වන විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති යන තනතුරුවලට අදාළ රාජකාරීවල යොදවා ඇත.

ඊ. නැත.

උ. නැත.
එහෙත් සුවිශේෂී අවස්ථාවලදී (විනය හේතු මත - ඉල්ලා අස්වීම්, සේවා අවශ්‍යතා) පාසල් පරිපාලනය අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වන බැවින් ඉතා කෙටි කාලයක් තුළ දී විදුහල්පතිවරයෙකු පත් කිරීමට සිදු වන අවස්ථා ඇත.

ඌ. අදාළ නොවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අතුරු ප්‍රශ්න 03 ක් අහන්න පුළුවන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා 'ඇ' ප්‍රශ්නයට, එනම් විදුහල්පති පුරප්පාඩු කොපමණ සංඛ්‍යාවක් තිබේද කියලා අහනකොට පිළිතුර විධියට සඳහන් කළේ, නැත කියලා. නමුත් අපි දන්නවා මේ 1270 ක් වන පාසල් අතරින් විශාල -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. ඒකට කියන්න ඕනෑ. දැන් මේ වනකොට පුවත්පත්වල දැන්වීමක් දාලා තිබෙනවා පාසල් 68 ක් සම්බන්ධයෙන්. ඒ 68 ට බඳවා ගැනීම් කටයුතු කෙරෙනවා. මම හිතන්නේ, මෙතැන පොඩි නිවැරදි කිරීමක් වෙන්න ඕනෑ. මේක හදනකොට දාපු එක නිසා. ඒ පාසල් 68 ගත්තාම මම හිතන්නේ, තනතුරු නැතිව යනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊළඟට ඔබතුමා 'ඊ' ප්‍රශ්නය, නිසි ක්‍රමවේදයෙන් බැහැරව පාසල් කීයකට විදුහල්පතිවරු පත් කර තිබේද කියන එකට පිළිතුරු දුන්නේ නැත කියන කාරණය. මේ වනවිටත් ඔබතුමා දන්නවා. මට ඒක දැන් මතු කර ගන්න පුළුවන්. අසෝක විද්‍යාලයේ අපි දන්න තරමින් නිසි ක්‍රමවේදයට නොවෙයි විදුහල්පතිවරයා පත් කරලා තිබෙන්නේ. ඒක හොඳම උදාහරණය. ඒ නිසා ඔබතුමා කිව්වේ එහෙම නිසි ක්‍රමවේදයෙන් බැහැරව විදුහල්පතිවරු පත් කරලා -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ සම්බන්ධව 'උ' පිළිතුරෙන් ඔබතුමා දැනුවත් වෙන්න ඇති. එහෙත් සුවිශේෂ අවස්ථාවලදී, විනය හේතු මත, ඉල්ලා අස්වීම්, සේවා අවශ්‍යතා, පාසල් පරිපාලනය අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වන බැවින් ඉතා කෙටි කාලයක් තුළ දී විදුහල්පතිවරයෙකු පත් කිරීමට සිදු වන අවස්ථා ඇත. එහෙම අවස්ථාවලදී අපි පත් කිරීමට කටයුතු කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේකයි ප්‍රශ්නය තිබෙන්නේ. ප්‍රධාන පාසලකට මෙවැනි විදුහල්පතිවරයෙක් පත් කරද්දී ක්‍රමවේදයෙන් බැහැරව පත් කිරීම තුළ දැන් බරපතළ ගැටළු මතු වෙලා තිබෙනවා. ඒක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. දැන් අසෝක විද්‍යාලයේ තිබෙන්නේ එවැනි ප්‍රශ්නයක්. ඒ නිසා තමයි මම මේ ප්‍රශ්නය යොමු කළේ. නිසි ක්‍රමවේදයෙන් බැහැරව කොපමණ විදුහල්පතිවරුන් පත් කරලා තිබෙනවාද කියන කාරණය.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මම හිතන්නේ ඒක නොවෙයි ගරු මන්ත්‍රීතුමා, එතැන සිදු වුණු කාරණාව. ඔබතුමා 13 හෝ 14 ප්‍රශ්නයේදී ඒක අහලා තිබෙනවා. මම එතැනදී ඒ පිළිතුර දෙන්නම්. ඒකේදී පාසල තුළ තිබුණු පාරිපාලන ගැටළුවක් උඩ ඇති වුණු සිද්ධියක්. මේ විදුහල්පතිවරයා පත් කළේ කෙසේද කියලා. මම ඔබතුමාට මීට කලින් සභා වාරයකදීත් පැවසුවා. අසෝක විද්‍යාලයේ විදුහල්පතිවරයා හදිසියේම ජාතික පාසලකට යනකොට ඇති වුණු පුරප්පාඩුවකට විදුහල්පතිවරයෙක් පත් කරද්දී, ඒ පාසලට ගැළපෙන විදුහල්පතිවරයෙක් පත් කර ගැනීමේ අවශ්‍යතාවය නිසා ඒ පාසලට වඩා ශිෂ්‍ය සංඛ්‍යාවක්, ගුරුවරු සංඛ්‍යාවක් පාලනය කරපු විදුහල්පතිවරයෙක් තමයි පත් කළේ. ඒ වාගේම එතුමා හිටපු පාසලේ ප්‍රතිඵල ඉහළ නංවපු විදුහල්පතිවරයෙක්. ඒ කාරණා උඩ පත් කරලා කටයුතු කරගෙන යනකොට දැන ගත්තා පාසල තුළ ගුරුවරු 16 දෙනෙකුගේ අතිරික්තයක් තිබුණු බව. වැඩිපුර ගුරුවරු හිටියා. ඒ පාසලේ මෙතෙක් කල් පවත්වාගෙන ගිහිල්ලා තිබුණේ, බාහිර ක්‍රියාකාරකම්වලට දරුවෝ ගෙනිහිල්ලා තිබුණේ දෙමව්පියෝ. ගුරුවරු සහභාගී වෙලා තිබුණේ නැහැ. ඒ වෙනස්කම් ඇති කරද්දී, ඒ වාගේම අධ්‍යාපනය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ගුරුවරු පොත්පත්වල කටයුතු කරලා තිබුණේ නැහැ. ඒ කරුණු කාරණා නිවැරදි කරනකොට පාසල තුළ ඒ කටයුතුවලින් බැහැර ඉන්න ගුරුවරුන්ගේ විරෝධතාවයක් මතු වුණා. අපි පළාත් සභාව විසුරුවා හැරියාට පස්සේ කාල සීමාව තුළ දී සිදු වුණේ. ඊට පස්සේ ඒ අය අපට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළා, විදුහල්පතිවරයාට විරුද්ධව. මම මේ කථා කරන්නේ පළාත් සභාව විසුරුවා හැරපු කාල සීමාව තුළ වුණු දෙයක් මන්ත්‍රීතුමා. මම දන්නවා, ඔබතුමා ඒ පිළිබඳව උනන්දු වන නිසයි මම මේ කාරණාව කියන්නේ. මොකද, වැරදි මතයක් රටට යන්න හොඳ නැහැ. ඊට පස්සේ ඒ චෝදනා පත්‍රය අමාත්‍යාංශයෙන් විභාග කළා. විභාග කළාම කාරණා තුනක් හැර අනෙක් ඔක්කෝම පරිපාලනය පිළිබඳව තිබෙන

ගැටළු. ඒ කියන්නේ, ගුරුවරු බැහැයි කියන්නේ, දෙපාර්තමේන්තුවෙන් කියපු දේවල් කරන්න බැරි ඒවා පිළිබඳවයි. ඒ චෝදනා පත්‍රයේ එක කාරණයක් තිබුණා, ඡන්දය කාලයේදී පාසල් බස් රථය මැතිවරණ කටයුතුවලට යොදාගෙන තිබුණාය කියලා. ඒකේ පැහැදිලිවම කියලා තිබුණේ, මගේ දේශපාලන කටයුතුවලට යොදා ගත්තා කියලා. මම කිව්වා පුළුවන් නම්, මට ඔප්පු කරලා පෙන්වන්න කියලා. මොකද, මම අධ්‍යාපනය ලබපු පාසලේ නම ගහපු බස් එකක් අරගෙන ගිහිල්ලා දේශපාලන කටයුතු කරන්න ඕනෑ නැහැ. අපට ඒවා කරන්න පහසුකම් තිබුණා. ඒ නිසා ඒ පරීක්ෂණ වාර්තාවෙන් පස්සේ පළාත් සභාව විසුරුවා හැරපු කාලේ එතුමාව අනුයුක්ත කරලා තිබුණා කොළඹ කලාපයට. ඒ අනුයුක්තය අවලංගු කරලා මෙතැනට දැම්මා. ඊයේ දවස තුළ තව ගුරුවරු දෙදෙනෙක් 13 පන්තියේ විභාගයට පෙනී සිටින, දැනට අධ්‍යාපන නිවාඩු ලබා සිටින සිසුන් සංඛ්‍යාවක් ගෙනැල්ලා ඉස්කෝලේ ඇතුළේ අර්බුදකාරී තත්ත්වයක් ඇති කරලා තිබුණා. නමුත් මම ස්තුතිවන්ත වෙනවා අසෝක විද්‍යාලයේ සිසුන්ට. අනෙක් පන්තිවල සිසුන් කවුරුත් එළියට බැහැලා නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක ඔබතුමා ඊයේ -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම ඊයේ කැබිනට් පත්‍රිකාවක් ඇරියා. අද උදේ ඉඳලා පරීක්ෂණයක් පවත්වනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම සිරස සහ හිරු FM නාලිකාවල ප්‍රවෘත්ති නැරඹුවේ. ඒ ප්‍රවෘත්තිවල ඉතා පැහැදිලිව හිටපු නියෝජ්‍ය විදුහල්පති ලලිත් අමරසිංහ මහතා - ඔහු වසර 21 ක් අසෝක විද්‍යාලයේ සේවය කරලා තිබෙනවා. ඔහු ඉතා පැහැදිලිව කියනවා. මේ පාසලට සුදුසුකම් නැති විදුහල්පතිවරයෙක් පත් කරලා, එතැනින් පස්සේ තමයි මේ අර්බුදය ඇති වුණේ. අසෝක විද්‍යාලයේ මෙවැනි වටපිටාවක් ඉතිහාසයේ, පළමුවැනි වතාවට තමයි නිර්මාණය වෙන්නේ. මේ දරුවෝ, ඊයේ ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මට අවස්ථාව ලබා දෙන්න බැහැ. මොකද ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයත් එක්ක -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ දීර්ඝ පැහැදිලි කිරීමත් එක්ක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. ඔබතුමාත් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම ඇහුවේ විධිමත් ක්‍රමවේදයෙන් බැහැරව විදුහල්පතිවරු කොපමණ පත් කරලා තිබෙනවාද? ඒ නිසා තමයි මේක මම උදාහරණයක් විධියට ගත්තේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ නිසා නොවෙයි මේ සිද්ධිය ඇති වුණේ කියන එක පිළිබඳව තමයි මම ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් දුන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ නිසා තමයි ඇත්තටම මේ සිද්ධිය ඇති වෙලා තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ ඒ නිසා නොවෙයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් ඔබතුමන්ලාගේ උවමනාවට, ඔබතුමන්ලාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා 14 වැනි ප්‍රශ්නයේදී ඔබතුමාට ඒ සම්බන්ධව යන්න පුළුවන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්. මම ඒක එතැනදී අහනවා.

# බස්නාහිර පළාතේ විවිධ සේවා සමූපකාර සමිති
MULTIPURPOSE COOPERATIVE SOCIETIES OF WESTERN PROVINCE

**08.**

**ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/14/10)**

අ. 2004.12.31 දිනට බස්නාහිර පළාත් සමූපකාර විෂය යටතේ පැවති විවිධ සේවා සමූපකාර සමිති ඒ ඒ දිස්ත්‍රික්කයට අනුව කීයද?

ආ. 2013.12.31 දිනට බස්නාහිර පළාත් සමූපකාර විෂය යටතේ පැවති විවිධ සේවා සමූපකාර සමිති ඒ ඒ දිස්ත්‍රික්කයට අනුව කීයද?

ඇ. 2004.12.31 දිනට බස්නාහිර පළාත් විවිධ සේවා සමූපකාර සමිතිවලට අදාළ ප්‍රාදේශිකයන් ගණන කීයද?

ඈ. 2013.12.31 දිනට බස්නාහිර පළාත් විවිධ සේවා සමූපකාර සමිතිවලට අදාළ ප්‍රාදේශිකයන් ගණන කීයද?

ඉ. ඉහත ප්‍රශ්න කිරීමට අනුව ප්‍රාදේශික සංඛ්‍යාව වැඩි වී ඇති විවිධ සේවා සමූපකාර සමිති ගණන කීයද?

ඊ. ඉහත ප්‍රශ්න කිරීමට අනුව ප්‍රාදේශික සංඛ්‍යාව අඩු වී ඇති විවිධ සේවා සමූපකාර සමිති ගණන කීයද?

උ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

අ. කොළඹ 11
ගම්පහ 17
කළුතර 10
38

ආ. කොළඹ 11
ගම්පහ 17
කළුතර 10
38

ඇ. පිළිතුර වශයෙන් දිග වගුවක් තිබෙනවා. ඒක ඉදිරිපත් කරන්නද?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගණන කිව්වා නම් හරි.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගණන එකින් එක කියන්නද?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

Total එක කිව්වා නම් හරි.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඇ. Total එක 1254 යි.

ඈ. Total එක 1173 යි.

ඇ. (ඇ) ප්‍රශ්නයට හා (ඈ) ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුරු පිළිතුර අවසානයේ පළ කර ඇත.

ඉ. කොළඹ 05
ගම්පහ 04
කළුතර 01
10

ගම්පහ 12
කළුතර 09
26

වෙනස් නොවුණු ඒවා දෙකක් තිබෙනවා.

ඉ. කොළඹ 05

උ. අදාළ නොවේ.

*ඈ ප්‍රශ්නයට සහ ඈ ප්‍රශ්නයට අදාළ පිළිතුර :*

| | සමිතිය | **(ඈ)** ප්‍රශ්නයට අදාළ පිළිතුර **2004.12.31** දිනට ආදළ ප්‍රාදේශික ගණන | **(ඈ)** ප්‍රශ්නයට අදාළ පිළිතුර **2013.12.31** දිනට ආදළ ප්‍රාදේශික ගණන | වෙනස |
|---|---|---|---|---|
| **ගම්පහ දිස්ත්‍රික්කය** | | | | |
| 1 | ගම්පහ | 42 | 46 | + 4 |
| 2 | මහර | 47 | 44 | - 3 |
| 3 | බියගම | 26 | 19 | - 7 |
| 4 | දළුගම | 10 | 05 | -5 |
| 5 | කැලණිය | 20 | 06 | -14 |
| 6 | කිරිදිවැල | 32 | 23 | -9 |
| 7 | දොම්පේ | 28 | 19 | -9 |
| 8 | වත්තල | 23 | 15 | -8 |
| 9 | ජා-ඇල | 40 | 17 | -23 |
| 10 | මීගමුව | 34 | 26 | -8 |
| 11 | කටාන | 46 | 21 | -25 |
| 12 | දිවුලපිටිය | 34 | 34 | - |
| 13 | කෙහෙල්ඇල්ල | 42 | 52 | +10 |
| 14 | මීරිගම | 42 | 46 | -4 |
| 15 | කොටදෙනියාව | 16 | 21 | +5 |
| 16 | අත්තනගල්ල | 59 | 47 | -12 |
| 17 | මිනුවන්ගොඩ | 51 | 48 | -3 |
| **කළුතර දිස්ත්‍රික්කය** | | | | |
| 18 | බේරුවල | 33 | 20 | -13 |
| 19 | කළුතර | 43 | 11 | -32 |
| 20 | මතුගම | 36 | 09 | -27 |
| 21 | ඉංගිරිය | 28 | 19 | -9 |
| 22 | මුංවත්ත නැගෙනහිර | 22 | 02 | -20 |
| 23 | පානදුර | 22 | 03 | -19 |
| 24 | හොරණ | 27 | 11 | -16 |
| 25 | අගලවත්ත | 24 | 28 | +4 |
| 26 | බණ්ඩාරගම | 48 | 32 | -16 |

| | | | | |
|---|---|---|---|---|
| 27 | බුලත්සිංහල | 30 | 06 | -24 |
| **කොළඹ දිස්ත්‍රික්කය** | | | | |
| 28 | බත්තරමුල්ල | 19 | 20 | +1 |
| 29 | කොළඹ දකුණ | 46 | 26 | -20 |
| 30 | දෙහිවල ගල්කිස්ස | 18 | 14 | -4 |
| 31 | හංවැල්ල | 53 | 60 | +7 |
| 32 | හෝමාගම | 65 | 63 | -2 |
| 33 | ශ්‍රී ජයවර්ධනපුර | 16 | 14 | -2 |
| 34 | කඩුවෙල | 31 | 35 | +4 |
| 35 | මහරගම | 25 | 247 | -9 |
| 36 | පිලියන්දල | 37 | 23 | -14 |
| 37 | මොරටුව | 16 | 16 | - |
| 38 | කොලොන්නාව | 23 | 25 | +2 |
| | | **1254** | **1173** | |

***ඇමුණුම 01***

**කොළඹ දිස්ත්‍රික්කය**

| **සමිතයේ නම** | **වර්ෂය** | **ප්‍රාදේශික ගණන** | **වර්ෂය** | **ප්‍රාදේශික ගණන** | **අඩුවීමට හා/හෝ වැඩිවීමට හේතු** |
|---|---|---|---|---|---|
| සී/ස හංවැල්ල වි.සේ.සේ. සමිතිය | 2004 | 53 | 2014 | 60 | ගොඩනැගිලි අයිතිකරුවන්ට භාරදීම, වෙනත් ප්‍රාදේශික වලට ඒකාබද්ධ කිරීම, අඛණ්ඩව පාඩු ලැබීම හා නව ගොඩනැගිලි ඉදි කිරීම ආදි හේතු මත ප්‍රාදේශික වසා දැමීම කර ඇත. අලුතෙන් විවෘත කිරීම් කිසිවක් නැත. |
| සී/ස හෝමාගම වි.සේ.සේ. සමිතිය | 2004 | 65 | 2014 | 63 | ප්‍රාදේශික 08 ක් අඛණ්ඩව පාඩු ලැබීම නිසා වසා දමා ඇත. කෝප්සිටි හා මිනි කෝප්සිටි 06 ක් විවෘත කර ඇත. |
| සී/ස කඩුවෙල වි.සේ.සේ. සමිතිය | 2004 | 31 | 2014 | 35 | ප්‍රාදේශික 20 ක් මිනි කෝප්සිටි බවට පත් කිරීම, කෝප්සිටි 02 ක් හා විශේෂිත ප්‍රාදේශික 02 ක් විවෘත කර ඇත. |
| සී/ස කොලොන්නාව වි.සේ.සේ. සමිතිය | 2004 | 23 | 2014 | 25 | ප්‍රාදේශික 12 ක් ස්වයංසේවා වෙළඳසැල් බවට පරිවර්තනය කිරීම, කෝප්සිටි 02 ක් විවෘත කිරීම, කෝප්සුපර් 01 ක් විවෘත කිරීම හා දිගින් දිගටම පාඩු ලැබීම නිසා මිනි කෝප්සිටි වෙළඳසැලක් වසා දැමීම |
| සී/ස දෙහිවල ගල්කිස්ස වි.සේ.සේ. සමිතිය | 2004 | 18 | 2014 | 14 | අඛණ්ඩව අලාභ ලැබීම හා බදු ගිවිසුම අවසන් වීමෙන් පසු නව ස්ථානයක් සොයාගත නොහැකිවීම නිසා ප්‍රාදේශික 04 ක් වසා ඇත. ප්‍රාදේශික 11 ක්, කෝප්සිටි 02 ක් හා මිනි කෝප්සිටි 09 ක් බවට පරිවර්තනය කර ඇත. |

| 0463 | | | | | 0464 |
|---|---|---|---|---|---|
| සී/ස ශ්‍රී ජයවර්ධනපුර වි.සේ.සේ. සමිතිය | 2004 | 16 | 2014 | 14 | දිරාපත්වීම හා අලාභ ලැබීම මත ස්ථාන 02 ක් වසා දමා ඇත. එක් ස්ථානයක් වෙස්කෝ ආයතනයට කුලියට දී ඇත. |
| සී/ස මහරගම වි.සේ.සේ. සමිතිය | 2004 | 25 | 2014 | 14 | බදු ගිවිසුම අවසන්වීමෙන් පසු නව ස්ථාන සොයාගත නොහැකිවීම නිසා ස්ථාන 03 ක් වසා ඇත. අඛණ්ඩ පාඩු ලැබීම නිසා ස්ථාන 03 ක් වසා ඇත. කළමනාකරුවන් නොමැතිකම නිසා ස්ථාන 04 ක් වසා ඇත. අබලන්වීම නිසා එක් ස්ථානයක් වසා ඇත. |
| සී/ස පිලියන්දල - බෝකුන්දර වි.සේ.සේ. සමිතිය | 2004 | 37 | 2014 | 23 | ස්ථාන 15 ක් පාඩු ලැබීම නිසා වසා ඇත. වසා දැමූ ප්‍රාදේශික ආසන්න ප්‍රාදේශිකයට ඒකාබද්ධ කර ඇත. විවෘත කිරීම් එකකි. |
| සී/ස බත්තරමුල්ල වි.සේ.සේ. සමිතිය | 2004 | 19 | 2014 | 20 | ප්‍රාදේශික 02 ක් හැර ඉතිරි කෝප්සිටි හා මිනි කෝප්සිටි බවට පරිවර්තනය කර අලුතෙන් එක් මිනි කෝප්සිටියක් විවෘත කර ඇත. |
| සී/ස කොළඹ දකුණ සමුපකාර සමිතිය | 2004 | 46 | 2014 | 26 | අලාභ ලැබීම, කළමනාකරුවන් නොමැතිවීම, අධිකරණ තීන්දු මත ගොඩනැගිලි අයිතිකරුවන්ට භාරදීමට සිදුවීම, මාර්ග සංවර්ධනය කිරීම මත කඩ ඉවත් කිරීම, ඇවරකරුට අයත් ඉඩම් භාරදීමට සිදුවීම, නිවාස සංවර්ධන අධිකාරියට පවරා ගැනීම යන හේතු මත ස්ථාන 14 ක් වසා ඇත. |
| සී/ස මොරටුව වි.සේ.සේ. සමිතිය | 2004 | 16 | 2014 | 16 | ප්‍රාදේශික 10 ක් වසා මිනි කෝප්සිටි 04 ක් හා කෝප්සිටි 03 ක් බවට පරිවර්තනය කර ඇත. ස්ථාන 03 ක් සමිතියේ සේවකයන්ට බදු දී ඇත. |

**ඇමුණුම 02**

**වි.සේ.ස. සමිති වෙළඳසැල් සංඛ්‍යාව අඩු වැඩි වීමට හේතු - ගම්පහ**

| සමිතිය | 2004.12.31 ට සංඛ්‍යාව | 2013.12.31 ට සංඛ්‍යාව | වෙළඳ සැල් සංඛ්‍යාව අඩු වැඩි වීමට හේතු |
|---|---|---|---|
| ගම්පහ | 42 | 46 | 1- සමිතියේ පාරිභෝගික අංශයේ වෙළඳාම වැඩි කිරීම සඳහා බල ප්‍රදේශය තුළ නව මිනිකෝප් සිටි සහ ප්‍රාදේශික ආරම්භ කිරීම. |
| මහර | 47 | 44 | 1- පාඩු ලබන එක් ප්‍රාදේශිකයක් ඒකාබද්ධ කිරීම.<br>2- ගොඩනැගිලි ආපසු භාරදීමට සිදු වීම නිසා වැසීම. නැවත ආරම්භ කිරීමට නියමිතය.<br>3- තාවකාලිකව වසා දැමීම. නැවත ආරම්භ කිරීමට නියමිතය |

| | | | |
|---|---|---|---|
| බියගම | 29 | 19 | 1- ප්‍රාදේශික අඛණ්ඩව පාඩු ලැබීම.<br>2- සමිතිය මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හමුවේ පවත්වා ගත නොහැකි වීම. |
| දළුගම | 10 | 05 | 1- ප්‍රාදේශික අඛණ්ඩව පාඩු ලැබීම, බඩු අඩුවීම් සිදුවීම.<br>2- සමිතිය මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හමුවේ පවත්වාගත නොහැකි වීම. |
| කැලණිය | 20 | 06 | 1- ප්‍රාදේශික අඛණ්ඩව පාඩු ලැබීම, වෙළඳාම ප්‍රමාණවත් නොවීම.<br>2- සමිතිය මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හමුවේ පවත්වාගත නොහැකි වීම. |
| කිරිඳිවැල | 32 | 23 | 1- ගොඩනැගිලි අයිතිකරුවන් වෙත දීමට සිදුවීම, අඛණ්ඩව පාඩු ලැබීම, ස්ථානගත වීමේ ගැටළු. |
| දොම්පේ | 28 | 19 | 1- අඛණ්ඩව පාඩු ලැබීම, ස්ථානගත වීමේ ගැටළු.<br>2- සමිතිය මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හමුවේ පවත්වාගත නොහැකි වීම. |
| වත්තල | 23 | 15 | 1- සමෘද්ධි වෙළඳාම අහිමි වීම නිසා පිරිවැටුම අඩුවීම ලද ආදායම එම ගොඩනැගිලි කුලියවත් ගෙවීමට නොහැකි වීම නිසා උපදෙස් පරිදි වසා දැමීම. |
| ජා-ඇල | 40 | 17 | 1- පිරිවැටුම අඩුවීම සහ පාඩු ලැබීම නිසා ඒකාබද්ධ කිරීම.<br>2- වරලත් වෙළඳසැල් ආරම්භ කිරීම සඳහා පුද්ගලික අංශයට බදු දීම.<br>3- ගොඩනැගිලි අබලන් වීම, ගොඩනැගිලි අයිතිකරුවන් ඉල්ලා සිටීම. |
| මීගමුව | 34 | 26 | 1- ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමට සිදු වීම නිසා වැසීම.<br>2- අඛණ්ඩව පාඩු වීම.<br>3- ශාඛා සඳහා කළමනාකරුවන් සොයා ගත නොහැකි වීම. |
| කටාන | 46 | 21 | 1- අඛණ්ඩව පාඩුවීම නිසා කළමනාකරුවන්ට සහ කාරක සභාවලට පාඩු ලබන ප්‍රාදේශිකවල වෙළඳාම වැඩි කර ගැනීමට ඉලක්ක ලබා දී ළඟාවීමට නොහැකි ප්‍රාදේශික වසා දැමීම.<br>2- ශාඛා සඳහා කළමනාකරුවන් සොයා ගත නොහැකි වීම. |
| දිවුලපිටිය | 34 | 34 | - |
| කෙහෙල්ඇල්ල | 42 | 52 | 1- සමිතියේ ව්‍යාපාර කටයුතු බලප්‍රදේශය තුළ ව්‍යාප්ත කිරීම සඳහා නව වෙළඳසැල් ආරම්භ කිරීම. |
| මීරිගම | 42 | 46 | 1- සමිතියේ ව්‍යාපාර කටයුතු බලප්‍රදේශය තුළ ව්‍යාප්ත කිරීම සඳහා නව වෙළඳසැල් ආරම්භ කිරීම. |
| කොටදෙනියාව | 16 | 21 | 1- නව වෙළඳසැල් ආරම්භ කර ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම. කිරිහල, පොත්හල, ගෑස් අංශය.<br>2- නව මිනිකෝප්සිටි වෙළඳසැල් ආරම්භ කිරීම. |

| | | | |
|---|---|---|---|
| අත්තනගල්ල | 59 | 47 | 1- අඛණ්ඩව පාඩු ලැබීම, ස්ථානගතවීමේ ගැටළු.<br>2- ගොඩනැගිලි අයිතිකරුවන් වෙත දීමට සිදු වීම. |
| මීනුවන්ගොඩ | 51 | 48 | 1- අඛණ්ඩව පාඩු ලැබීම. ගොඩනැගිලි අයිතිකරුවන් වෙත දීමට සිදු වීම. |

- සමෘද්ධි සහනාධාරය බෙදීම අහිමිවීම නිසා සිල්ලර වෙළඳසැල්වල වෙළඳාම අඩුවීම පොදුවේ සෑම සමිතියකටම බලපා ඇත.

**ඇමුණුම 03**

**කළුතර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමූපකාර සමිතිවලට අයත් ප්‍රාදේශික පිළිබඳ විස්තර**

| **විවිධ සේවා සමිතිය** | **2004.12.31** දිනට පැවැති **ප්‍රාදේශික ගණන** | **2013.12.31** දිනට පැවැති **ප්‍රාදේශික ගණන** |
|---|---|---|
| සී/ස බේරුවල | 33 | 20 |
| සී/ස කළුතර | 43 | 11 |
| සී/ස මතුගම | 36 | 09 |
| සී/ස ඉංගිරිය | 28 | 19 |
| සී/ස මුංවත්ත නැගෙනහිර | 22 | 02 |
| සී/ස පානදුර | 22 | 03 |
| සී/ස හොරණ | 27 | 11 |
| සී/ස අගලවත්ත | 24 | 28 |
| සී/ස බණ්ඩාරගම | 48 | 32 |
| සී/ස බුලත්සිංහල | 30 | 06 |

**2004 පැවැති ප්‍රාදේශික සංඛ්‍යාව අඩු වීමට හේතු :**

1. ප්‍රාදේශික දිගින් දිගටම පාඩු ලැබීම.
2. සමෘද්ධි මුද්දර වෙළඳාම අඩු වීම.
3. කුලී පදනම මත පවත්වා ගෙන ගිය ප්‍රාදේශික අයිතිකරුවන් විසින් නැවත පවරා ගැනීම නිසා සුදුසු ස්ථාන සොයා ගැනීමේ අපහසුව

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට අදාළව ප්‍රාදේශික සංඛ්‍යාවක් මේ මොහොත වනකොට වහලා හරි මොකක් හරි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ. නව අමාත්‍යවරයා හැටියට මේ තත්ත්වය ඔබතුමා තේරුම් අරගෙන තිබෙනවාද? ඒ තත්ත්වය වෙනස් කරගැනීම පැත්තෙන් මොකක් හරි ක්‍රියාමාර්ග තිබෙනවාද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සමූපකාර ප්‍රාදේශික විවෘත කරන එක හරි වහන එක හරි කරන්න අමාත්‍යවරයා විධියට මට විශාල බලයක් නැහැ. මට තිබෙන්නේ මේ පනත අනුව නියාමනය කිරීමයි. ඒ කියන්නේ සමූපකාර ප්‍රාදේශිකයක හරි, විවිධ සේවා සමූපකාර සමිතියක හරි, බැංකුවක හරි මොකක් හරි ප්‍රශ්නයක් තිබුණා නම්, කවුරු හරි ලියලා එව්වා නම් ඒක පිළිබඳව විභාග කරලා නියාමය කරන එක තමයි මට තිබෙන්නේ. හැබැයි, පැහැදිලිව විවිධ සේවා සමූපකාර සමිති හරි ප්‍රාදේශිකය හරි තීන්දු තීරණ ගන්නේ ඒ ගමේ ඉන්න, ඒ ආසනයේ ඉන්න සමිතියේ සාමාජිකයා, අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරලා ඒ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන සභාපති ඇතුළු ඒ මණ්ඩලය තමයි මේ ප්‍රාදේශික වහනවාද, ප්‍රාදේශික විවෘත කරනවාද කෝප් - සිටි කරනවාද, සුපර් මාර්කට් කරනවාද කියලා තීන්දු කරන්නේ. ඒක මට තීන්දු කරන්න බලයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒක නිසා තමයි ඔබතුමාට නියාමනය කිරීමේ හරි මොකක් හරි බලයක් තිබෙන නිසා තමයි මේ ප්‍රශ්නය යොමු කරන්නේ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම ගෙන්නලා කථා කළා. කථා කළාම ඒ අය කියන්නේ, දැන් මේ රට දියුණු වෙන්න දියුණු වෙන්න, ජනතාවගේ අවශ්‍යතා වැඩි වෙන්න, වැඩි වෙන්න සිදු වෙලා තිබෙන්නේ එකම ස්ථානයකට ගිහිල්ලා භාණ්ඩ ගන්න පුළුවන් තැන්වලට යන එක ගැනයි. දැන් කාර්ගිලිස් වාගේ ආපිකෝ වාගේ, කෝප් සිටි, සතොස වාගේ තැන්වලට යන්න පුරුදු වෙලා තිබෙනවා. එදා අපේ සමූපකාර ප්‍රාදේශිකය තිබුණාම, බක්කි ක්‍රමය තිබුණාම අත්‍යවශ්‍ය භාණ්ඩ ඉතාමත් සීමිත ප්‍රමාණයක් තිබුණේ. අද ඉතින් ජනතාව තමන්ට රුචි, තමන්ට කැමැති තැනකට ගිහිල්ලා බඩු ගනිද්දී අනෙක් අයට කරන්න දෙයක් නැහැ. හැබැයි, ප්‍රාදේශිකයට කරන්න තිබෙන්නේ ඒ වාගේ කෝප් සිටි, සුපර් මාර්කට් අරින එක. ඉතින් ඒක මට කරන්න බැහැ. නමුත් මම දැන් උපදෙස් දීලා තිබෙනවා පුළුවන්තරම් මිනිස්සු බලාපොරොත්තු වන විදියට, A/C කරලා එහෙම කරන්න කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

සමෘද්ධිලාභීන් සඳහා භාණ්ඩ ලබා ගැනීමේ කටයුත්ත කලින් සමූපකාර සමිතිවලට තිබුණේ ප්‍රාදේශික මගින්. දැන් ඒක සමෘද්ධි බැංකු වෙත පවරාගෙන තිබෙනවා. එතකොට ඒක හරහා ප්‍රශ්නයක් තිබෙනවා කියලා ඔබතුමන්ලා හිතන්නේ නැද්ද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒ කියන්නේ සමෘද්ධිලාභීන්ගේ ලැබෙන දීමනාවට භාණ්ඩ ලබා ගැනීම සඳහා ප්‍රාදේශිකවලට තමයි තිබුණේ. ඒක මේ මොහොතේ ඉවත් කරලා තිබෙනවා.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ, සමූපකාර ප්‍රාදේශික ව්‍යාපාරය කරද්දී ඒ ව්‍යාපාරය ලාභ ගන්නේ කොහොමද කියන එක ඒ අය තීන්දු කරන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

නැහැ, මම අහන ප්‍රශ්නය ඔබතුමාට -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සමෘද්ධිය ප්‍රාදේශිකයෙන් ලබා දෙනවාද නැද්ද කියන එක තීන්දු කරන්නේ සමෘද්ධි ප්‍රතිලාභීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ ආණ්ඩුව. හැබැයි ආණ්ඩුව තීන්දුවක් අරගෙන තිබෙනවා, සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් ආපු චෝදනා මත, ඒ කියන්නේ සමූපකාර ප්‍රාදේශිකයට ගියාම අත්‍යවශ්‍ය බඩු නැහැ. ගොඩක් වෙලාවට සමූපකාරය වහලා. ඒ නිසා මේක බැංකු ක්‍රමය තුළ කරන්න ගිය නිසා ආණ්ඩුව වඩාත් ඵලදායී, වඩාත් හොඳ ප්‍රතිලාභීන්ට ඉතාමත් සුදුසු ක්‍රමයක් අනුගමනය කරලා තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

හරි පැහැදිලි.

***න්‍යාය පත්‍රයේ අංක 09 යටතේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of Hon. Sunil Watagala, member, under item No. 09 of the Agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for, Hon. Chairman ordered that the question be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 10 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of Hon. Mahinda Jayasingha, member, under item No. 10 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for, Hon. Chairman ordered that the question be referred to the next Council sitting.*

*න්‍යාය පත්‍රයේ අංක **11**යටතේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.*

*The question in the name of the Hon. Sunil Watagala, member, under item No. 11 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for, Hon. Chairman ordered that the question be referred to the next Council sitting.*

## කැස්බෑව වැව ආශ්‍රිත ව්‍යාපෘතිය : වියදම් කළ මුදල

PROJECT RELATED TO KESBEWA LAKE: AMOUNT SPENT

**12.**

**අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/14/14)**

අ. කැස්බෑව වැව ආශ්‍රිත ව්‍යාපෘතිය සඳහා මෙතෙක් වියදම් කළ මුදල කොපමණද? වෙන් කළ මුදල කොපමණද?

ආ. මුල් ගල තැබූ දිනය කවදාද?

ඇ. එම සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් කිරීමට වැය වුණ මුදල කොපමණද?

ඈ. එය නිම කිරීමට කොපමණ කාලයක් ගතවේද?

ඉ. එම ව්‍යාපෘති කරනු ලබන ආයතනය කුමක්ද?

ඊ. වැඩ අවසන් කිරීමට ප්‍රමාද වීමට හේතුව කුමක්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

අ. වියදම් වූ මුදල - රුපියල් 1,380,817.28
වෙන් කළ මුදල - රුපියල් 19,930,000.00

ආ. 2013.02.21

ඇ. රුපියල් 51,384,311.44 ක දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත.

ඈ. පළමු අදියර - වැව වටා මායිම් ලකුණු කර ඉඩම් පවරා ගැනීම සිදු කරමින් පවතී.

දෙවන අදියර - වැවෙහි ඇති නෙළුම් ශාක සහ මඩ ඉවත් කිරීමේ කටයුතු 92% ක් අවසන්ය.

තුන්වන අදියර - වැවෙහි වම් හා දකුණු ඉවුර වටා ගේබියන් බැම් යෙදීම සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත.

හතරවන අදියර - වැව වටා ව්‍යායාම මං තීරුවක් සහ වාහන නැවතුම් ගාලක් ඉදි කිරීම.

වාහන නැවතුම් ගාල හැර අන් කටයුතු 2014.12.31 දිනට පෙර අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

ඉ. බස්නාහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරිය.

ඊ. කැස්බෑව වැවට අයත් ඉඩම් කොටස් වැව අවට පදිංචි සමහර අය විසින් නීති විරෝධීව අත්පත් කර ගෙන තිබීම නිසා නැවත ලබා ගැනීමට පැවති බාධා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මේ සඳහා සම්පූර්ණයෙන් මිලියන 51 ක් යනවා කිව්වා. පළාත් සභාවෙන් වෙන් කරලා තිබෙන්නේ, මිලයන 19 යි කියලා ඔබතුමා සඳහන් කළා. එතකොට ඉතිරි මුදල ලබා දෙන්නේ කුමන ආයතනයෙන්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මේ සම්පූර්ණ ව්‍යාපෘතියට යන මුදල මේ වසර වනකොට අපි වෙන් කරලා තිබෙන්නේ මිලයන 19 යි. ඒ මිලියන 19 ට තමයි දෙසැම්බර් 31 ට වැඩ අවසන් කරනවා කිව්වේ. ඉතුරු මුදල අපි ලබන වසරෙන් ලබාගෙන, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවෙනුත් මේ වසරේ මිලියන 12 ක් ලබා දීමට තීන්දුවක් අරගෙන තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතකොට මේ ව්‍යාපෘතියට නාගරික සංවර්ධන අධිකාරිය යටතේ කිසිම සම්බන්ධයක් වෙන්නේ නැද්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

අපි එහෙම අරමුදල් ඉල්ලීමක් කරලා නැහැ. මේ වසරට තෝරා ගත්තු ව්‍යාපෘති කිහිපයක් තිබෙනවා. අපට ඉදිරියේදී කරලා දෙන්නම් කියලා තිබෙන්නේ. විශේෂයෙන්ම මනරම් වැව් ව්‍යාපෘතියේ අරමුණ තමයි වැව අවට අලංකාර කර ජනතාව ආකර්ශනය කර ගැනීමෙන් වැව දූෂණය වන එක වළක්වා ගැනීමයි. නාගරික සංවර්ධන අධිකාරියේ වැව් සකස් කිරීමේ මූලික අරමුණ තමයි ගංවතුර පාලනය කිරීම. ජල ගැලීම් පාලනය කිරීම. එතකොටත් නිර්ණායකයට මේ වැව වැටෙන්නේ නැහැ. ඒ නිසා මේ වැවට -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ අවුරුද්දේ මිලියන 12 ලැබෙනවාද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ලැබෙනවා. ඉතුරු ටික අමාත්‍යාංශයෙන් දරා ගන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

13 වැනි ප්‍රශ්නය. අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, පිළිතුර දීර්ඝ වැඩි නිසා සභාගත කරන්නද? කියවන්නද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

කියවන්න.

# පෞද්ගලික රථගාල්වල අය කිරීම් නතර කිරීම
## TERMINATING CHARGES MADE BY PRIVATE VEHICLE PARKS

**13.**

**නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/14/15)**

අ. පසුගිය පස්වන පළාත් සභාවේ ඒකමතිකව අනුමත කරන ලද පෞද්ගලික රථගාල් සඳහා මුදල් අයකිරීම තහනම් කිරීමේ යෝජනාවට අදාළ මෙතෙක් ඔබතුමා ගත් පියවර කුමක්ද?

ආ. දැනට මුදල් අය කරන පෞද්ගලික රෝහල් ඇතුළු අනෙකුත් ආයතන එම අය කිරීම නවතා දැමීමට ගත් පියවර කුමක්ද?

ඇ. මේ සම්බන්ධව ප්‍රඥප්තියක් සකස් කිරීමට නොහැකි වීමට හේතුව කුමක්ද?

ඈ. පළාත් පාලන කොමසාරිස් විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ආරම්භ කළ වැඩ පිළිවෙළ කවරේද? වත්මන් තත්ත්වය කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. බස්නාහිර පළාතේ සියලුම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් කරුණට අදාළව දැනුවත් කරමින් අංක : එල්ජීඩී/09/01/11 හා 2013.07.24 දිනැතිව චක්‍රලේඛයක් නිකුත් කරන්නට යෙදී ඇත. එමඟින් වාණිජ පර්මාරථයන් යටතේ අනුමත කරනු ලබන ගොඩනැගිලි සැලසුම්වලට ඇතුළත් වන රථගාල් එම ස්ථානයන්ට සේවා අපේක්ෂාවෙන් පැමිණෙන මහජනයාට ගාස්තු අය කිරීමකින් තොරව භාවිතයට ගත හැකි වන පරිදි පවත්වා ගැනීමට වගබලා ගන්නා ලෙස උපදෙස් දී ඇත. (ඇමුණුම් 01)[3]

[3] ඇමුණුම්1 සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ඊට අතිරේකව කරුණට අදාළව නිශ්චිත විධිවිධාන ඇතුළත් කළ යුතු නාගරික සංවර්ධන අධිකාරී රෙගුලාසි මෙම යෝජනාවට අනුකූලව සංශෝධනය වීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් නාගරික සංවර්ධන අධිකාරී සභාපතිතුමන්ට අංක : එල්ජීඩී/09/01/11 හා 2013.07.24 දාතමින් බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් දැනුවත් කරන්නට යෙදී ඇත. (ඇමුණුම 02)[4]

ආ. පළාත් පාලන ආයතන විසින් ඊට අදාළ කටයුතු නියාමනය කළ යුතු අතර, පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත ඊට අවශ්‍ය උපදෙස් ලබා දීම් සිදු කරන්නට යෙදී ඇත.

ඇ. පළාත් පාලන ආයතයනයන් විසින් රථ වාහන නැවතුම් ස්ථාන ගොඩනැගිලි සැලසුම් යටතේ ප්‍රමාණ කිරීම, අනුමත කිරීම ආදී සියලු කටයුතු නාගරික සංවර්ධන අධිකාරී පනත හා ඊට අදාළ රෙගුලාසි යටතේ සිදු කරන බැවින් එසේ සැලසුම් යටතට ඇතුළත් කරනු ලබන රථගාල් පොදු පහසුකම් සඳහා වන ප්‍රදේශයක් විය යුතු බවට කොන්දේසි ද එම රෙගුලාසි යටතටම ඇතුළත්වීමේ අවශ්‍යතාවයක් පවතින බැවිනි.

ඇ. කරුණට අදාළව නාගරික සංවර්ධන අධිකාරී රෙගුලාසි සංශෝධනය කිරීම උදෙසා නාගරික සංවර්ධන අධිකාරියේ අවධානයට ලක් කර ඇත. දැනට සාකච්ඡා මට්ටමේ පවතී.

ගරු සභාපතිතුමනි, ලොකු පසුබිම් වාර්තාවක් තිබෙනවා. මෙයත් සභාගත කරනවා.

***[සභාගත කරන ලද පසුබිම් වාර්තාව]***
*[tabled Background report]*

*බස්නාහිර පළාත් සභාව විසින් 2012.05.21 දින පහත යෝජනාව සම්මත කරන ලදී.*

*"බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ ඉදි කර ඇති සියලුම කඩ සාප්පු සංකීර්ණ, රෝහල් ඇතුළු විවිධ ගොඩනැගිලි හිමියන් විසින් එම ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීමේදී දෙනු ලබන පොදු පහසුකම් හා රථගාල් භාවිතා කරමින් පාරිභෝගිකයන්ගෙන් මුදල් අය කරනු ලැබේ. මෙම රථ ගාල් එම ගොඩනැගිලි සඳහා අනුමැතිය දීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි හා පළාත් පාලන ආයතනවල නීතිරීතිවලට අනුව නියම කරන අතර, එම පහසුකම් විකිණීම නීති විරෝධී කටයුත්තකි. එම නිසා මෙම පොදු පහසුකම් පෞද්ගලික රථ ගාල් ලෙස ජනතාවගෙන් මුදල් ලබා ගැනීම අහෝසි කරවන ලෙසත්, ඉදිරියට එවැනි ආයතනවලට එරෙහිව නඩු පැවරීමට අදාළ පළාත් පාලන ආයතනවලට බලය ලබා දෙන ලෙසත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි."*

*දැනට බස්නාහිර පළාතේ ප්‍රධාන නගරාසන්න සියලු ප්‍රදේශයන් දැනට නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයන් වශයෙන් පවත්නා හෙයින් පෞද්ගලික රෝහල්, සාප්පු සංකීර්ණ ආදී ඉදි කිරීම් සම්බන්ධයෙන් සැලසුම් අනුමත කිරීම් නාගරික සංවර්ධන අධිකාරී පනත හා ඒ යටතේ වන රෙගුලාසීන්ට අනුකූලව සිදු කරනු ලබයි. එකී රෙගුලාසි යටතේ එවන් සැලසුම් සඳහා රථවාහන නැවතුම් ස්ථාන වෙනුවෙන් වෙන් කළ යුතු ප්‍රමාණ වැනි කරුණු සියල්ල තීරණය කෙරෙන අතර, ඊට අනුකූලව එම ආයතන විසින් රථවාහන නැවතුම් ස්ථාන පවත්වාගෙන යනු ලබයි.*

*ඉහත කී යෝජනාව සම්මත කිරීමේ පරමාර්ථය එවන් සැලසුම් යටතට ඇතුළත්ව පවත්වාගෙන යන රථවාහන නැවතුම් ස්ථානයන්හි සේවා අපේක්ෂාවෙන් පැමිණෙන මහජනයාගෙන් ගාස්තු අය නොකළ යුතුය යන්නයි. අදාළ රෙගුලාසි යටතේ එවන් වූ වාහන නැවතුම් ස්ථාන පවත්වා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් වුවත්, එකී නැවතුම් ස්ථාන මහජනයාට පොදු පහසුකම් විය යුතු බවට නිශ්චිතව සඳහන් නොවීම තුළ බොහොමයක් ආයතන විසින් එකී ස්ථානයෙහි වාහන නැවතුම් සඳහා දෙන පහසුකම් සඳහා ගාස්තුවක් අය කරනු ලබයි.*

*අදාළ යෝජනාවේ පරමාර්ථය ඉෂ්ට කිරීම උදෙසා පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කරමින් චක්‍රලේඛයක් නිකුත් කළ අතර, එමගින් අපේක්ෂා කළේ තම බල ප්‍රදේශය තුළ ඉහත කී පරිදි යම් ආයතනයකට අනුබද්ධ වාහන නැවතුම් ස්ථානයක එය අදාළ ගොඩනැගිලි සැලැස්ම යටතේ පිළිගත් වාහන නැවතුම් ප්‍රදේශයක් වේ නම් එමගින් ගාස්තු අය කිරීම වළක්වාලීම සඳහා පොළඹවාලීමට යම් ක්‍රියාමාර්ග ගැනීමයි.*

[4] ඇමුණුම 2 සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

*එහෙත් කරුණට අදාළව වඩාත් ශක්තිමත්ව ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට නම් අදාළ නාගරික සංවර්ධන අධිකාරී රෙගුලාසි තවදුරටත් සංශෝධනය වෙමින් එසේ ගොඩනැගිලි සැලැස්මකට ඇතුළත්ව පිළිගනු ලබන වාහන නැවතුම් ප්‍රදේශයක් එම ස්ථානයේ සේවා අපේක්ෂාවෙන් පැමිණෙන්නවුන්ගේ පොදු පහසුකම් ප්‍රදේශයක් වශයෙන් පවත්වා ගත යුතු බවට වන කොන්දේසි අදාළ රෙගුලාසි යටතට ඇතුළත් විය යුතුය.*

*ඒ සම්බන්ධයෙන් දැනටමත් නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කරන්නට යෙදී ඇත.*

*කෙසේ වෙතත් අදාළ වාහන නැවතුම් ප්‍රදේශ ප්‍රමාණ කිරීම නියම කිරීම ආදී සියලු කරුණු එලෙස නාගරික සංවර්ධන අධිකාරී පනත හා ඒ යටතේ වන රෙගුලාසි මගින් පාලනය වන තත්ත්වය යටතේ බස්නාහිර පළාත් සභාව මගින් අනුමත කරන ලද ඉහත කී යෝජනාවට අනුකූලව පළාත් පාලන ආයතනයන්ට කටයුතු කිරීමේ හැකියාව එකී රෙගුලාසි සංශෝධනය කිරීම තුළින් උදාකර ගත හැකි තත්ත්වය තුළ ඉහත ආකාරයට වූ පියවර අනුගමනය කරන්නට යෙදී ඇති බවත් එම කරුණ හා බැදුණු සියලු දේ එකී නාගරික සංවර්ධන අධිකාරී පනත හා ඊට අදාළ රෙගුලාසි මගින් නියාමනය වීමේදී එම කරුණ සඳහා පමණක් ප්‍රඥප්තියක් සෑදීම යන්න අදාළ නොවන බව කාරුණිකව පෙන්වා දෙමි.*

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මෙය පළාත් සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරු අනුමත කරපු යෝජනාවක්. මේ මොහොත වන විටත් ලංකාවේ සියලුම පෞද්ගලික රෝහල්වල රථගාල්වල ගාස්තු අය කරනවා. දැන් මෙතෙක් කරගෙන එන ව්‍යාපාරය නැවැත්වීම සඳහා වැඩ සටහනක් බස්නාහිර පළාතේ - දැන් ඉදිරිය පිළිබඳව ඔබතුමා කථා කළා. දැනට මේක නැවැත්වීම සඳහා වැඩ පිළිවෙළක් නැද්ද?.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමනි, එයාලා දැනට අනුමත කරගෙන කරගෙන යන්නේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ. ඒකයි මම ඔබතුමාට මේ පිළිතුරේ පැහැදි කළේ. ඒ සම්බන්ධව නීතිරීති එතැනින් සකස් වෙන්න ඕනෑ. ඒ සම්බන්ධව අපි යෝජනා කරලා ඇරලා තිබෙනවා. ඒ සම්බන්ධව මේ වන විට කටයුතු කෙරෙමින් පවතිනවා. එතැනින් සකස් කරලා එව්වොත් තමයි - නාගරික සංවර්ධන පනත අපේ එකට වඩා වෙනස් වෙන්න - එතැනින් හැදෙන්න ඕනෑ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ, නැහැ, ගරු ඇමැතිතුමනි. මම අහන්නේ, පොදු පහසුකම් කියන්නේ, මේ ගොඩනැගිලි පොදු කාරණයක් නේ? අපි ඔක්කෝම එකඟ වුණු දෙයක් නේ. මේ අනුමැතිය දීමේදී අවසාන නිර්දේශ තමයි නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරිපත් කරන්නේ. අවසාන අත්සන දෙන්නේ අදාළ පළාත් පාලන ආයතනයේ කොමසාරිස්වරයා හෝ ලේකම්වරයා හෝ අදාළ සභාපතිවරයා හෝ නගරාධිපතිවරයා. ඒ සැලැස්මේ අනුමැතියේදී බැඳී සිටින්නේ, අදාළ පළාත් පාලන ආයතනය. එතකොට පොදු පහසුකම් විකුණනවා නම්, එතෙක් අපි බස්නාහිර පළාත අනුමැතියක් දීලා නැහැ පොදු පහසුකම් කටයුතු විකුණන්න. විකුණනවා නම් ඒක නැවැත්වීමේ බලය ඇයි බස්නාහිර පළාත් සභාවට නැත්තේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ පිළිබඳව පැහැදිලි කිරීමක් ඊළඟ සභාවේදී කරන්නම්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

බොහොම ස්තුතියි.

# කොළඹ අසෝක විද්‍යාලය : විදුහල්පති තනතුර

## ASOKA VIDYALAYA, COLOMBO: POST OF PRINCIPAL

**14.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/16)**

අ. I. කොළඹ අශෝක විද්‍යාලයට පත් කළ විදුහල්පතිවරයා විධිමත්ව ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගත් අයෙක්

නොවන නිසා ගුරු මණ්ඩලය හා ඔහු අතර විරසක භාවයක් හට ගැනීමත් සමඟ පාසල් පරිපාලනය ව්‍යාකූල වී ඇති බව දන්නේද?

II. 2014.05.19 ඔබ විසින් රාජකාරී වේලාවෙන් පසු බලහත්කාරීව රැස්වීමක් කැඳවා ඊට සහභාගි නොවූ ගුරුවරුන් ස්ථාන මාරු කරන බවට තර්ජනය කළ බව පිළිගන්නේද?

III. මේ හේතුවෙන් තවදුරටත් පාසලේ රැඳී සිටීම ප්‍රතික්ෂේප කර ඇති ගුරුවරුන් 30 කට ආසන්න පිරිසක් මේ වන විට පාසලෙන් ස්ථාන මාරු කර ඇති බව දන්නේද?

ආ. එකී ගුරුවරුන් අ.පො.ස (සා.පෙළ), (උ.පෙළ) හා ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන්ට ඉගැන්වීම් කළ ප්‍රවීණ ගුරුවරුන් බවත්, ඔවුන් වෙනුවට පාසලට පත්කර යැවූ ගුරුවරුන් අත්දැකීම් රහිත හෝ නුපුහුණු නව පත්වීම් ලාභීන් බවත් පිළිගන්නේද?

ඇ. සුදුසුකම් නොමැති විදුහල්පතිවරයා ආරක්ෂා කිරීම සඳහා ගුරුවරුන් 30 කට ආසන්න ප්‍රමාණයක් ද්වේශ සහගතව ස්ථාන මාරු කිරීමෙන් විභාග අභිමුඛව සිටින පාසලේ දරුවන් අවිනිශ්චිත බියකින් මානසිකව පීඩා විඳින බැවින් පාසලේ දරුවන්ගේ අධ්‍යාපනය හා පරිපාලනය කඩා වැටීමේ සම්පූර්ණ වගකීම ඔබතුමා භාර ගන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. I. නැත.
පාසල තුළ පරිපාලනමය ගැටලු මතුවීම නිසා ව්‍යාකූල තත්ත්වයක් ඇති වූ බව දනිමි.

II. නැත

*ගරු සභාපතිතුමනි, පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මේ රැස්වීම අපි තිබ්බා. මම සහභාගි වුණා. කිසිම අවස්ථාවක මේ වාගේ තර්ජනයක් කරන්න යෙදුණේ නැහැ. එතැන සිටිය ගුරුවරයෙකුගෙන් ඔබතුමන්ලාට සොයා බලන්න පුළුවන්.*

III. පාසලේ දස අවුරුදු සේවා කාලයක් ඇති ගුරුවරු 08 දෙනෙකුටත්, විනය හේතුමත ගුරුවරුන් 08 දෙනෙකුටත් හා ගුරුභවතුන්ගේ ඉල්ලීම මත 12 දෙනෙකුටත් ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර ඇත.

*ඔබතුමා අහන්නේ අර රැස්වීමට ගියේ නැහැයි කියලා මාරු කළාද කියලා. නමුත් ඔබතුමාගේ වැඩි දැන ගැනීම සඳහා එහෙම මාරු කරලා නැහැ. ඒ සිදු වුණු කාලසීමාව තුළ සිට මේ වනතුරු මාරු කරන ලද ගුරුවරුන් පිළිබඳ විතරයි මේ තොරතුරු තිබෙන්නේ. ඒ කියන්නේ, අවුරුදු 10 ට වැඩි 08 දෙනයි. මේ සිද්ධීන් වුණේ මේ සාකච්ඡාවට ඉස්සෙල්ලා. සාකච්ඡාවෙන් පස්සේ ඒ ගුරුවරුන්ගේ ඉල්ලීමක් වුණා, විදුහල්පතිතුමාට විරුද්ධව සිටි සමහර ගුරුවරුන් ඒ ගොල්ලන් ඉල්ලීමක් කරලා තිබුණා. ඒ අයට ආපසු විදුහල්පතිතුමාත් එක්ක කටයුතු කරන්න බැහැ. ඒ නිසා ඒ අයට වෙනත් පාසල් දෙන්නය කියලා. ඒ අයගේ ඉල්ලීම් මත තමයි මේ 12 දෙනාට ඒ අවස්ථාව දුන්නේ.*

ආ. නැත.

ඇ. අදාළ නොවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු මහ ඇමැතිතුමනි, මම දැනගන්න කැමැතියි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්න තුනක් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම මේකේ සඳහන් කරලා තිබෙනවා වාගේ (අ) යන්නේ II වැනි ප්‍රශ්නය. පස්වැනි මාසයේ 19 වැනිදා පාසල් වේලාවෙන්, රාජකාරී වේලාවෙන් පසුව ඔබතුමා පාසලට ගිහින් ඒ රැස්වීමට ගිහින් ඒ රැස්වීමට සහභාගි නොවුණු ගුරුවරුන් 40 දෙනෙකුට, ඔබතුමා එතැන හිටපු ගුරුවරුත් එක්ක දෝෂාරෝපණය කරලා, ඔවුන්ට තර්ජනය කරලා තිබෙනවා. ඒ තර්ජනය කිරීමෙන් අනතුරුව ඔබතුමා පවසලා තිබෙනවා, ඒ ගුරුවරුන්ට ස්ථාන මාරුවීම් ඉල්ලන ලෙස. ඒ අනුව තමයි ඔවුන් ඉල්ලා තිබෙන්නේ. එය ඔබතුමා පිළිගන්නේ නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, පිළිගන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් ඊයේ දවස තුළ මේ පාසලේ මේ වන විට ශිෂ්‍යත්වය කරපු ගුරුවරු මාරු කරලා තිබෙනවා. ඒ වාගේම මෙවර 2014 සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙන සිසුන්ට උගන්වන්න ගුරුවරුන් මාරු කරලා තිබෙනවා. ඒ වාගේම උසස් පෙළ ගුරුවරුන් මාරු කරලා තිබෙනවා. ඒ මාරු කිරීමේ ප්‍රතිඵලයක් විධියට තමයි ඊයේ දවස තුළ වාණිජ අංශයේ දරුවන් විවේක කාලයේදී, ගුරුවරුන් පන්තියේ නොමැති මොහොතේදී එළියට බැහැලා පාසල තුළ යම් කළබැගෑනියක් ඇති වෙන්නේ. ඒ නිසා ඔබතුමා පිළිගන්නේ නැද්ද මේ දරුවන්ගේ - මම ඉතාම පැහැදිලිව අහන්න ඕනෑ, 07/2007/20 ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට පටහැනිව තමයි මේ ගුරුවරු මාරු කරලා තිබෙන්නේ. එවැනි ප්‍රතිපත්තියට පටහැනිව මේ දරුවන්ට උගන්වපු ගුරුවරු, විශේෂයෙන්ම උසස් පෙළට උගන්වපු ගුරුවරු මාරු කිරීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඊයේ ඒ දරුවන් එළියට බහින්නේ. ඒ කියන්නේ පන්ති කාමරවලින් එළියට බහින්නේ. එවැනි වටපිටාවක් නිර්මාණය වුණේ, එක පුද්ගලයෙක් ආරක්ෂා කරන්න ගිහිල්ලා මේ පාසලේ දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඉඩ දෙන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්නයක්, කියලා වැල් ප්‍රශ්න අහන්න දෙන්න බැහැ. ඔබතුමා ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ ප්‍රශ්නය යොමු කරන්න ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඉඩ දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම දන්නේ නැහැ, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු සියලු දෙනා අසෝක වැනි පාසලක් මෙලෙස කඩා වැටෙන එකට පක්ෂද කියලා . ඒ නිසාද මට මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රකාශයක් කරන්න ඉඩ දෙන්න බැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔබතුමා තමයි කඩා වැටෙන එකේ සම්පූර්ණයෙන් පිටිපස්සේ ඉන්නේ. ඒකයි වෙලා තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා ]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න කෝ. මම උත්තරය දෙන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට අහන්න දෙන්න කෝ ඉතින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා එක ප්‍රශ්නයක් ඇහුවා. දෙවැනි ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ ප්‍රශ්නය තමයි මෙලෙස ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට පටහැනිව ගුරුවරු මාරු කරමින් ඔබතුමා එක පුද්ගලයෙක් ආරක්ෂා කිරීම වෙනුවෙන් මුළුමහත් පාසලක පරිපාලනය කඩා වට්ටලා තිබෙනවා කියන එක පිළිගන්වාද? නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නයට කෙටි පිළිතුරක් දෙනවා වාගේම කියන්න ඕනෑ. මම මේ ප්‍රශ්නයට උත්තර දුන්නා, (අ) III න්. මේ ගුරුවරුන් මාරු කිරීමට පදනම් වුණේ කොහොමද කියලා. ගුරුමාරු ප්‍රතිපත්තිය හැටියට ගරු සභාපතිතුමනි, දස අවුරුදුවලට වඩා සිටින ඒ ගුරුවරුන් මාරු කිරීම මාරු මණ්ඩල වගකීමක්. වෘත්තීය සමිතිවල. එතකොට මාරු මණ්ඩලවලින් වෙන්න ඕනෑ දෙයක්. මේ පාසලේ ඒ සිද්ධිය වෙලා තිබුණේ නැහැ. ගුරුවරු 16 කගේ අතිරික්තයක් තිබුණා. ඒ සම්බන්ධව වෘත්තීය සමිති තමන්ගේ වගකීම, ගුරුමාරු මණ්ඩල කටයුතු හරියට කරලා තිබුණේ නැහැ. ඒ වාගේ අවස්ථාවකදී පාසල තුළ එක පැත්තකින් - ඉතිහාසයේ අපි ලබලා තිබෙන අත්දැකීම්. මම මීට පෙරත් ප්‍රකාශයේදී පැහැදිලි කළා. මේ වෘත්තීය සමිති මාධ්‍යයට ගිහින් කියනවා, අපට බස්නාහිර පළාතේ පුහුණු ගුරුවරුන් නැහැයි කියලා. පුහුණුවීම් දෙනකොට ඒ වෘත්තීය සමිති නායකයෝම ඒකට විරුද්ධ වෙලා කඩාකප්පල් කරනවා. ඊළඟට මේක වට්ටන්න හදනවා. මේ පාසලේ සිද්ධියටත් පසුබිම ඒකයි ගරු සභාපතිතුමනි. මේක, වෘත්තීය සමිතිවල සමහර නිලධාරීන්ගේ අවශ්‍යතාවයක්. මෙතුමා ගිහිල්ලා, වෘත්තීය සමිති ගිහිල්ලා උද්ඝෝෂණය කරනකොට ශිෂ්‍ය නායකයන් ගිහිල්ලා කිව්වා, ඔබතුමාන්ලා කරුණාකරලා ඉස්කෝලේ කීර්ති නාමයට හානි කරන්නේ නැතිව මෙතැනින් ඈතට වෙලා උද්ඝෝෂණය කරන්න කියලා. එහෙම කිව්වා. නැහැයි කියනවාද ඔබතුමා.

මම ඔබතුමාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලනවා. මේ ප්‍රශ්නයට ඔබතුමන්ලා මැදිහත් වනකොට මධ්‍යස්ථව මැදිහත් වෙන්න. මොකද, මේ මම අධ්‍යාපනය ලබපු පාසල. මේ පාසල මොනම හේතුවක් නිසාවත් කඩන් වැටෙන්න මම ඉඩ දෙන්නේ නැහැ. ඒකට අවශ්‍ය කරන පහසුකම් හා ගුරුවරුන් ලබා දීමේ වගකීම තිබෙනවා. මේ ඇති වුණු සිද්ධි මාලාව තුළ ඔබතුමා නොවෙයි, මැදිහත් වුණේ. වෙන කෙනෙක් ඉස්සෙල්ලා මැදිහත් වුණේ. ඊට පස්සේ ඔබතුමා මේකට අතගහලා තමයි මේ තත්ත්වයට පත් කර ගත්තේ. ඒ නිසා මේ පාසල තුළ, මේකේ වගකීම මම භාර අරගෙන කටයුතු කරනවා. විදුහල්පතිවරයා රැක ගැනීම වාගේම. මම හිතන්නේ පසුගිය කාලසීමාවේදී සමහර ගුරුවරුන්ගේ හැසිරීම තුළ මේ සිද්ධිය වුණේ. ඒ නිසා ඊයේ දවසේත් මේ කළබලය, ඔබතුමා කිව්වා වාගේ වාණිජ අංශයේ ළමයින් ටිකක් ගෙන්න ගෙන, ගුරුවරු කිහිප දෙනෙක් මේ උද්ඝෝෂණය කෙරෙව්වා. නමුත් අනික් කිසිම පන්තියක දරුවන් ගියේ නැහැ. ඊයේ වන විට ගුරුවරුන් ඔක්කෝම මට ලිඛිතව දීලා තිබෙනවා. අද හැන්දෑවට මම ඉදිරිපත් කරනවා. ගුරුවරු ඇවිල්ලා පැහැදිලිව කියනවා. මේ පාසලේ අනික් පන්තිවල කිසි ගැටලුවක් වුණේ නැහැ. මේ ළමයින් තමයි මෙහෙම හැසිරුණේ. මෙන්න මේ අයගේ උවමනාවට. මේ පිළිබඳව අද උදේ පරීක්ෂණයක් කරනවා. මම හිතනවා, වෘත්තීය සමිති හැටියට ඔබතුමන්ලාගේ වගකීමක් තිබෙනවා. මේ පාසල් පද්ධතිය, මේ අපේ තිබෙන හොඳම පාසල් ටික කඩා වැටෙන්න දෙන්නේ නැතිව, අවුල් ඇති කරන්නේ නැතිව මේක පවත්වාගෙන යන්න ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා මධ්‍යස්ථව මැදිහත් වෙන්න කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය හැටියට මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අවසර දෙනවාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

එතුමා කැමැත්තෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්. ඔබතුමා අහන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු මහ ඇමැතිතුමනි, මෙහෙමයි ඔබතුමා කියන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දීර්ඝ පැහැදිලි කිරීම් කරන්න දෙන්න බැහැ. ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ප්‍රශ්නය අහන්න කෝ. මම අහන එකම අතුරු ප්‍රශ්නය. ඔබතුමාම පිළිගන්නවා ගුරුවරු 38 ක් මාරු කරලා තිබෙනවා. මේ තත්ත්වය, එක පාසලක එකපාර ගුරුවරු 38 ක් මාරු කිරීම අසාමාන්‍ය තත්ත්වයක් කියලා ඔබතුමා පිළිගන්නේ නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මාරු කළේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. මේක පැහැදිලිව මම කිව්වා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආයේ යන්න බැහැ. ප්‍රශ්නය ඇහුවා නේ?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දස අවුරුදු මාරුවලින් 08 යි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ක්‍රමය මට වැඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න බැහැ. එතුමා උත්තර දෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මම අහන්නේ එක පාරක ඉස්කෝලයකින් ගුරුවරුන් 38 ක් මාරු කරලා යවන එක ඒ පාසලේ අධ්‍යාපනය ලබන දරුවන්ට ලොකු බාධාවක් කියලා ඔබතුමන්ලා හිතන්නේ නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමනි, පාසලේ උන්නතිය සඳහා අවශ්‍යතාවය අනුව කටයුතු කිරීම තුළින් පාසලට වෙන්න තිබෙන හානියට වඩා අඩු හානියකින් මේ තත්ත්වය පාලනය කිරීමට හැකියාව තිබෙනවා.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. පසුගිය ඉරිදා දිනයේදී කටාන මැතිවරණ කොට්ඨාශයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දෙන්නෙකුගේ මැදිහත්වීමෙන් සිදු වුණු ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අපට වරප්‍රසාද කඩවීමක්, ගැටලුවක් තිබෙනවා. කටාන යෞවන සමාජ සම්මේලනයේ නිලවරණය පැවැත්වීමට ගිය ඉරිදා නියමිතව තිබුණා. ඒ නිලවරණයට සහභාගී වෙන්නට නියමිතව තිබුණේ යෞවන සමාජ සාමාජිකයන් පමණයි. නමුත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් බලහත්කාරයෙන් ඒ රැස්වීමට කඩා වැදිලා ඒ නිලවරණයේ ඡන්දය පාවිච්චි කරන්න පැමිණි තරුණයන් 200 කට ආසන්න ප්‍රමාණයක්, බස් රථවලින් පැමිණි තරුණයන් විශාල ප්‍රමාණයක් ආපසු හරවා හරින්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් දෙන්න බැහැ. ඔබතුමා -

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

මටත් වුණා. මමත් ඒකේ සාමාජිකයෙක්. මම යෞවන සමාජ සම්මේලනයේ සභාපතිවරයා. මම එතැනට සහභාගී වෙනකොට මමත් එක්ක පැමිණි අනික් කණ්ඩායම පළවා හැරියා. අපට තර්ජනය කළා, මෙතැන ඉන්න එපා කියලා. අපට මේක වරප්‍රසාද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ගරු සභාපතිතුමනි, මෙය තරුණයන්ට වුණු අසාධාරණයක්. මම එතැන සිටියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉඳගන්න.

[සභාවේ ඝෝෂා ]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩවීම, මම වරප්‍රසාද කමිටුවට යොමු කරලා සොයා බලන්නම්.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

අපි එතැනට සහභාගි වුණාම අනන්ද හරිස්චන්ද්‍ර සහ උපුල් රාජිත ගරු මන්ත්‍රීවරු ඇවිල්ලා තමයි තර්ජනය කළේ. ඒ ගෙනාපු මැර කණ්ඩායම් අපට තර්ජනය කළා. මමත් එතැන සිටියා. මාධ්‍යයෙන් ඇවිල්ලා සිටියා. මාධ්‍යයෙන් දැක්කා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීවරු එතුමන්ට බාධා කිරීම් කරන්න එපා. මම ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය සොයා බලන්නම්.

මෙම අවස්ථාවේදී සභාව උදැසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.54 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.54 a.m. and then resumed.*

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, හෝමාගම, ගොඩගම සුභාරතී මහාමාත්‍ය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ කටයුතු පිළිබඳව ආදි ශිෂ්‍යයින් අතර අපැහැදිලිතාවයක් මතු වෙලා තිබෙනවා. ඊට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ, වසර ගණනාවක සිට මේ ආදි ශිෂ්‍ය සංගමය විසින් තමන්ට මුදල් ලැබෙන ආකාරය පිළිබඳවත්, තමන් මුදල් වියදම් කරන ආකාරය පිළිබඳවත් පැහැදිලි අයවැය වාර්තාවක් කිසිම සභාවකදී ඉදිරිපත් කරලා නොමැති වීමයි. ඒ වාගේම එහි විගණනයකුත් සිදු වෙලා නැහැ. මේකේ ප්‍රධාන සිද්ධියක් සිද්ධ වෙනවා. මීට වසර තුනකට පෙර සුභාරතී විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය රුපියල් තුන්ලක්ෂ අසූ පන්දහසක මුදලක් ගෙවා ත්‍රීරෝද රථයක් ලබාගෙන විද්‍යාලයට පරිත්‍යාග කරලා තිබියදී ඒ ත්‍රීරෝද රථයේ පොත එහි නිලධාරියෙක් විසින් ලබාගෙන මේ වන කොට ඒකට මූල්‍ය පහසුකම් ලබාගෙන තිබෙනවා. ඒක සොයන්න හේතු වුණේ? එය සබරගමු පළාතේ ලියාපදිංචි වෙලා තිබෙන්නේ. බස්නාහිර පළාත් සභාවේ ලියාපදිංචි විය යුතු ත්‍රීරෝද රථය එහෙම පිට පළාතක ලියාපදිංචි කළේ ඇයි කියලා හොයනකොට තමයි දැනගන්න ලැබුණේ, මේකට මූල්‍ය පහසුකම් ලබාගෙන කියලා. එතකොට ඒකට මුදල් ගෙවලා තිබෙනවා. ඒ නිසා මෙහි විශාල අකටයුතුකම් ගණනාවක් සිදු වෙනවා. ඒ නිසා ප්‍රදේශයේ ආදි ශිෂ්‍යයින් විශාල අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. මොකද අද ආදි ශිෂ්‍ය සංගමය ක්‍රියාත්මක වෙන්නේ, දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා. එන ආදි ශිෂ්‍යයන් තමන් ලබා දෙන මුදල් පිළිබඳව කිසිම අවස්ථාවක රිසිට් පතක් ලබා දුන්නේ නැහැයි කියලා චෝදනා කරනවා. ඒ වාගේම විද්‍යාගාරයක් නවීකරණය කරන්න කියලා, ආදි ශිෂ්‍ය කාර්යාලය නවීකරණය කරන්න කියලා මේ සියලු දෙයට එකතු කරපු මුදල්වලට කිසිදු වාර්තාවක් මේ වනකොට ඉදිරිපත් කරන්නේ නැහැයි කියන තත්ත්වය තිබෙනවා. මම මේ පිළිබඳව පසුගිය දවස්වල හෝමාගම කලාප කාර්යාලයට දැනුම් දුන්නා. නමුත් මේ වනකොටත් කිසිදු පරීක්ෂණයක් එහි සිදු වෙලා නැහැ. ඒ නිසා මේ සිදුවන ක්‍රියා පිළිබඳව - මෙහි මුදල් විශාල ප්‍රමාණයක්. පසුගිය වසර දෙක තුනක ටිකට් පත් අලෙවියෙන් ලක්ෂ 15 ක පමණ මුදලක් විද්‍යාලයට ලැබිලා තිබෙනවා. ඒ මුදලට වුණු දෙයක් අද වනතුරුත් ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමා මාර්ගයෙන්, ගරු ප්‍රධාන අමාත්‍යතුමා මාර්ගයෙන් වගකිව යුතු නිලධාරීන්ට යොමු කරලා, විශේෂයෙන් ඒ නිලධාරීන්ගේ ඇස් පියා ගන්නේ නැතිව, කණ් වහගෙන ඉන්නේ නැතිව මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා, මේ පිළිබඳව කටයුතු කරන්නය කියන ඉල්ලීම තමයි මම සභාවෙන් ඉල්ලා සිටින්නේ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Mohamed Arshad Nizamdeen

ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තූතියි. රටේ මෑත කාලයේදී සිදු වූ සිද්ධිය, 2014 ජූනි මස 15 වැනිදා අලුත්ගම, බේරුවල ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවට වුණු සිද්ධීන් සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මගේ ස්තූතිය පළ කරනවා. ඒ වාගේම මේ සිද්ධීන්

[ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්]

සම්බන්ධයෙන් මීට පෙර සිටම, 15 වැනිදාට පෙර සිටම මේ බලධාරීන්ට අපි දැනුම් දීලා තිබෙනවා, මෙවන් රැළියක් පවත්වන්න යනවා. මේ රැළිය පැවැත්වීම සඳහා ඉඩ දෙන්න එපාය කියලා. නමුත් මේ රැළිය පැවැත්වීමට අනුබල දීලා, මේ රැළිය පැවැත්වීම සඳහා පොලිස් නිලධාරීන් පවා සහාය වුණා. මේ රැළිය පැවැත්වීමට ඉඩ දුන්නා. මේ සම්බන්ධයෙන් කිසිම හානියක් මුස්ලිම් ජනතාවට වෙන්නේ නැති බවට ඔවුන් 100% ක් සහතික වුණා. නමුත් එලෙස සහතික වුණු ඒ නිලධාරීන් පවා මේ විනාශයට මුල් වූ බව ඒ ප්‍රදේශයේ ජනතාව කියනවා.

මේ විනාශයට මුල්ම හේතුව මේ බොදුබල සේනා සංවිධානය. මම Internet එකේ මේ බොදුබල සේනා සංවිධානයේ මේ ඒ අයගේ කථාව දැක්කා. ඒ බොදුබල සේනා සංවිධානයේ ලේකම් ගලබොඩඅත්තේ ඥානසාර ස්වාමීන් වහන්සේ කථා කරපු විලාසය අනුව ජනතාව ප්‍රකෝප කිරීම, වෛරය ඇති වෙන ආකාරයට එවැනි කථාවක් තමයි උන්වහන්සේ කරලා තිබුණේ. එවැනි කථාවන් කිරීමෙන් පසු තමයි මෙවන් සිද්ධියකට මුල පිරුණේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා, මේ බොදුබල සේනා සංවිධානය මේ රටේ තහනම් සංවිධානයක් බවට පත් කරන්නය කියලා. ඒ වාගේම අද වනතුරු මේ අලුත්ගම, බේරුවල මුස්ලිම් ජනතාව බියට පත් වෙලා ජීවත් වෙන්නේ. අලුත්ගම, බේරුවල ජනතාවට එදා හානි -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඕකට ආණ්ඩුවත් සම්බන්ධද දන්නේ නැහැ.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Mohamed Arshad Nizamdeen

හානි වුණු දේවල් අනුව ගෙවල්, කඩවල්, 250 කට වඩා ගිනිබත් කරලා තිබෙනවා. ඒ වාගේම ව්‍යාපාරික ස්ථානවලට, ඒ වාගේම මිනිස්සුන්ට වුණු හානිය. හතර දෙනෙක් දැනට ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. අපේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙකුගේ එළුවන් 600 ක් මරලා තිබෙනවා. මෙවැනි විනාශයක් පත් වීමට මූලික හේතුව බොදුබල සේනාව එදා තිබුණු රැළියයි. ඉතින් ඒ රැළියට සහභාගි වුණු ජනතාව ප්‍රකෝපකාරී කරලා උන්වහන්සේලා ඉන්පසුව එතැනින් නික්මෙලා ගියා. ඊට පස්සේ වුණු දේවල් තමයි මේ. ඊට පස්සේ ඇඳිරි නීතිය දැම්මා. ඇඳිරි නීතිය දාලත් මොකක්ද වුණේ? කිසිම ආරක්ෂාවක් දැම්මේ නැහැ. කිසිම ආරක්ෂාවක් ජනතාවට සැපයුවේ නැහැ. ඒ ජනතාව කියන අයුරුයි -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා කථා කරන්න.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Mohamed Arshad Nizamdeen

ඒ ජනතාව කියනවා, මේකට පොලීසියත් සම්බන්ධ වෙලා තමයි වැඩ කරලා තිබෙන්නේ කියලා. ඉතින් ගරු සභාපතිතුමනි, මෙවැනි පීඩාකාරී තත්ත්වයකට අද අපේ ජනතාව පත් වෙලා තිබෙනවා. අලුත්ගම, බේරුවල විතරක් නොවෙයි. බදුල්ලෙත් ඊයේ පෙරෙයිදා මෙවැනි සිද්ධීන් සිදු වෙලා තිබෙනවා.

**අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

දෙහිවල.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Mohamed Arshad Nizamdeen

දෙහිවලත් මෙවැනිම සිද්ධියක් සිදු වෙලා තිබෙනවා. මුස්ලිම් ව්‍යාපාරික ස්ථාවලට, මුස්ලිම් අයගේ ආර්ථික තත්ත්වය කඩා දැමීමට තමයි මේ අයගේ මූලික පරමාර්ථය වෙලා තිබෙන්නේ. මේ අයගේ ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය පිරිහිලා. මම මේ රජයෙන් ඉල්ලා සිටින්නේ, අපේ රජයේ පාර්ශවයක් හැටියට ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය හැටියට මේ බොදුබල සංවිධානය තහනම් කරලා මේ අයව වහාම අත්අඩංගුවට ගත යුතුයි කියලා මම ඉල්ලා සිටිනවා. මෙතෙක් හතර දෙනෙක් පමණයි අත්අඩංගුවට පත් වෙලා තිබෙන්නේ. ඒ හතරදෙනාම දැන් පොලිස් ඇප මත මුදා හැරලා තිබෙනවා කියලා අපට ආරංචි වෙලා තිබෙනවා. ඒක ඇත්තද බොරුද කියලා දන්නේ නැහැ. ඒක නිවැරදි නම් -

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඇමැතිකමෙන් අයින් වෙන්න කියන්න ඉස්සෙල්ලා.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Mohamed Arshad Nizamdeen

ඒක අපි බලාගන්නම්. මේ වාගේම සිද්ධි 83 ත් වුණා. 1983 න් පස්සේ මම දැක්ක මිලේච්ඡම ක්‍රියාව මේ බව කියලා මට කියාගන්න පුළුවන්. 1990 ප්‍රභාකරන් විසින් මුස්ලිම් ජනතාව පළවා හැරියා. 2014 දී මේ බොදුබල සංවිධානයේ ලේකම් විසින් මුස්ලිම්වරුන්ව - කාන්තාවන් භයවෙලා කැලෑවලට ගිහින් රිංගලා ඉඳලා තිබෙන්නේ. එවැනි තත්ත්වයක් ඇති වුණේ. ළමයි ලපටි පවා. ඊයේ වනතුරු ඒ මිනිස්සු ගෙවල්වල ලයිට් පවා දාන්නේ නැති තත්ත්වයක් උදා වෙලා තිබුණා. කොපමණ ආරක්ෂාවක් දැම්මත් විශ්වාසයක් නැහැ.

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් කියනවා. මේ බස්නාහිර පළාතට අපි වගකියන්න ඕනෑ. මේක වෙලා තිබෙන්නේ, බස්නාහිර පළාතේ. ඒ නිසා අපි රජයක් වශයෙන් මෙයට මැදිහත් වෙලා මෙවැනි දේවල් කළ අයව වහාම අත්අඩංගුවට අරන් - නිකන් ඉන්න කට්ටියව අත්අඩංගුවට අරගෙන වැඩක් නැහැ. මේකට මුල පුරපු ඒ බොදුබල සංවිධානයේ ලේකම්ව ඉතා ඉක්මණින්ම අත්අඩංගුවට අරගෙන අපේ මුස්ලිම් ජනතාවට, අපේ ලාංකික මුස්ලිම් ජනතාවට නිදහසේ ජීවත් වෙන්න පරිසරයක් උදා කර දෙන්නය කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. ඔබ සියලුදෙනාට බොහොමත්ම ස්තුතියි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි, ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, අපට මතකයි. පසුගිය පළාත් සභා වාර කීපයකදීම මම පෞද්ගලික ප්‍රකාශවලදී මේ සභාවට පෙන්වලා දුන්නා, මේ රටේ සිංහල - මුස්ලිම් ගැටුමක් නිර්මාණය කරන්න බොදුබල සේනා සංවිධානය ඇතුළු සංවිධාන කිහිපයක් වැඩ කරගෙන යනවා කියලා. අපි ඉතා වගකීමක් ඇතිව පැහැදිලි කරලා දුන්නා. අපි කිව්වා, මේ හදන්නේ, මේ රටේ සමඟියෙන් ජීවත්වන සිංහල - මුස්ලිම් ජනතාව අතර වෛරය ඇති කරලා, ක්‍රෝධය ඇති කරලා, එකිනෙකා ගහ කොටා ගන්නා තත්ත්වයක් මේ රටේ නිර්මාණය කරන්නයි හදන්නේ කියලා. ඒ තත්ත්වය ඇති කරනවයි කියන එක මේ සභාවේ අපි පසුගිය කාලය පුරාම පැහැදිලි කරලා දුන්නා. අපි කනගාටු වෙනවා. අපි ඒ කියපු දේවල් සත පහක් මායිමට ගත්තේ නැහැ. අපි කියපු දේවල්වලට ඇහුම්කන් දුන්නේ නැහැ. අපි කියපු දේවල් පිළිගත්තේ නැහැ. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද කෝටි ගණනක දේපළ හානි කරලා, ජීවිත හතරක් බිලි අරගෙන, අද අනාථයන් බවට පත් වෙලා, දහස් ගණනක් මුස්ලිම් ජනතාව අනාථ කඳවුරුවල පාසල්වලට වෙලා ඉන්නවා. මම ඊයේ බේරුවල පාසලකට ගියා. 1300 ක් විතර අනාථ වෙලා සිටියා. මට ඉතාම කනගාටුවක් ඇති වුණා. මෙතැන අපත් එක්ක වාඩි වෙලා හිටපු ආණ්ඩු පක්ෂයේ අම්ජාඩ් මන්ත්‍රීතුමා, එතුමා සරමක් ඇඳගෙන ඒ පාසලේ අනාථයෙක් හැටියට ඉන්නවා. එතුමාව දැක්කාම මට ඇස්වලට කඳුළු ආවා. එතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වෙලා සිටියත් අද එතුමාත් එතුමාගේ ආරක්ෂාව සහතික කරගන්න බැරිව ඒ පාසලේ ජීවත් වෙනවා, ගරු සභාපතිතුමනි. අද මේකයි මේ රටේ තත්ත්වය. එහෙමනම් මේක කරන්නද පසුගිය කාලයේ තමුන්නාන්සේලා බලාපොරොත්තු වුණේ. මේකද මේ කරන්න හැදුවේ? මේක කරන්නද මේ ආණ්ඩුව ඉඩ දුන්නේ? මේක වනතුරුද ආණ්ඩුව බලාගෙන සිටියේ? මේ වාගේ මේ රටේ ජාතීන් අතර වෛරය ඇති කරන්න, ජාතීන් අතර භේද බින්න ඇති කරන්න - අවුරුදු 30 ක යුද්ධයක් කරලා, ඒ යුද්ධය අවසාන වෙලා අවුරුදු පහක් තවම ගියේ නැහැ. අපට බැරි වෙලා තිබෙනවා, ජාතික සමඟිය ගොඩනගන්න. තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා, ජාතික සංහිඳියාව ගොඩනගන්න. තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා, ජාතීන් අතර සුහදත්වය වර්ධනය කරන්න. ඒවා කරන්න මේ ආණ්ඩුව අද අසමත් වෙලා තිබෙනවා.

මම කනගාටු වෙනවා. රවුෆ් හකීම් මැතිතුමා, මුස්ලිම් ජාතිකයෙක් වෙලත්, අධිකරණ ඇමැති හැටියට මේ ආණ්ඩුවේ ඉඳගෙන, එතුමා නියෝජනය කරන ජනතාවට සාධාරණත්වය ඉෂ්ට කරන්න බැරි වුණු එක ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේම මගේ විරෝධත්වයත් ප්‍රකාශ කරනවා. මේ ආණ්ඩුවේ ඉන්න මුස්ලිම් ඇමැතිවරු තවමත් මේ ආණ්ඩුවේ ඉන්නේ, රෙදි ඇඳගෙනද කියලා මට අහන්න සිද්ධ වෙනවා. මොකක්ද ගරු සභාපතිතුමනි ප්‍රශ්නය? ස්වාමීන් වහන්සේ නමකට පහර දුන්නයි කියලා ඒ පහරදීමට සම්බන්ධ වුණු තුන්දෙනෙක් අත්අඩංගුවට අරගෙන දවස් 14 ක් ඒ අයව රිමාන්ඩ් කරලා තිබෙනවා. එතකොට මේ ප්‍රශ්නය එතැනින් ඉවරයි. මේක පෞද්ගලික ආරවුලක්. මේ පෞද්ගලික ආරවුලකට බොදුබල සේනා සංවිධානය මැදිහත් වෙලා ඒ ප්‍රදේශයේ ජීවත් වුණු සිංහල - මුස්ලිම් ජනතාවගේ සමඟිය කඩලා, ඒ අය ප්‍රකෝප

වන විධියට රැස්වීම් තියන්න ඉඩ දුන්නේ කවුද? කවුද ලවුඩ්ස්පීකර් භාවිතා කරන්න ඉඩ දුන්නේ? පොලීසිය අවසර දුන්නාද? අපට අහන්න සිද්ධ වෙනවා. පොලීසියේ අවසර අරගෙනද ගලබොඩ ස්වාමීන් වහන්සේ ඇවිල්ලා අලුත්ගම ටවුන් එකේ රැස්වීම් තිබ්බේ? මෙහෙම රට ගිනි ගන්න වේලාවක.

අපි දන්නවා, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට උද්ඝෝෂණයක් කරන්න බැහැ. උසාවි නියෝගයක් අරගෙන ඇවිල්ලා ආණ්ඩුව ඒවා නවත්වනවා. පසුගිය කාලයේ විරුද්ධ පක්ෂවල යම් යම් උද්ඝෝෂණ උසාවි නියෝග හරහා මර්දනය කළා අපි දැක්කා. ඇයි එහෙමනම් මේකට උසාවි නියෝගය ගත්තේ නැත්තේ? ජාතීන් අතර ප්‍රශ්න ඇති කරන ක්‍රියාවලියක් මේක. මේක මේ රටේ සාමය විනාශ කරන ක්‍රියාවලියක්. මේක සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අතර වෛරය, ක්‍රෝධය ඇති කරන ක්‍රියාවලියක්. ඇයි? මේක නැවැත්තුවේ නැත්තේ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. ඇයි මේකට උඩගෙඩි දෙන අයව, මේකට උල්පන්දම් දෙන අයව, මේවාට සාධාරණත්වය ප්‍රකාශ කරන අයව තවම නිදැලේ ඇරලා තිබෙන්නේ ඇයි? ගරු සභාපතිතුමනි, කියන්න ලැජ්ජයි. බේරුවල පොලීසිය හය දෙනෙක්ව අත්අඩංගුවට ගත්තා. පොලිස් ඇප මත නිදහස් කරලා තිබෙනවා. කෝටි 500 කට අලාභහානි. ජීවිත 04 ක් නැති වෙලා. මේ රටම අද කළුබෑගෑනියකට පත් කරලා තිබෙනවා. රටේම ජනතාව ජීවත් වෙන්නේ භයෙන්. කොයි වෙලාවේ කලබලයක් ඇති වෙයිද? කොයි වෙලාවේ ගහයිද කියලා භයෙන් ජීවත් වන මේ වේලාවේ ඒ පස් දෙනාව පොලිස් ඇප මත නිදහස් කරලා. ඇඳිරි නීතියත් දාලා තිබෙනවා. පොලිස් ඇඳිරි නීතිය තියෙන්නේ. පොලිස් ඇප මත නිදහස් කරලා. ඊයේ රෑ වැලිපන - ඒ දූප්පත් ගම්මානයක්. වැලිපැන්න පිහිටි දූප්පත් ඒ ගම්මානයේ ඉන්න මුස්ලිම් ජනතාව කුලී වැඩ කරලා ජීවත් වෙන්නේ. බේරුවල වාගේ අඩුම ගණනේ සල්ලිකාරයෝ ඉන්න ප්‍රදේශයක්වත් නොවෙයි. ඊයේ ඒ ගමට ගිහිල්ලා ගහලා කඩවල් ඔක්කෝම විනාශ කරලා. දෙමළ මනුස්සයෙක්වත් මරලා දාලා. මොකක්ද මේ රටේ වෙන්නේ? ඇයි මේ ආණ්ඩුව බලාගෙන ඉන්නේ? ඇයි ආණ්ඩුව මේක නවත්වන්නේ නැත්තේ? දෙමළ ඩයස් පෝරාවට කවුද මේවා දෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කවුද මේවා ජාත්‍යන්තරයට ගෙනි යන්නේ? අපට මේ රටේ මේ ආණ්ඩුවෙන් සාධාරණත්වයක් බලාපොරොත්තු වෙන්න බැරි වුණාම, මේ රටේ නීතිය, සාමය ක්‍රියාත්මක කරන්න ආණ්ඩුවට බැරි නම් අපි හෙට ජාත්‍යන්තරයට ගියාම තමුන්නාන්සේලා අපට කියයි දේශද්‍රෝහීන් කියලා. තමුන්නාන්සේලා අපට කියයි දෙමළ ඩයස් පෝරාව කියලා. කලබල ඇති කරලා, ඒ දෙමළ ඩයස් පෝරාවට එක එක දේවල් කථා කරන්න ඉඩ දෙන්නේ කවුද? ඒවා තමුන්නාන්සේලා සොයන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

බොදුබල සේනාවේ මේක මෙහෙයවපු සියලුම නායකයන්ව අත්අඩංගුවට ගන්න. ඒක තහනම් කරන්න. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අතරේ සමඟිය ඇති කරන්න. වහාම නීතිය ක්‍රියාත්මක කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. බේරුවල සංවිධායකවරයා හැටියට පසුගිය 16 වැනිදා එළිවනකොට 10,000 ක විතර ජනතාවක් අවතැන් වෙලා කන්න නැතිව ඉන්න අවස්ථාවක ඒ සියලුම ජාතීන් වෙනුවෙන් කෑම ටිකක් පිළියෙළ කරලා, පාර්සල් 1500 ක් අලුත්ගම නගරයෙන් දර්ගා නගරය හරහා ගෙනි යනකොට ගනේගම Railway Crossing එක පාස් කරන කොටම මම යන වාහනයට, ලොරියට, තවත් කෲ කැබ් එකකට පහර දීලා අලාභහානි කිරීම පිළිබඳව මට වරප්‍රසාද කඩවීමක් තිබෙනවා. මට ආරක්ෂාවක් නැතිව ජනතාව වෙනුවෙන් යමක් කරන්න අවස්ථාවක් නොමැතිවීම ගැන ඇත්තට ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරන්න

සිද්ධ වෙනවා. ආරක්ෂාව නැහැ. ඒ මදිවට ජනතාවගේ ප්‍රශ්නවලට -

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

කොළඹින් ගෙනාවේ ඒ ලොරිය.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

පැහැදිලි වුණේ නැහැ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

කොළඹින් ගෙනාවේ ඒ ලොරිය.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

කොළඹ ලොරියක් නොවෙයි. බේරුවල ලොරිය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගහපු එක්කෙනා අහුවෙලා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමන්ලා කන්න දෙන්නේ නැති නිසා අපි හරි කන්න දෙන්න ඕනෑ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

බේරුවල ලොරිය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තොප්පිය දා ගත්තා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අන්න බළලා මල්ලෙන් එළියට පැන්නා. ඔයගොල්ලන්ට මනුස්සකම නැති වුණාට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වාහනේ ජාතකේ මොකටද ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඔබතුමාගේ ආසනයේ ඔබතුමාගේ ගමෙන් අරගෙන යනකොට ගහන්නේ. පාර හරස් කරලා ගහන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

නැගෙනහිරින්, කොළඹින් මැරයෝ ගෙනාවේ ඒකද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

පුහුල් හොරා කරෙන් දැනෙනවා වාගේ ගහපු අයට දැනෙනවා. පුහුල් හොරා කරෙන් දැනෙනවා වාගේ ගහපු අය අහුවෙන්නේ. මුස්ලිම් ජනතාව තමන්ගේ දරුවෝ දෙන්නාගේ බොඩිය අරන් යන වාහනයට කුඩු පට්ටම් වනතුරු ගහනවා. ගනේගම හන්දියේ තියාගෙන. මෙහෙමද මේ රටේ සාමය?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාදය -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, මේවා වැරැදියි. අපි ඉදිරියේ වෙන දේවල් මේවා. මගේ ප්‍රශ්නයක් තිබෙනවා. බස්නාහිර පළාත් සභාවෙන් නිමල් ලන්සා ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශයෙන් 2013 වසරට larger scale breeder farm එක හැටියට බාර ෆාම් ලංකා ලිමිටඩ්. එළුවන් 600 යි.

[ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්]

අග්නිදිග ආසියාවේම එහෙම එළුවෝ ජාතියක් නැහැ, ගරු සභාපතිතුමනි. ඕස්ට්‍රේලියාවේ ඉන්නවා. මැලේසියාවේ ඉන්නවා. එක එළුවෙක්ගේ වටිනාකම එක් ලක්ෂ පනස් දහසකට වැඩියි. ඒ එළුවෝ ලංකාවට ගේන්න Air Cargo කළේ ලක්ෂ 68 ක් වියදම් කරලා. ජාතියේ සම්පත දියුණු කරන්න අපි ගෙනාවේ එහෙමයි. අද මේ වනතුරු ඒ ගොවිපලට මට යන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්න දෙන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අවස්ථාවක් ලැබුණේ නැහැ. මම අයිතිය දරන මගේ ෆාම් එකට ආරක්ෂාවක් නැහැ. අද වනතුරු, මේ විනාඩිය වනකන් ෆාම් එකට යන්න මට අවස්ථාවක් නැහැ. එළුවන් 600 ක්ම මරලා. එළුවෝත් මුස්ලිම්ද කියලා මට අහන්න වෙනවා. එළුවන්ගේ කකුල් හතර කපලා එළුවන් මරනවා. එළුවන්ගේ බඩට පිහියෙන් ඇණලා එළුවෝ මරපු ඡායාරූප මම ඉදිරිපත් කරන්නම් ඕනෑ නම් මේ සභාවට. මේවද මේ රටේ සංවර්ධනය? අපි කනගාටු වෙනවා. අපට ඡන්දය දීලා අපව ජයග්‍රහණය කරන්නේ, බේරුවල බෞද්ධ ජනතාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කාලයක් දෙන්න බැහැ. ඔබතුමාට 36(1) යටතේ වෙනත් ප්‍රශ්න කථා කරන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

බෞද්ධ ජනතාවට දොස් කියනවා නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්න හැටියට ගණන් ගන්නේ. පැහැදිලි කිරීමක් කරන්න බැහැ. දීර්ඝ වශයෙන් කථා පවත්වන්න දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

බෞද්ධ ජනතාවට අපි ගරු කරනවා සභාපතිතුමනි. නමුත් එක්තරා සංවිධානාත්මක කණ්ඩායමකට මේ රටේ බලය පාවිච්චි කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දීර්ඝ වශයෙන් ඔබතුමාට කථා කරන්න දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇමැතිතුමා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා කියනවා දිසාපතිතුමාගේ සාකච්ඡාවේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට ඔබතුමාට කාලය දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාට 36(1) කියලා අවසර දෙන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මට වුණු ප්‍රශ්නයක් ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. 36(1) යටතේ ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

දිසාපති කාර්යාලයේදී උදය ගම්මන්පිල ඇමැතිතුමා කියනවා, මේ ප්‍රශ්නයට මුල් වුණු ඒ අයව නිදහස් කරලා දෙන්න. ප්‍රශ්නය නිරාකරණය වෙනවා කියලා. මම අහනවා, ඥානසාර හාමුදුරුවෝද මේ රටේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඥානසාර හාමුදුරුවන්ටද මේ රටේ අයිතිය තිබෙන්නේ. කනගාටුවෙන් වුණත් මට අහන්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මේවා කනගාටුවෙන් හරි කියන්න වෙනවා. මෙතුමා කියනවා, උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා කියනවා,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න. 36(1) කියලා ඔබතුමාට සභාවේ කථා කරන්න දෙන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

සියලුම ජනතාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා මූලාසනයට ගරු කරලා වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

සිංහල ජනතාව වෙනුවෙනුත් මම කථා කරනවා. දෙමළ ජනතාව වෙනුවෙනුත් කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මුස්ලිම් ජනතාව ගැන පමණක් නොවෙයි මම කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) කියලා පැහැදිලි කිරීම් කරනවා නේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මේවා ගැන කථා කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

එහෙම අසාධාරණයක් වෙන්න දෙන්නේ නැහැ. වාඩි වෙන්න ඕනෑ නැහැ. මේ සභාව තියන්නේ කථා කරන්න. මහජන නියෝජිතයන් හැටියට සිංහල ජනතාව අපට ඡන්ද දීලා එව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා 36(1) කියලා අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා. කරුණාකර වාඩි වෙන්න ඔබතුමා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, වාඩි වෙන්නම් කියන දේ අහලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා මූලාසනයට ගරු කරන්න. නවක මන්ත්‍රීවරයෙක්.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අපට ආරක්ෂාව දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ 36(1) රීතිය යටතේ ඔබතුමන්ලා නොයෙක් ප්‍රකාශ කරනවා. එහෙම කරන්න එපා. 36(1) යටතේ මන්ත්‍රීවරුන්ගේ භාෂණ නිදහස මට දෙන්න පුළුවන්. මේ සභාවේදී වෙන වල්පල් ඔක්කෝම කථා කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ වල්පල් නොවෙයි කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එළුවෝ මරලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වෙන්න පුළුවන්. එතුමාගේ එළුවෝ මරන්න ඇති.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මේවා වරප්‍රසාදයට අදාළ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ඒක අපට අදාළ නැහැ. මට ඒවාට ඉඩ දෙන්න බැහැ. සංවිධායකතුමා ඒවාට ඉඩ දෙන්න බැහැ. ඔබතුමන්ලා මේ 36(1) යටතේ ඔක්කෝම වල්පල් කථා කරනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මගේ වාහනයට නේ ගහන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේවා කියන කොට ඔබතුමන්ලාට අමාරුයිද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමන්ලා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මන්ත්‍රීවරයෙක් හැටියට මහජනතාවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකර වාඩි වෙන්න. ආයෙත් නැඟිට්ටා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මන්ත්‍රී වරප්‍රසාද ඇයි නැත්තේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රී වරප්‍රසාද කියලා මට පෞද්ගලික ව්‍යාපාර නවත්වන්න බැහැ. පෞද්ගලික ව්‍යාපාරවලට.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ඒක ව්‍යාපාරික වරප්‍රසාදයක්. මන්ත්‍රී වරප්‍රසාදවලට අයිති නැහැ. එළුවෝ අයිති නැහැ, මන්ත්‍රී ධුරයට.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වාහනයට ගහලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

වාහනය හරී. එළුවන්ට වුණු හානිය මන්ත්‍රී වරප්‍රසාදයක් නොවෙයි. පළාත් සභා මන්ත්‍රීවරයෙකු තම කටයුතු කරගෙන යෑමට - එළුවෝ ඇති කිරීම මන්ත්‍රී ධූරයේ කටයුත්තක් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා, කළුතර දිස්ත්‍රික්කයේ පවත්නා වර්තමාන තත්ත්වය පිළිබඳව ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මම ඉතාම සිත් වේදනාවෙන් මේ කථාව පටන් ගන්නේ. මම හොඳ සිංහලයෙක්. හොඳ බෞද්ධයෙක්. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානයට ඡන්ද අරගෙන තේරී පත් වුණු එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයා. තමුන්නාන්සේලාට ඇත්තම තත්ත්වය මම කියනවා. කළුතර දිස්ත්‍රික්කය අනාථයි. කළුතර දිස්ත්‍රික්කයේ පොලිස්පතිතුමා ඊයේ කච්චේරියේදී ස්තූති කළා, විශේෂ කාර්ය බලකායටත්, පොලීසියටත් මේ තත්ත්වය සමනයට පත් කළා කියලා. තනිකර අමූලික බොරු. ඊයේ රාත්‍රියේ වැලිපැන්න නගරයේ සියලුම කඩ සාප්පු, සිංහලයන්ගේ ඒවත්, මුස්ලිම්වරුන්ගේ ඒවාත් සියලුම කඩ සාප්පු විනාශ වුණා. තමුන්නාන්සේලාට ගිහිල්ලා බලන්න වටිනවා. එය අපේ වගකීම. මිනිස්සු අනාථ වෙලා. මිනිස්සුන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. සියලුම දෙනා ගෙවල්වල ඉන්නේ. මේකයි ආරක්ෂක තත්ත්වය. මම මේ තත්ත්වය පිළිබඳව පොලීසිය දැනුවත් කළා. මගේ ව්‍යාපාර රාශියක් තිබෙනවා. මගේ ළඟ වීඩියෝ ක්ලිප්ස් තිබෙනවා. මගේ ළඟ කඩවලට ගහපු රූප රාමු ඔක්කෝම තිබෙනවා. ඒවා මම පොලීසියට දෙන්න හැදුවට පොලීසියට කිසිම උනන්දුවක් නැහැ, ඒවා ලබා ගන්න. නිදැල්ලේ මැරයෝ හැසිරෙනවා. දේශපාලන අධිකාරිය නිදි. තමුන්නාන්සේලාට මම කියන්නේ මේ ඇත්ත. එදා සිද්ධිය වුණු අවස්ථාවේ මම දර්ගා නගරයේ සිටියා. දර්ගා නගරයේ මගේ ව්‍යාපාර තිබෙනවා. මුස්ලිම් සහෝදරවරු, සිංහල සහෝදරවරු කියලා මගේ ළඟ කිසි වෙනසක් නැහැ. දැනුත් නැහැ. භය නැතිව දර්ගා නගරයේ ගිය එකම දේශපාලකයා මමයි. 20,000 කට ආසන්න සංඛ්‍යාවක් සිටියා. ඉල්ලුවේ එකම දෙයයි. සාමය ඇති කරලා දෙන්නය කියලා විතරයි ඉල්ලුවේ. ඒ අවස්ථාව වන විට බොදුබල සේනාව ලොකු රැස්වීමක් අලුත්ගම නගරයේ. මේ ඇත්ත කියන්නේ. මේ ඇත්ත කීම තුළින් මට මගේ ජීවිතය නැති වෙන්න පුළුවන්. ව්‍යාපාර නැති වෙන්න පුළුවන්. දේශපාලනය නැති වෙන්න පුළුවන්. නමුත් මම ඇත්ත කියනවා. බොදුබල සේනාව පිටපත් වෙලා විනාඩි 05 ක් යනකොටම මුළු දර්ගා නගරයම එක යුධ පිටියක්. මෙහෙම වෙන්න දෙන්න බැහැ. මේක නවත්වන්න කටයුතු කරන්න. අපේ පන්සල්වල හාමුදුරුවරු ඉන්නවා. මම වගකීමෙන් කියනවා. කන්ද විහාර පන්සලේ නායක හාමුදුරුවෝ ඇවිල්ලා එදා එක විනාඩි 05 ක් කිව්වා නම් සංසුන් වෙන්න කියලා, අදටත් මේ තත්ත්වය නැහැ. ගම්වල පන්සල්වල නායක හාමුදුරුවරු ඕනෑ තරම් ඉන්නවා. අලුතෙන් එක්කෙනෙක් ආනයනය කරලා, අලුතෙන් චරිතයක් බිහි කරලා, අලුතෙන් නායක කමක් දීලා රජයෙන් ආරක්ෂාව දීලා, STF එකෙන්, පොලීසියෙන්, තව මොනවද තියෙන සියලුම ආරක්ෂා සංවිධාන තර කරලා ඕනෑම මුන්ධ, එහෙම නැත්නම් මහා භයානක ප්‍රකාශ කරන්න ඒ මනුස්සයාට අවස්ථාව දීලා තිබෙනවා. මම දන්නවා. අද වන විට මට ලැබිලා තිබෙන තොරතුරු අනුව බදුල්ලට යනවා. මාතලේට යනවා. හනුමා වාගේ ගිය ගිය තැන මේ යකා ගිනි තියෙනවා. ඒ නිසා කරුණාකරලා මේ වචන වැරදි වෙන්න එපා. මේ රට නැති වෙන්න යන්නේ. මම දකිනවා. වගකීමෙන් කියනවා. LTTE එකේ ප්‍රභාකරන් කළාට වඩා, ඊට වඩා දැඩි හානියක් මේ රටට බොදු බල සේනාව කරනවා. කරුණාකරලා මේක තහනම් කරන්න. මේක පක්ෂ පාට භේදයෙන් හිතන්න එපා. මේක තමයි මේ රටට යන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේලාට කියනවා. මේ වැදගත් මන්ත්‍රීවරු. අපට මේවා කියන්න, මේ විධියට දේශපාලනඥයෙකුට කථා කරන්න මෙවැනි අවස්ථාවක් එන්නේ නැහැ. මේක කථා කළොත් කොයි අතට යයි ද දන්නේ නැහැ. මේකයි ඇත්ත තත්ත්වය.

අද අපි මොකද කරන්නේ? මම තමුන්සේලාගෙන් අහනවා. අද ව්‍යාපාර නැති වෙද්දී මුස්ලිම් ජනතාව කොහෙද යන්නේ? අද ඒ මිනිස්සුන්ව අපි කොහෙටද පළවා හරින්නේ? ඊයේ රෑ අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ - මම වැලිපැන්න නගරයේ සිටියා. මමත් හරි

අමාරුවෙන් ජීවිතේ බේරගත්තේ. දෙමළ මනුස්සයෙකුව කපලා එවලේම මැරුවා. සිංහල මනුස්සයා දැන් පණ අදිනවා. ගෙවල් දොරවල් ගිනිබත් කළා. මම කියනවා ඇත්ත. සිංහල ජනතාව කියලා බොරු කියලා ඇවිල්ලා අර වැලිපැන්න නගරයේ ඉන්න රිම්සාන් සහෝදරයාගේ ගෙදර ඊයේ පාට් දාලා, රු.3900/- යි බිල. බිල මාගේ ළඟ තිබෙනවා. ඒ කරපු එවුන්ම ඊ ගිහිල්ලා ඔහුගේ ගේ ගිනි තිබ්බා. ඔහුගේ වාහන ටික ගෙනවා. බයිසිකල් කරේ තියාගෙන ගියේ. පොලීසියේ ඉන්නේ දහ දෙනයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමනි කරුණාකරලා මේ පොලීසිය, මේ STF එක, මේ හමුදාව අපට සුමාන දෙකක්වත් ඒ පැත්තට එවන්න. නැත්නම් මේ කථා කරන අපෙත් ජීවිත ඔක්කෝම අනතුරේ. මේකයි ඇත්ත කථාව. මේ දේ වෙන්න දෙන්න එපා. බොදුබල සේනාව කියන එක මම දකිනවා. මම නැවත වරක් කියනවා. අපි දැක්කා තමුන්නාන්සේලාගේ ජාත්‍යන්තර යෝජනාවක් තිබෙනවා. ජාත්‍යන්තර යෝජනා ගැන අපට කථා කරන්න අයිතියක්වත්, අපට ගන්න පුළුවන් තීරණයක්වත් මේ සභාවේ නැහැ. අපට පුළුවන් අපේ මේ දිස්ත්‍රික්කයට, අපේ බස්නාහිර පළාතට අපට ඇහට දැනෙන දෙයක් කරන්න. අපට ඇහට දැනෙන තීරණයක් ගන්න. එහෙමනම් තමුන්නාන්සේලාට මම කියනවා. මම යෝජනා කරනවා. කරුණාකරලා බොදුබල සේනාව බස්නාහිර පළාතේ හතර මායිමේ එවන්න එපා. එපමණයි මම ප්‍රකාශ කරන්නේ. තමුන්නාන්සේලාට බොහොම ස්තුතියි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, අලුත්ගම ප්‍රදේශයේ ඇති වූ සිද්ධිය සම්බන්ධයෙන් බොහෝ මන්ත්‍රීවරු කථා බහ කළා. පසුගිය 12 වැනිදා ඇති වුණු සිද්ධියක් පදනම් කරගෙන තමයි පොසොන් පෝය දවසේ මේ ගැටුම දිගින් දිගටම මතු වෙලා ආවේ. කවර ප්‍රදේශයක හෝ කවර ආගමකට අයත් පූජ්‍ය, පූජක පක්ෂයේ කෙනෙකුට පහර දීමක් සිදු වෙලා තිබෙනවා නම්, අපි පක්ෂ භේදයකින් තොරව මේ රටේ හැම දෙනාම ඒක හෙළා දකිනවා. ඒ පහර දීපු අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. දඬුවම් කරන්න ඕනෑ. හැබැයි, ඒ සිදුවීම පාදක කරගෙන, ඒ සිදුවීමෙන් පස්සේ ආණ්ඩුවේ හැසිරීම විසින් තමයි අද මේ සිංහල, මුස්ලිම් ජනතාව මරාගන්න තත්ත්වයට පත් වුණේ. හතර දෙනෙකුගේ ජීවිත නැති වෙලා තිබෙනවා. හතර දෙනෙක් කියන කොට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, නැහැ දෙන්නයි කියලා. මුස්ලිම් ජාතිකයෝ තුන්දෙනෙකුයි, දෙමළ තරුණයෙකුයි ඝාතනය කරලා තිබෙන්නේ. තව හැට හත්තෑ ගණනක වැඩි ප්‍රමාණයක් රෝහල් ගත කරලා. කෝටි ගණන් දේපළ විනාශ කරලා. ව්‍යාපාරික ස්ථානවලට පහර දීලා. වාහන ගිනි තියලා. දැන් මේක සුළුවෙන් තකන්න හදනවා. මේ විනාශය වළක්වා ගන්න තිබුණා. ජාතිවාදය, ආගම් වාදය, ජනතාව කුපිත කරවන, ප්‍රකෝප කරවන රැස්වීම් ආණ්ඩුවට නතර කරන්න තිබුණා. පෙළපාලි නතර කරන්න තිබුණා. හැබැයි, ඒවා කළේ නැහැ. ඒවාට අවසර දුන්නා. බ්‍රහස්පතින්දා සිට ඉරිදා වනතුරු මේක සංවිධානය කරන්න ආණ්ඩුව ඉඩ දීලා බලාගෙන සිටියා. අපි කවුරුත් මේ ජාතිවාදය අනුමත කරන්නේ නැහැ. අවුරුදු 30 ක් යුද්ධයෙන් බැට කාපු රටක්. අවුරුදු 50 ක් තිස්සේ බෙදුම්වාදය, ජාතිවාදය ක්‍රියාත්මක කරලා 83 කළු ජූලියෙන් ඒක යුද්ධයක් බවට පරිවර්තනය වුණා. ඒ කටුක අත්දැකීම අපට තිබෙනවා. ලබන මාසයට කළු ජූලියට අවුරුදු 31 යි. මේ ඇති කළේ, 2014 කළු ජූනිය. මතක තියා ගන්න. තමුන්නාන්සේලා කළු ජූනියක් ඇති කළේ. අර අහිංසක ජනතාව අනාථ කරලා, අලුත්ගමට, බේරුවලට, දර්ගා ටවුන් එකට යනකොට දහස් ගණනක් ජනතාව අනාථ වෙලා තිබෙන්නේ. අර මෙතුමන්ලා කියපු එක හරි. කෑම ගෙන ගිය ලොරියට ගැහුවේ. ලොරිය කොළඹින්ද ආවේ කොහෙන්ද ආවේ කියන එක වැඩක් නැහැ. බොරු කට කථා පතුරුවලා, ජනතාව ප්‍රකෝප කරවලා තමයි ගැටුම් හැදුවේ.

මේක වළක්වන්න ආණ්ඩුවේ බොහෝ දේශපාලඥයෝ කටයුතු කළා. හැබැයි, ඒ අය අසමත් වුණා. මම ආණ්ඩුකාරතුමාට ස්තුතිවන්ත වෙනවා. ආණ්ඩුකාරතුමා සහ එතුමාගේ කාර්යමණ්ඩලය මේක වළක්වන්න මැදිහත් වුණා. උපරිමයෙන් කටයුතු කරන්න උත්සාහ කළා. නමුත් මේක තිබුණේ එතුමාගේ සීමාවෙන් එහා. අපි අහන්නේ, හකීම් මහත්මයා දැන් ගිහිල්ලා ඇඬුවට දෙඩුවට වැඩක් නැහැ මේ රටේ. අධිකරණ ඇමැති. පඹයෙක්ද ඉන්නේ. මේක නතර කරන්න බැරිකමද තිබුණේ. රැස්වීම නතර කරන්න තිබුණා. එහෙම කළේ නැහැ. ඇයි? තනිකර පසුගිය අවුරුදු 1 1/2 ක් තිස්සේ මේ රටේ ජාතිවාදය වැපිරෙව්වා. ආගම් වාදය වැපිරෙව්වා. මේකට වගකියන්න ඕනෑ වෙන කවුරුත් නොවෙයි. මම දැක්කා ජනාධිපතිතුමා කියනවා, බොලිවියාවේ ගිහිල්ලා ට්විටර් පණිවිඩයක් එවලා

මේකට සම්බන්ධ අය වහාම අත්අඩංගුවට අරන් නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. විහිළුව තමයි ට්විටර් එකෙන් මැසේජ් එක එවලා ඒක මාධ්‍ය නිවේදනයක් හැටියට මාධ්‍යයට නිකුත් කරනවා. ඕකට මාධ්‍ය නිවේදනයක් දැම්මා නම් හරි නේ? ට්විටර් එකෙන් පණිවිඩේ එවන්නේ නැතිව. මේකට වගකියන්න ඕනෑ කවුද? වෙන කවුරුත් නොවෙයි. මේකට වගකියන්න ඕනෑ කෙනා ඉන්නේ අරලිය ගහ මන්දිරයේ. අපේ රටේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ තමයි මේ සිද්ධියට වගකියන්න ඕනෑ. වෙන කවුරුත් නොවෙයි. ඔහු තමයි මේකට වගකියන්න ඕනෑ. ඔහු තමයි මේ අන්තවාදී, ජාතිවාදී කණ්ඩායම්වලට ඔක්සිජන් දෙන්නේ. ඔහු තමයි මේවා පෝෂණය කරන්නේ. ඒ නිසා තමයි පොලීසිය, STF එක කොපමණ එව්වත් වැඩක් නැහැ. ඇයි? අණ ක්‍රියාත්මක කරන්න අණ දෙන්නේ නැහැ. අණ ක්‍රියාත්මක කරන්න භයයි. ඒ අය දන්නවා උඩින් ඉන්න ලොක්කා කවුද කියලා. නැත්නම් කොහොමද මෙච්චර හයියක් මේ වාගේ බල කල්ලිවලට එන්නේ, මිනිස්සු මරන්න. ව්‍යාපාරික ස්ථානවලට පහර දෙන්න. තමුන්නාන්සේලා අර අලුත්ගම නගරයේදී ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවෝ කරපු කථාව අහන්න. ඒකේ මොකක්ද කියන්නේ. කඩ ගිනි තියන්න කියන්නේ. අපි ජාතිවාදී, ආගම්වාදී කියලා කියන්නේ. එහෙම සංවිධාන මේ රටේ ඉන්න පුළුවන්ද? ව්‍යාපාරික ස්ථානවලට අබ සරණයි කියලා කියන්නේ.

ගරු මහ ඇමැතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඇමැතිවරු බොහෝ දෙනෙක් මේක අනුමත කරන්නේ නැහැ. හැබැයි මතක තියා ගන්න. මේ සභාවෙත් හනුමන්තලා එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා. මේක වැඩි කරන්න, එහේ ගිහිල්ලා පෙට්‍රල් වක්කරපු බෙරුවලින් ආපු හනුමන්තලා ඉන්නවා. මේ සංවිධානය පවත්වාගෙන යන්න මතවාදීව හරි උදව් කරපු හනුමන්තලා මේක ඇතුළේ ඉන්නවා. ඒ නිසා කරුණාකරලා කියන්නේ. ඡන්ද ගොඩ වෙනුවෙන් - මතක තියා ගන්න. බස්නාහිර පළාත් සභාවෙන් පඩි ගන්න, බස්නාහිර පළාත් සභාවෙන් පෙට්‍රල් ගහගන්න, බස්නාහිර පළාත් සභාවේ වාහනයකින් ගිහිල්ලා ජනතාව කුලප්පු කරවන්න, අර අලුත්ගම රැස්වීමේ කවි කිව්වා. ඔන්න නාඩා එකේ සභාපති. පැරදිච්ච දේශපාලඥයෝ. ඡන්දෙන් පැරදුණා. ඡන්දෙන් පැරදුණාට පස්සේ ජාතිවාදය වපුරනවා. මොකක්ද ගරු සභාපතිතුමනි, මේ වැඩේ? අපි ඉල්ලන්නේ මේ ජාතිවාදයට ඉඩ දෙන්න එපා. මේ ආගම්වාදයට ඉඩ දෙන්න එපා. මේක වහාම නතර කරන්න ඕනෑ. මේක මෙතැනින් නතර කරන්න ඕනෑ. අපි දකිනවා, මේක දැන් පැතිරිලා තිබෙන්නේ අගලවත්තට, වැලිපැන්නට, මතුගමට, බෝපිටියට ගිහිල්ලා බෝපිටියෙත් ෆාම් එකක් විනාශ කළා. බඳුල්ලට ගිහිල්ලා තිබෙන්නේ. දෙහිවලට ගිහිල්ලා තිබෙන්නේ. තවත් මේකට ඉඩ දෙන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර හෙළ උරුමයේ එක්කෙනා නේද?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ආණ්ඩුවේ මැති ඇමැතිවරු මේකට උදව් කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

අපි කියන්නේ, අපි හැමදෙනාම එකතු වෙලා පක්ෂ භේදයෙන් තොරව, ජාතික සමඟිය හදන්න, මේ ජාතිවාදය පරදවන්න, ආගමික ගැටුම් නවත්වන්න වැඩ කරමු. ඒ වෙනුවෙන් එකතු වෙන්න. නිකන් පටු විධියට ඡන්ද ගොඩ බලාගෙන මේ වාගේ දේවල්වලට මැදිහත් වෙන්න එපා කියලා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මම කථා කරන්න හිටපු මාතෘකාව පොඩ්ඩක් වෙනස් කරන්න සිදු වෙනවා. කොහොම වුණත් අන්තවාදීව, ජාතිවාදී විධියට කථා කරන්න මම උත්සාහ ගන්නේ නැහැ. මොකද, ඊයේ පෙරෙයිදා මේ සිද්ධිය ඇති වුණු වේලාවේ විතරක් ගිය මන්ත්‍රීවරු වාගේ නොවෙයි. අපි මුළු ජීවිත කාලයම, පෙකනි වැල කැපුවෙත් බේරුවල. ඒක නිසා මේකේ සත්‍ය සිද්ධිය අපි දන්නවා. ඒක නිසා මේ තත්ත්වය එක්ක අහිංසක සිංහල, මුස්ලිම් සියලුම ජනතාව අසරණ වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා එක එක්කෙනා තම තමන්ගේ දේශපාලන පටු ආකල්ප වාසි තකාගෙන, ඒ වගේම ජාතීන් නියෝජනය කරගෙන කථා කරලා මේ ප්‍රශ්නය අපට විසඳන්න බැහැ. ඒ නිසා මේ සිද්ධිය ඇති වුණු මූලික හේතු තුනක් තිබෙනවා.

[ගරු පියල් නිශාන්ත]

ඒ තුනම ආරම්භ වන්නේ මෙන්න මේ විධියට. මුල්ම සිද්ධිය තමයි අලුත්ගම නගරයේ මුස්ලිම් වෙළඳසැලකදී සිංහල දරුවෙක්ව අපයෝජනයට ලක් කරන්න ලැහැස්ති වීම. දෙවැනි කාරණය තමයි පොසොන් පෝය දිනයේදී අපේ කුරුඳුවත්ත විහාරයේ සමිත නායක ස්වාමීන් වහන්සේට පහර දීම. තුන්වැනි කාරණය තමයි අලුත්ගම නගරයේ පැවැති පොදු රැස්වීම අවසන් වී යන වාහනවලට ගල් මුල් ප්‍රහාරයක් එල්ල කිරීම. මෙන්න මේ සිද්ධි තුන අදාළ කරගෙන තමයි මේ කටයුත්ත ආරම්භ වුණේ. එතැනදී මේ කටයුත්තේ ආරම්භක - මම මේ එක ජාතියකට චෝදනා කරනවා නොවෙයි. ජාතීන්ට චෝදනා කරන්න බැහැ. මුස්ලිම් සමහර අන්තවාදීන් කිහිප දෙනෙක් කරපු වැඩක් තමයි මේ සිද්ධි තුනේම මූලාරම්භය.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු මන්ත්‍රීතුමා, වාහනවලින් ආවේ නැහැ. පයින් පෙළපාලි ආවේ. බොරු කියන්න එපා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මගේ කථාවෙන් පස්සේ ඔබතුමා කාලය ගන්න කෝ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වීඩියෝ ක්ලිප් එක පෙන්වන්නද?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

බොරු කියන්න එපා. සභාව නොමඟ අරින්න එපා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේගොල්ලෝ මේ බොරුවට කථා කළාට වැඩක් නැහැ. බොරුවට නිකන් දඟලලා කථා කළාට වැඩක් නැහැ. සිද්ධිය අපි දන්නවා.

**ගරු මන්ත්‍රීවරියක්**
An hon. Member

පයින් ආපු අයට හරි ගැහුවා නේ?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

පයින් පෙළපාලි ආවේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේ රටේ 1915 දී තමයි සිංහල, මුස්ලිම් මුල් ගැටුම ඇති වුණේ. ඒත් අලුත්ගම ප්‍රදේශයේදී. ඒ අලුත්ගම ප්‍රදේශයේදී පිණ්ඩපාත වැඩපු නායක ස්වාමීන් වහන්සේ නමකට පහර දීලා. එතැනින් ආරම්භ වෙලා අද වන කොට ජාත්‍යන්තරයේ තිබෙන අන්තවාදය හා මූලධර්මවාදය මේ රට කෙමෙන් කෙමෙන් ගිලගෙන යන මොහොතක තමයි - අද මේ වන විට මේ කියන මරණ සංඛ්‍යාව කොහොමද කියන එක හරියට දන්නේ නැහැ. නමුත් දැනට වාර්තා වෙලා තිබෙන මරණ සංඛ්‍යාව, තුවාල ලැබූ සංඛ්‍යාව, රෝහල්වල ඉන්න සංඛ්‍යාව සහ නිවාස හා කඩ විනාශ වෙලා තිබෙන සංඛ්‍යාව අපි මේ වන විට අරගෙන තිබෙන්නේ. ජනතාව කුලප්පු කරන්න සමහර අවස්ථාවලදී මේ අය සමහර දේවල් කථා කරනවා.

ඊළඟ කාරණය තමයි විශේෂයෙන් මෙච්චර මේ ජාතීන් පිළිබඳව හරි උනන්දුවෙන් කථා කරන මේ සමහර මහජන නියෝජිතයෝ ඊයේ තිබුණු රැස්වීමට සම්බන්ධ වුණා නම් මම හිතන්නේ, මීට වඩා හාත්පසින්ම වෙනස්. ඊයේ අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු රැස්වීමේදී බැසිල් රාජපක්ෂ ඇමැතිතුමා, ෆවුසි ඇමැතිතුමා, ඊළඟට අපේ ඉෆ්තිකාර් පළාත් සභා මන්ත්‍රීතුමා, මුස්ලිම් කොංග්‍රසයේ අස්ලාම් මන්ත්‍රීතුමා, ඊළඟට අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා, රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා මේ විධියට, ඩලස් අළහප්පෙරුම, රෝහිත අබේගුණවර්ධන, කුමාර වෙල්ගම යන ගරු ඇමැතිවරුන් මේ විධියට දේශපාලන නායකයින් පක්ෂ භේදයකින් තොරව සම්බන්ධ වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඊයේ රෑ ගැහුවා නේ?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඊළඟට අපේ මුස්ලිම් පූජකතුමන්ලා, අපේ විහාරස්ථානවල ආගමික නායකයින් මේ සියල්ලන් සම්බන්ධ වුණා.

රාජ්‍ය නිලධාරීන් හැටියට විශේෂයෙන්ම පොලිස්පතිතුමා, දිසාපතිතුමා ඇතුළු මේ කණ්ඩායමත් සහභාගී වුණා. හැබැයි එතැනදී මේ කියන කථා මොනවක්වත් නැත. ඔය කියන නායකයෝ එතැන සිටියා. දැන් මේ කථා කරන්නේ මාධ්‍යයට. මේ කථා කරන්නේ ජාත්‍යන්තරයට. ඒක ගැන අපට ගැටලුවක් නැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අපි ජාත්‍යන්තරයට නොවෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාගේ ආණ්ඩුවද?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

හැබැයි එකක් මතක තියාගන්න. ඔය කථා කරපු සමහර මුස්ලිම් නායකවරු, ඔය අන්තවාදී විධියට කථා කරපු නායකවරු තමයි සිංහල ජනතාවගේ ඡන්දයෙන් ඇවිල්ලා, සිංහල බෞද්ධ ජනතාවගේ ඡන්දයෙන් ඇවිල්ලා මේ සෙල්ලම දාන්නේ. ඔය එක පැත්තක් අරගෙන කථා කරනවාට වඩා හොඳයි ඉතිහාසයේ -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අන්තවාදී ඔබතුමා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

70% ක් ඉන්න සිංහල ජනතාව තමයි බාකීර් මාකර් මහත්මයා පාර්ලිමේන්තු එව්වේ. සිංහල ජනතාව 70% ක් ඉන්න බේරුවල ආසනයෙන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බෞද්ධ ඡන්දවලටද කථා කරන්නේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ වාගේම ඉම්තියාස් බාකීර් මාකර් පාර්ලිමේන්තු එව්වේ මේ සිංහල ජනතාව. ඒ වාගේම අයි.ඒ. කාදර් මහත්මයාව පාර්ලිමේන්තු එව්වේ. මේ ඉෆ්තිකාර්ව. ඊළඟට අපේ -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, කවුරුත් සහයෝගය දෙන්න මේ කථාව කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

කවුරුත් අහන්න ඕනෑ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේ සියල්ලම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේක සිංහල ජාතියකට චෝදනා කරන්න එපා. මේක එක ජාතියක් අතට අරගෙන කථා කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ගැටුම්වලට යන්න එපා. ඔබතුමා නිශ්ශබ්ද වන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

අපි පැහැදිලිව දන්නවා. මේ සිද්ධිය ගැන ඔබ වාගේම මමත් කියනවා. මේ සිද්ධියේදී පොලීසිය හරියට ක්‍රියාත්මක වුණා නම් මේ අවසානාවන්ත සිද්ධිය සිදු වන්නේ නැහැ. මේ අවාසනාවන්ත සිද්ධිය කොහෙත්ම සිදු වන්නේ නැහැ, පොලීසියේ සමහර නිලධාරීන් අවශ්‍ය වේලාවේදී අවශ්‍ය කටයුතු කළා නම්. ඒක නිසා මෙතැනදී මම පැහැදිලිව කියනවා. දේශපාලන වශයෙන්, මේ කුහක දේශපාලනය කරලා අහිංසක සිංහල, මුස්ලිම් ජනතාව අමාරුවේ දාන්න

[ගරු පියල් නිශාන්ත]

එපා. අපි දන්නවා, සමහර අයියලා කියන කථා. ඔය දුර ඉඳලා කියන අයියලාගේ කථා. අපි තමයි මුස්ලිම් ජනතාවත් එක්ක එකට ඉඳගෙන හැම දෙයක්ම කරන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කාලය ඉවර නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය තිබෙනවා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

බොදු බලේ එකේ විතරක් නොවෙයි. හොඳට මතක තියාගන්න. බොදු බලේ විතරක් නොවෙයි. තහනම් කරනවා නම් අනික් ඒවත් තහනම් කරගන්න. බොදු බලයට විතරක් තහනමක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ කාලය තිබෙනවා. තව විනාඩි 03 ක් එතුමාට දෙනවා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

හැම එකකටම බොදු බලය දාන්න එපා. අහිංසක සිංහල මිනිස්සු වෙනුවෙනුත් නියෝජනය කරන්න කවුරු හරි ඉන්න ඕනෑ. ඒක මතක තියා ගන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මම අවසාන වශයෙන් කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට මට අයිතියක් තිබෙනවා ඔබතුමාගේ අවසරය සහිතව මේ සභාවේ කථා කරන මන්ත්‍රීවරයා මොනවද කියන්නේ කියලා දැනගන්න. මට අවශ්‍යයි ඒ මන්ත්‍රීවරයාගේ අදහසට ප්‍රතිචාර දක්වන්න. නමුත් මේ සභාවේ තිබෙන ඝෝෂාව නිසා ඒ මන්ත්‍රීවරයා මොනවාද කියන්නේ කියලා මට කිසිම දෙයක් ඇහුණේ නැහැ. ඒ නිසා ඒ මන්ත්‍රීවරයා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

Headphone එක දාගන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

නැහැ ගරු මන්ත්‍රීතුමා. මේ සභාවේ සභාපතිවරයා බැඳිලා ඉන්නවා මන්ත්‍රීවරයා කියන දේ - Headphone එක අපි හදලා තිබෙන්නේ භාෂා පරිවර්තන අවශ්‍යතාවයන් සඳහා. මේ සභාවේ නිශ්ශබ්දතාවය රැකීමේ අවශ්‍යතාවයක් මූලාසනයට තිබෙනවා. නැත්නම් මට Headphone භාවිතා කිරීම ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ඝෝෂාව නතර කර මට ඇහෙන්න සලස්වන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, එතුමාගේ ප්‍රකාශය අපි අනුමත කරනවා. ඒක එතුමා කිව්වේ දෙපැත්තටම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. දෙපැත්තටම. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි,

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

වෙලාව කීයද දැන්?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කාලය දෙන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ කාලය තිබෙනවා. ඔබතුමාට ඒක ප්‍රශ්නයක් නොවෙයි නේ? ගරු මන්ත්‍රීතුමා ඔබතුමා තව කථා කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, අපට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) යටතේ. ගරු සභාපතිතුමනි, අපේ විපක්ෂයේ අය කථා කරද්දී විනාඩි 03 න් ඔබතුමා හරියට නවත්වනවා. මෙතුමා විනාඩි 10 කට වැඩිය කථා කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි තුනෙන් නවත්වන්නේ නැහැ. ඊට වැඩිය කාලය දීලා තිබෙනවා. ඔබතුමා වැරැදි ප්‍රකාශ කරන්න එපා. මට සිද්ධ වෙනවා කාලය සීමා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැම පක්ෂයකටම තිබෙන්නේ විනාඩි 10 යි. ආණ්ඩු පක්ෂයට තිබෙන්නේ විනාඩි 10 යි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩි 20 ක් තිබෙනවා. ඔබතුමා තේරුම් ගන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මම ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ ආණ්ඩු පක්ෂයට විනාඩි 20 යි. විපක්ෂයට විනාඩි 10 ක් තිබෙනවා. විනාඩි 30 ක් තිබෙනවා. මම නිතරම ගරු මන්ත්‍රීවරු කථා කරන කාලය සීමා කරන්නේ නැහැ. විපක්ෂයේ අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විනාඩි 05 ක් කථා කළා. මම ඒත් එතුමාව සීමා කළේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා අනවශ්‍ය ප්‍රශ්න ඇති කරන්න එපා. මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කථා කළා. විනාඩි 03 යි තිබුණේ. විනාඩි 05 ක් එතුමා කථා කළා. ඇයි? මට එතුමාට අවස්ථාව දෙන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ කාලය තිබෙනවා. ඔබතුමා සභාවේ වැරැදි ප්‍රකාශ කරන්න එපා. දැන් සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම සමාව ඉල්ලනවා. මගෙන් මොනවා හරි වැරැදි වචනයක් හරි අපේ ප්‍රතිවිරුද්ධයේ මන්ත්‍රීවරුන්ට මගෙන් සිදු වුණා නම්. ඒක නිසා මම සමාව ඉල්ලනවා. මේක අපි හැල්ලුවට ලක් කරන්න ඕනෑ, දේශපාලන වශයෙන් වාසි ලබා ගන්න ඕනෑ අවස්ථාවක් නොවෙයි. ඒක හොඳට මතක තියාගන්න. සමහර මන්ත්‍රීවරු මේ සිද්ධිය වුණාට පස්සේ තමයි ඔතැනට ගියේ. ඒක නිසා මම පැහැදිලිවම දන්නවා, මොකක්ද වුණේ කියලා. අවසාන වතාවට මට කියන්න තිබෙන්නේ මෙන්න මේ කරුණු ටික. අවාසනාවක මහත මොකක්ද දන්නවාද?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

වැඩේ කරපු අය තමයි යන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඇත්තටම මේ තත්ත්වය දිගින් දිගටම යන්න ගියොත් මායිම් ගම්මානවල ඉන්න අපේ අහිංසක සිංහල, මුස්ලිම් ජනතාව තමයි අසරණ වෙන්නේ. කොළඹ ඉඳගෙන පුටු රත් කර කර ඔය සැප පහසුකම් විඳින මන්ත්‍රීවරු නොවෙයි දුක් විඳින්නේ. ඒ වාගේම මුස්ලිම්, සිංහල ලොකු ව්‍යාපාරිකයෝ නොවෙයි දුක් විඳින්නේ. අහිංසක සිංහල, මුස්ලිම් ජනතාව. ඒ නිසා මෙය ඉතාමත්ම බුද්ධිමත්ව බලන්න ඕනෑ වාගේම මේ අන්තවාදය සහ මූලධර්මවාදය රිංගලා මේ කරන විනාශය පිළිබඳව අපි හොඳ අවධානයෙන් ඉන්න ඕනෑ. රජයක් හැටියට අපි මේ කටයුත්තේදී විශේෂයෙන්ම මම සන්තෝෂ වෙනවා. අතිගරු ජනාධිපතිතුමා ක්ෂණිකව පියවර අරගෙන

[සභාවේ ඝෝෂා]

අගැමැතිතුමාව, ෆවුසි ඇමැතිතුමාව ඇතුළු සියලුදෙනාව යොමු කරලා අද මේ තත්ත්වයට හරි මෙය වළක්වා ගැනීමට හරි හැකියාව ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා.

ඊළඟ කාරණය තමයි මේ සමහර මුස්ලිම් මන්ත්‍රීතුමන්ලාට, මහජන නියෝජිතයින්ට අමතක වෙලා. එදා LTTE එක දිගින් දිගටම මුස්ලිම් ජනතාවට පහර දෙනකොට සිංහල අපේ හමුදාවේ කොල්ලොයි, ඊළඟට සිංහල නායකයිනුයි ඒ අහිංසක මුස්ලිම් ජනතාව බේරා ගත් එක අමතක වෙලා තිබෙනවා. එදා වෙළඳාම අල්ලා ගන්න පෘතුගීසීන් ඇවිල්ලා මේ මුස්ලිම් ජනතාව සමූල ඝාතනය කරන්න ලැහැස්ති වෙන කොට එදා හිටපු අපේ සෙනරත් රජතුමා මැදිහත් වෙලා තමයි මුස්ලිම් ජනතාව බේරා ගත්තේ. ඒ නිසා අද අපි වගකීමෙන් කියනවා. අතිගරු ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව, අපි මුස්ලිම් ජනතාව ආරක්ෂා කරනවා. අපි මුස්ලිම් ජනතාවට අවශ්‍ය කරන නිවැරදි තැන ලබා දෙනවා. ඒකට අවශ්‍ය කරන නිවැරදි නායකත්වය ලබා දෙන්නට අපේ ආණ්ඩුව තුළත්, ඒ වාගේම බුද්ධිමත්ව හිතන මුස්ලිම් නායකවරුත් ඉන්නවා. (බාධා කිරීම්) ෆවුසි අමාත්‍යතුමා, හකීම් අමාත්‍යතුමා වැනි හොඳ මුස්ලිම් ඇමතිවරු, මහජන නියෝජිතවරු ඉන්නවා. ඒ නිසා අපට මේ දෙකේ කොලේට වැටුණු දෙන්නෙක් තුන් දෙනෙක් එක්ක මේ කථාව කරලා වැඩක් නැහැ. ඒ නිසා අපි මුස්ලිම් ජනතාවගේ අයිතිය සහ සිංහල ජනතාවගේ අයිතිය වෙනුවෙන් මේ පළාත් සභාව තුළ හෙටත් කටයුතු කරන්න ලැහැස්තියි. ගරු මහ ඇමතිතුමා ඇතුළු අපේ පළාත් සභාවේ කණ්ඩායම ක්ෂණිකව ගත්ත ඒ ක්‍රියාමාර්ගයටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා, ඔබතුමාටත් අලුත්ගම මුස්ලිම් ප්‍රශ්නය සම්බන්ධයෙන් විනාඩි 07 ක කාලයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා මීට කලින් කිව්වා විපක්ෂයට විනාඩි 10 යි. ආණ්ඩු පක්ෂයට විනාඩි 20 යි කියලා. ඒ අනුව තව කොපමණ කාලයක් ඉතිරි වෙලා තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව විනාඩි 07 ක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

විනාඩි 7 ක්. ආණ්ඩු පක්ෂයට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රබර් ඔරලෝසුවක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. රබර් ඔරලෝසුවක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විනාඩි 15 ක් කථා කළා. 20 යි -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා තමන්ගේ අදහස් දැක්වීමේදී අපි ඉතා සාවධානව එතුමන්ලාට සවන් දුන්නා. මෙතැන්දී මම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් - මා කියන සෑම කාරණාවක්ම

නිර්දය ලෙස විවේචනය කරන්න ඔබතුමන්ලාට තිබෙන අයිතියට මම ගරු කරනවා. මා දක්වන අදහස ඔබතුමන්ලාට තේරෙන්න නම් ඔබතුමන්ලා නිහඬතාවය රකිමින් ඇසිය යුතුයි. මම ඔබතුමන්ලාට දක්වපු ගෞරවය මටත් දක්වාවි කියන එක බලාපොරොත්තු වෙමින් මා මේ කථාව ආරම්භ කරනවා.

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ මුලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනා මුස්ලිම් ජාතිකයන්ට පහර දීම, තුවාල වීම, මිය යාම ගැන කථා කළා. මුස්ලිම් ජනතාව වේවා, සිංහල ජනතාව වේවා, දෙමළ ජනතාව වේවා මිය යද්දී නැති වෙන්නේ එකම ප්‍රාණය. තුවාල වුණාම ගලන්නේ එකම රතු පාට ලේ. ඒ නිසා කාගේ ජීවිතය මුස්ලිම් ද, දෙමළ ද, සිංහල ද කියන එක නොවෙයි වැදගත්. කාගේ හරි ජීවිතයක් නැති කළා නම් ඒක වැරදියි. කාට හරි පහර දුන්නා නම් ඒක වැරදියි. කාගේ හරි දේපළක් හානි කළා නම් ඒක වැරදියි. කවුද? කළේ අනුව නොවෙයි. අපේ විනිශ්චය, තීරණය විය යුත්තේ මොකක්ද කළේ කියන එක අනුවයි. ඒ නිසා මෙතැන ජාති ආගම් භේදයෙන් තොරව අහිමි වුණු ජීවිත, තුවාල වුණු ජනතාව, විනාශ වුණු දේපළ පිළිබඳව අපේ සමස්ත පළාත් සභාවේ කනගාටුව පළ කළ යුතුයි. දුකට, ජාති ආගම් භේදයක් නැහැ ගරු සභාපතිතුමනි, මේ කථාව මොකක්ද? මෙකේ පසුබිම මොකක්ද? කියන එක ගැන පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා කියන්න උත්සාහ කළා. නමුත් මම හිතන්නේ, මේ සභාවේ ඒ කථාව ඇහෙන්න වාතාවරණයක් තිබුණේ නැහැ. ඊයේ උදේ කළුතර දිසා ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ට නියෝජ්‍ය පොලිස්පතිතුමා මේ විස්තරය කරද්දී, එතුමා කරපු විස්තරයට යම් යම් සංශෝධනයන් ඉදිරිපත් කරමින් දෙපාර්ශවය එකඟ වුණු කථාවක් තිබෙනවා, මොකක්ද වුණේ කියලා. අපි දන්නවා, මීට මාස දෙකකට කලින් බලංගොඩදී සාමණේර ස්වාමීන් වහන්සේ කෙනෙක්ව මුස්ලිම් ජාතිකයෙක් අතින් අතවරයට ලක් වුණා. අත්අඩංගුවට ගත්තා. සාමකාමීව බලංගොඩ නගරයේ උද්ඝෝෂණයක් තිබුණා. ඊට පස්සේ නීතිය ක්‍රියාත්මක වෙන්න ඉඩ දීලා හැමෝම නීතිය දිහා බලාගෙන හිටියා. ඊට පස්සේ අපේ පොසොන් පොහොය දිනයේ, මේ රටට භික්ෂූන් වහන්සේව හඳුන්වා දුන්න දිනයේ භික්ෂූන් වහන්සේ නමක් පහර දීමට ලක් වෙනවා. පෞද්ගලික ආරවුලක් කිව්වා. මේ පැත්තෙන් වාර්තා කරලා තිබෙන්නේ, තමන්ගේ බණකට වඩිද්දී මග අවහිර කළාය කියලා. පෞද්ගලික ආරවුල මොකක්ද කියලා පොලිස් ප්‍රකාශවල නම් සඳහන් වන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. අපි ඊයේ මේ ගැන සොයා බැලීමක යෙදුණා. කළුතර හිටිය අවස්ථාවේදී. මුස්ලිම් නායකයෝ, ප්‍රාදේශීය නායකයෝ අපි එකට මේ ගැන කථා කළා. ඊට පස්සේ වුණේ, මේ ස්වාමීන් වහන්සේට පහර දීමෙන් පස්සේ අලුත්ගම පොලීසියේ ලොකු කලබලයක් ඇති වුණා. ඊට හේතුව වෙලා තිබුණේ මීට කලින් - අපේ පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට සත් හැවිරිදි දරුවෙකුට ඒ ප්‍රදේශයේ මුස්ලිම් ව්‍යාපාරිකයෙකුගෙන් සිදු වුණු ලිංගික අතවරයක් සම්බන්ධයෙන් පොලීසිය නීතිය නිසියාකාරව ක්‍රියාත්මක කළේ නැතැයි, පොලීසිය පිළිබඳ විශ්වාසය බිඳ වැටීම නිසයි එතැන කලබලයක් ඇති වුණේ. අපි දන්නවා. බොදු බල සේනාවේ නොවෙයි, ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ස්වාමීන් වහන්සේලා ඊයේ කිව්වා. පළාතේ බෞද්ධයන්ගේ ලොකු නොසන්සුන්තාවයක් ඇති වුණා. ඒ නිසා මේ ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේලා තීරණය කළා -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒ නිසා ඒ කඩේ ගිනි තිබ්බා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාගේ කථාවේදී බාධා කළාද? ගරු මන්ත්‍රීතුමා ඔබතුමා නවක මන්ත්‍රීවරයෙක්. මම මේ පළාත් සභාවේ ඇමතිවරයෙක්. සංයමය තියාගන්න. ඔබතුමාට කියන්න තිබෙන දෙයක් විවාදයකදී කථා කරමු. මට බාධා කරන්න එපා. ඔබතුමාගේ කථාව ඔබතුමා කළා නේ? දැන් මගේ කථාව මට කරන්න දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එතුමාගේ එළුවෝ 600 ක් නැති වුණා නේ. ඒකයි තරහා ගියේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමාගේ එළුවෝ නැති වීමේ දුක මට තේරෙනවා ගරු මන්ත්‍රීතුමා. නමුත් එළුවාගේ කාර්ය ඔබතුමා කරන්න යන්න එපා. එළුවා බෑ කියපුදෙන්. ඔබතුමා කරන්න යන්න එපා ඒක. (බාධා කිරීම)

[ගරු උදය ප්‍රභාපත් ගම්මන්පිල - අමාත්‍යතුමා]

ගරු සභාපතිතුමනි, මේ කාරණයෙන් විතැන් කරන්න උත්සාහ - ගරු මන්ත්‍රීතුමා කුමන්ත්‍රණයක් මේක. ඔබතුමාත් කුමන්ත්‍රණයේ කොටස්කරුවෙක් - මොකක්ද මේ ප්‍රශ්නය කියලා හඳුනාගන්න අපි ඔක්කොම උත්සාහ කරන්න ඕනෑ. එළියේ ගිනි ගන්නවා. ඒ ගින්න නිවන්නේ කොහොමද කියලා. දුකක් තිබෙනවා නම් දුකට හේතුව සොයමු. කවුරු ගිනි තිබ්බත් ගින්න නිවන්න ඕනෑ කියන එක පිළිගන්නේ නැද්ද?

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මධුමාධව කවුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා, මේ සභාවේ සම්ප්‍රදායක් තිබෙනවා පෞද්ගලික පැහැදිලි කිරීම්වලට බාධා කිරීම් කරන්නේ නැහැ. මොකද, බොහොම සුළු කාලයක් තිබෙන්නේ. විනාඩි 04 යි. 05 යි. ඔබතුමන්ලාට එක එක ප්‍රකාශ කරන්න පුළුවන්. ඒ නිසා බාධා කිරීම් කරන්න එපා. ඒ අවස්ථාව ලබා දෙන්න එතුමාට. බාධා කිරීම් කරන්න එපා. ගරු අමාත්‍යතුමා කථා කරන්න. ඔබතුමන්ලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මා කියන දේ බොරු යැයි එතුමාට හිතෙන්න පුළුවන්. මුජිබුර් ගරු මන්ත්‍රීතුමා කිව්වේ බොරුයි කියලා මට හිතෙන්න පුළුවන්. මට මගේ බොරුව කියා ගන්න මේ සභාවේ අයිතියක් තිබෙනවා. ඒ අයිතිය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, ඒ අනුව ඇති වුණු නොසන්සුන්තාවය නිසා භික්ෂූන් වහන්සේලා තීරණය කරනවා බෞද්ධයන්ට කරුණු පැහැදිලි කරලා දෙන්න බොදු සමුළුවක් පවත්වන්න. ඒ භික්ෂූන් වහන්සේලා තීරණය කරනවා, බොදු බල සේනාව, සිහළ රාවය වැනි සංවිධානවලට ආරාධනා කරන්න. එය සංවිධානය කිරීම කරලා තිබුණේ, පූජ්‍ය හැඩිගල්ලේ විමලසාර හාමුදුරුවෝ කියන බේරුවල පන්සලක ස්වාමීන් වහන්සේ කෙනෙක්. ඔවුන්ගේ ආරාධනාවෙන් තමයි අනෙකුත් සංවිධාන රැස්වීමට පැමිණෙන්නේ.

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ ප්‍රශ්නවලට පමණක් නොවෙයි, ජාත්‍යන්තර ප්‍රශ්නවලදී පවා මුස්ලිම් ජනතාව කඩ වහලා, කළු කොඩි දාලා හර්තාල් කරනවා. සිකුරාදා දවසට කොළඹ නගරය මැද පෙළපාලි යනවා. අනිවාර්යයෙන්ම ඒ අයිතිය තිබිය යුතුයි. තමන්ගේ අදහස්, ප්‍රජාතන්ත්‍රවාදීව, සාමකාමීව ප්‍රකාශ කරන්න අයිතිය තිබිය යුතුයි. ඒක බාධා කරන අවස්ථාව ගැන කථා කළා. මම ඒකට එකඟ නැහැ. මම කවදාවත් ඒවාට සහාය දීලාත් නැහැ. ඒවා ආරක්ෂා කරලා කථා කරලත් නැහැ. ඒ නිසා මේ අයට තමන්ගේ අදහස ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳව අපි පිළිගත යුතුයි. ගරු සභාපතිතුමනි, -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) යටතේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ සභාවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) යටතේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා තමන්ගේ කථාව කරන අතරේ කිව්වා පළාත් සභාවේ වාහන, පළාත් සභාවේ ඉන්ධන, පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු මේ ව්‍යාපාරයට දායක වුණා කියලා. මන්ත්‍රීවරයෙක් විධියට මම කැමැතියි. මට අයිතියක් තිබෙනවා දැන ගන්න. මෙයට සහභාගී වුණු මන්ත්‍රීවරු කවුද කියලා. මේ ක්‍රියාදාමයට. මේ සභාවේ - (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ. නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ සභාවේ කියලා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාගේ ප්‍රශ්නය ඒකද? ඒ ගැන සොයලා බලන්නම් මම.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඇහුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නම් මම ඒ ගැන වරප්‍රසාද කමිටුවට යොමු කරලා, මම ඒ ගැන සොයලා බලන්නම්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ආ වෙනම ගේනවාද? එතකොට ඉස්සෙල්ලා සභාවේදී ඔබතුමා ඔහොම කළේ නැහැ. රේණුක පෙරේරා හිටපු මන්ත්‍රීතුමා වරප්‍රසාද කියලා අපේ ගැන කථා කරන කොට. දෙවිධියකට ක්‍රියාත්මක වෙන්නේ. ඩුවෙල් සිම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනම දෙයක්. මේක vi වන පළාත් සභාව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මධුමාධව?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පොඩි ඥානසාර කියන්නේ කාටද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ඒ සමුළුවට රැස්ව සිටි ජනතාව ප්‍රකෝප කිරීමක් සිදු වුණා නම් - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. බාධා කිරීම් කරන්න එපා. දෙපැත්තෙන්ම බාධා කරනවා. කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මයික්‍රෆෝන භාවිතා කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ පිරිස ප්‍රකෝප කිරීමක් කරලා යැව්වා නම්, මේ පිරිස ගිහිල්ලා දර්ගා නගරයට පහර දීමක් සිද්ධ වෙන්න ඕනෑ. කිසිම පහර දීමක් වාර්තා වෙලා නැහැ. පොලීසිය කිව්වා. මුස්ලිම් නායකයන් ඒක ඊයේ පිළිගත්තා. තමුන්නාන්සේලා එතැන ඉන්න - අර මන්ත්‍රීතුමා එතැන හිටියා. සාමකාමීව විසිර ගිය පිරිස දර්ගා නගරයේ මහ පල්ලිය ඉදිරිපිටින් යද්දී - විශේෂයෙන්ම ඒ ස්වාමීන් වහන්සේලා සඳහන් කළා. ඒක පොලීසිය සනාථ කළා. භික්ෂූන් වහන්සේලා පස් වතාවක් වරින් වර ඒ සමුළුව තුළදී නිවේදනය කරලා තිබුණා. කිසිම කෙනෙක් නීතිය අතට ගන්න එපා. සාමකාමීව විසිර යන්න. මේ ප්‍රශ්නය අපි බලා ගන්නවා කියලා. ඒ අනුව අවසාන පිරිසත් විසිර යන තුරු ඒ සමුළුවට නායකත්වය දුන්න භික්ෂූන් වහන්සේලා -

[සභාවේ සෝෂා]

සත්‍ය තිත්තයි. ඇත්ත දැන ගන්න අකමැති නිසයි මේ අය මේ සෝෂා නගමින් මට බාධා කරන්නේ. ගරු සභාපතිතුමනි, -

[සභාවේ සෝෂා]

ඔබතුමාගේ වෙලාවේදී කථා කරන්න කෝ? ප්‍රශ්නයක් අහන්න මම උත්තර දෙන්නම්. ඊළඟ පාර ඇමතිවරයාගෙන් ප්‍රශ්නයක් අහන්න. මම උත්තර දෙන්නම්. මට මගේ කථාව කරන්න දෙන්න. පෞද්ගලික් පැහැදිලි කිරීමක් මිසක් මෙතැන විවාදයක්වත්, ප්‍රශ්නවලට උත්තර දීමක්වත් නැහැ. ඔබතුමා නවක මන්ත්‍රීවරයෙක්. ඔබතුමා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය නිතරම ඝෝෂා කිරීම් කරනවා. මට සොයා ගන්නත් බැහැ කොහෙන්ද ඝෝෂා කරන්නේ කියලා. පේන්නෙත් නැහැ මට.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ දර්ගා නගරයේ මහ පල්ලිය ඉදිරිපිටින් ගමන් කරපු ජනතාවට පොලු පහරවල් එල්ල කරලා, ගල් ගහලා, තුන්වන වතාවටත් - ගරු සභාපතිතුමනි, මේ අය පෘතග්ජන මිනිස්සු. මහ රහතුන් වහන්සේලා නොවෙයි. අතන සාමණේර හිමිට අතවර කරලා තියෙනවා. ඉවසුවා. ඊළඟට ස්වාමීන් වහන්සේට පහර දුන්නා. ඉවසුවා. දැන් මෙතැනදී තුන් වන වතාව තමන්ට ගහද්දී ඕනෑම කෙනෙක් ප්‍රකෝප වීම සාමාන්‍ය තත්ත්වයක්. මේ ප්‍රශ්නය ඇති කළේ - ඒ ප්‍රදේශයේ මුස්ලිම් නායකයන් ප්‍රකාශ කරලා තිබෙනවා, අපේ පල්ලියට ඇවිල්ලා ඉන්නවා අන්තවාදී කොටසක්. අපට ඒ අයව පාලනය කරන්න බැහැ. නීතිය ක්‍රියාත්මක කරලා ඒ අයව ඉවත් කරන්නය කියලා. නමුත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අනුර සේනානායක -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

වගකීමෙන්ද කියන්නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඉතාම වගකීමෙන්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒ සභාවේ මම හිටියා. එහෙම පිළිගත්තේ නැහැ. බොරු කියන්නේ. බොරු කියන්න එපා ඇමතිතුමනි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මෙතුමා නවක මන්ත්‍රීවරයෙක්. එතුමා දන්නේ නැහැ. මේ සභාවේ මම ප්‍රකාශ කරන සෑම වචනයක්ම කියන්නේ වගකීමෙන්. මට වගකීම ගන්න බැරි වචන මම ප්‍රකාශ කරන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමා. මේක හැන්සාඩ් ගත වෙනවා. ඒ අනුව, මේ පිරිස පහර දෙන්නමයි හිටියේ. මේ පිරිස ඉවත් කරන්න මුස්ලිම් නායකයන්ට බැරි වුණු නිසා. ඒ අය පොලීසියට මැදිහත් වෙලා ඉවත් කරන්න කිව්වා. එතැන 2000 කට ආසන්න පිරිසක් සිටිය නිසා නගරයේ රැස්වීමක් තියද්දී, මේ 2000 කට ආසන්න පල්ලියේ පිරිස ඉවත් කළොත් ගැටුමක් ඇති වන නිසා පොලීසිය ඉවත් කරන්න ගියේ නැහැ. ඒ අය පොලිස් ආරක්ෂාව යෙදුවා. එතැනින් තමයි ගැටුම ඇති වුණේ. මේ රටේ මුස්ලිම් අන්තවාදයක් ක්‍රියාත්මක වෙනවාය කියලා අවුරුදු 10 ක් පුරා අපි කිව්වා. ඇහුවේ නැහැ. අද ජාත්‍යන්තර පොලීසිය කියනවා, ශ්‍රී ලංකාව මුස්ලිම් අන්තවාදීන්ගේ තිප්පලක් කියලා. මම නොවෙයි කියන්නේ. Interpol. ජාත්‍යන්තර පොලීසිය. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ අන්තවාදී පිරිස් මේ රටෙන් මුලිනුපුටා නොදැම්මොත් එහෙම අපේ රටේ ජාතික සමගිය සිහිනයක් වේවි. රටම ගිනි ගොඩක් වේවි. ඒ නිසා අන්තවාදය පරාජය කිරීමට අපි හැමෝම එකතු විය යුතුයි කියන කාරණය සිහිපත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) යටතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ කියන්න ඔබතුමා. 36(1) කියන්න. කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මම ඊයේ ගියා බේරුවල නගරයට. මමයි මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමායි, අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමායි. ඒත් එක්කම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හත් දෙනයි. අපේ ජාතික නායකතුමාත් - නායකතුමා නොවෙයි. කරු ජයසූරිය මැතිතුමාත් අපිත් එක්ක අවා. අපි ගිහිල්ලා කන්දේ විහාරෙට ගියා ස්වාමීන් වහන්සේ හම්බ වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා මට වරප්‍රසාද ප්‍රශ්නය කියන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මට වෙච්ච දේ කියන්නේ. ගරු සභාපතිතුමනි, මට සිදු වුණු දේ මම කියන්නේ. ඔබතුමා අහගෙන ඉන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තවම පටන් ගත්තේ නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

කන්දේ විහාරෙට ගිහිල්ලා ස්වාමීන් වහන්සේලා බැහැ දැකලා අපට එතැනදී කිව්වා සිංහල ගෙදරකට - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

සිංහල ගේකට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් අර මන්ත්‍රීතුමා පෘතුගීසිකාරයින් ගැන කියද්දී ඔබතුමා අහගෙන හිටියේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න. කන්දේ විහාරය නැගලා ඉක්මණටම කියන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඉතින් සභාපතිතුමා අපි එතැනට ගියා අර ගේ බලන්න. යන කොට බොදු බල සේනාවේ 50 ක් විතර අතේ පොලු, කිණිසි, පිහියා තියාගෙන - ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා තමයි ඉස්සෙල්ලාම ජීප් එකෙන් බැහැලා ගියේ අර ගේ පෙන්වන්න. යන කොටම එතුමාව ෂර්ට් එකෙන් අල්ලලා තල්ලු කළා. මම ළඟ හිටියේ. මට කිව්වා, ඔයා සිංහලයෙක්. ඔයා ඉන්න කමක් නැහැ. එයා මාව මුස්ලිම් ජාතිකයෙක් කියලා දැන ගත්තා නම් මාව එතැනම මරණවා. මේක ඇත්ත සිද්ධියක්. මේක ඊයේ වුණු දෙයක්. එතැන සිරසෙනුත් ඇවිල්ලා හිටියා. එතැන සිරසෙනුත් ඒක රෙකෝඩ් කළා. ඒගොල්ලෝ දාන්නේ නැහැ. (බාධා කිරීම්) උදය ගම්මන්පිල ඇමතිතුමා කියනවා - මෙතැන කියන කථා සම්පූර්ණ බොරු. මේ සභාව නිකම් කොහේදෝ යවනවා. මේක -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මම බොරුවක් කිව්වා කිව්වා. මම කිව්ව බොරුව මොකක්ද කියලා කරුණාකරලා සඳහන් කරන්න. මගේ වරප්‍රසාද උල්ලංඝනය වෙනවා. මේ සභාවේ මම බොරුවක් කිව්වා කියලා මේ මන්ත්‍රීතුමා සඳහන් කළා. මම කිව්ව බොරුව මොකක්ද කියලා එතුමාට සඳහන් කරන්න කියන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

උදය ගම්මන්පිල අමාත්‍යතුමා කියන කථාවෙන් තේරෙනවා. මේකට මුලා වෙන්න, උදය ගම්මන්පිල අමාත්‍යතුමා තමයි, එයාගේ ගෝලයා තමයි මේක අවුල් කළේ. මධුමාධව අරවින්ද තමයි මේ කථා කළේ. අලුත්ගමදී. (බාධා කිරීම්) මධුමාධව කවුද කියලා අහන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාම කිව්වා, එතුමා කියන බොරුව අහගන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා එක මන්ත්‍රීවරයෙක් කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කිව්වා, එතුමා කියන බොරුව අහන් ඉන්න කියලා අපට. මේකත් අහගන්න කියලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මම අහන්නේ, මම කිව්ව බොරුව මොකක්ද කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක්කෙනෙක් කථා කරන්න. මට ඇහෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

බොදු බල සේනාව කෝලාහල ඇති කරනවා. ජීවිත හතරක් අහිමි වුණා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙතුමා කියන බොරුවත් අහගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදැලි නැහැ මේ සභාව. පැහැදිලි නැහැ. මොකුත්ම ඇහෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමා, සභාව පොඩ්ඩක් නිශ්ශබ්ද කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිශ්ශබ්ද කරන්න බැහැ මේක. 36(1) කියමින් කී දෙනෙක් කථා කරනවාද? කොහොමද නිශ්ශබ්ද කරන්නේ? ගරු මන්ත්‍රීතුමා කෙටියෙන් ප්‍රකාශ කරන්න. ඔබතුමාට කථා පවත්වන්න දෙන්න බැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

එදා 15 වැනිදා රෑ තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් 36(1) කෙටියෙන් අවසන් කරන්න. මෙතුමාටත් ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මම කිව්ව බොරුව කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, උදය ගම්මන්පිල අමාත්‍යතුමා මූලාසනයෙන් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. අරක ඉවර නැහැ. වාඩි වෙන්න. ඒක ඉවර නැහැ. කරුණාකරලා වාඩි වෙන්න ඔබතුමා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, 15 වැනිදා රෑ 9.15 ට - මගේ පවුලේ කට්ටිය ඉන්නවා. ඒ කට්ටිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඔබතුමා අවධානය යොමු කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඔබතුමා අවධානය යොමු කරන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඒවා ගැන කථා කරන්න බැරි නම් මොනවාටද මේ සභාවේ වාඩි වෙලා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න දෙනවා. සභාව තිබෙන්නේ කථා කරන්න. ඔබතුමාට මේ 36(1) කියලා ඔක්කොම කථා කරන්න දෙන්න බැහැ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේ ප්‍රශ්නයෙන් මග අරින්න හදන්නේ. 36(1) කියමින් මේ ප්‍රශ්නයෙන් වෙනත් -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

9.15 ට මම මහ ඇමතිතුමාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා 36(1) කිය කියා මොනවාද මේ කථා කරන්නේ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මහ ඇමතිතුමනි, අලුත්ගම අපේ කට්ටියට එළියට බහින්න බැහැ. හැම තැනම ගිනි තියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න. වාඩි වෙන්න. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා මූලාසනයෙන් ඉල්ලීමක් කරනවා. එතුමා කියපු බොරුව කියන්න බලන්න. ඔබතුමා ප්‍රකාශ කළා එතුමා බොරුවක් කිව්වා කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, අපට වෙච්ච සිද්ධිය ගැන සභාවට කියන්නේ නැතිව කාට කියන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඔබතුමා ඒ බොරුව කියන්න. දැන් එතුමා මගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මූලාසනය මේක භාර ගත්තේ නැත්නම්, අපි මේක කාට කියන්නද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ සභාව විහිළුවකට ගන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. නැහැ. විහිළුවට නොවෙයි. මට වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. 36(1) තමයි කථා කරන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මෙතැන බොරු ටික අහගෙන හිටියා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වාඩි වෙන්න. 36(1) නොවෙයි කථා කරන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

9.15 ට මහ ඇමතිතුමා මට කිව්වා. අලුත්ගම කඩවල් 75 ක් විනාශ වෙලා ඉවරයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

කථාව ඉවර නැහැ. අහන්න. ඔබතුමාට විනාඩි 10 ක් දෙන්න පුළුවන්. මගේ වරප්‍රසාද ප්‍රශ්න ගැන කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් හරි හරි. මම ඒ ගැන සොයලා බලන්නම්. මට තව කාලය දෙන්න බැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මගේ කථාව අහන්නේ නැද්ද සභාපතිතුමා. ඒක වැරදියි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ගැන මම සොයලා බලන්නම්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම කවදාවත් සභාවේ වරප්‍රසාද ප්‍රශ්න කියලා අහලා නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා කථාව අවසන් කරන්න දැන්.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, එතුමාගේ කථාවේදී කිව්වා, මම කිව්වා කියලා 70 ක් ගිනි තියලා කියලා. සමාවෙන්න. ඔබතුමා ඒක වැරදියි කිව්වා. මම කිව්වේ ඔබතුමාත් රාත්‍රියේ කථා කරපුවාම මුස්ලිම් කඩවලින් 70% ක් ගිනි තියලයි කියන එක.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

කඩවල් 75 ක් ගිනි තියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. සමාවෙන්න. ඔබතුමා වැරදියි කියපු ප්‍රකාශය. මම අහගෙන හිටියේ. ඒකයි මම උත්තර දෙන්න හිටියේ. (බාධා කිරීම්) 70% යි කියලයි මම එතුමාට කිව්වේ. සියයට ගණන කිව්වේ. මම ඔබතුමාටත් කිව්වා නේ? අහන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔව්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මහ ඇමතිතුමා කියපු එක හරි. අලුත්ගම කඩ 200 ක් -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මන්ත්‍රීතුමා එතුමාගෙනුත් අහන්න මම එතුමාට කිව්වෙත් ඒ ගණන ඒ වෙලාවේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපට අසාධාරණයක් වුණු නිසා තමයි අපි මහ ඇමතිතුමාට ඒ වෙලාවේ කථා කළේ. අපේ පවුලේ කට්ටිය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ කියන්නේ තව 30 ක් ඉතිරි වෙලා තිබෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපේ පවුලේ කට්ටිය ඉන්නවා. ඒ කට්ටිය ගෙන්න ගන්න ඕනෑ. කොහොමද මෙහෙම ගෙන්න ගන්නේ කියලා මම මහ ඇමතිතුමාගෙන් ප්‍රශ්න කළා. ඉතින් මහ ඇමතිතුමා කිව්වා, අද මේ ප්‍රශ්න ලොකු වෙලා. මේක අද රට කොළඹට එන්නත් පුළුවන්. අපි කොළඹ ආරක්ෂා කරන්න ඕනෑ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කාරුණිකව දැන් කථාව අවසන් කරන්න. දැන් ගොඩක් කථා කළා. වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා මට මේ විධියට ඉඩ දෙන්න බැහැ. ඔබතුමා මේ ලොකු දේශනයක් කරනවා නේ? කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා මේ සභාවට එතුමාගේ කථාවේදී කිව්වා, මම කියන බොරුවත් අහගන්න කියලා. ඒ බොරුව කියලා ඉවර වෙලා අහනවා මොකක්ද කියපු බොරුව කියලා දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඉතින් හරි. ප්‍රශ්නයක් නැහැ ඉතින්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම අහන්න කැමැතියි. මේ සභාව නොමග යැව්වාද? නැත්නම් එතුමා ඇත්තටම බොරුවක් කිව්වාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ බොරු ඔක්කොම හැන්සාඩ් එකෙන් අයින් කරන්න ගරු සභාපතිතුමනි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

එතුමාගේ පැත්තෙන් මම කියන දේ බොරු. මම කිව්වේ නැහැ නේ මම කියන්නේ බොරු කියලා. එතුමා කියන දේ බොරු - මම කියන බොරුව අහ ගන්න කියලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කියන බොරුවත් අහගන්න කිව්වා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මට සිංහල කියලා දෙන්න බැහැ මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කිව්වා, මම කියන බොරුවත් අහගන්න කියලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

හරියට හරි. මට කිව්වා, මම කියන්නේ බොරු කියලා. මම කිව්වා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් ඔබතුමා අපව නොමග යැව්වාද කියලා මම අහන්නේ?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

නැහැ. ගරු මන්ත්‍රීතුමා, මම ඉතා පැහැදිලිව කිව්වා. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කියන දේ මට බොරු කියලා පේන්න පුළුවන්. මේක ඇවිල්ලා හැඟීමක්. බොරු ද සත්‍ය ද කියන එක. චතුරාර්ය සත්‍යයෙන් තොරව, සාපේක්ෂ නොවන සත්‍යයක් නැත කියලා තිබෙනවා. ඔබතුමා සත්‍ය යැයි කියලා විශ්වාස කරන දේ මට අසත්‍ය. මගේ අසත්‍ය ඔබට සත්‍ය වෙන්න පුළුවන්. ඉතින් මම කියන දේ බොරුයි කියලා හිතුනත් ඒක අහගෙන ඉන්න කියලයි කිව්වේ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මගේ වරප්‍රසාද කඩ වීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කන්දේ විහාරේ ගිය එක්කෙනෙක්ද? ඔබතුමාත් කන්දේ විහාරේ ගියාද?

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඔබතුමාට 36(1) මොකක්ද කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. කියන්න. කියන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, 36(1) වගන්තිය රීතිවලින් අයින් කරන්න කියලා මම යෝජනා කරනවා. මේක මහා කරදරයක්. (බාධා කිරීම්)

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඒ මෙතුමා ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් හිත්දා. ඉතින් මෙතුමන්ලා නේ අපේ වරප්‍රසාද කඩන්නේ. ඉතින් මෙතුමාට 36(1) අවශ්‍ය නැහැ. ඒ වුණාට අපට අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉක්මනට ඔබතුමාගේ 36(1) –

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ඊයේ දිනයේදී අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමක් සමඟ, කරු ජයසූරිය මැතිතුමා සමඟ කළුතර දිස්ත්‍රික්කයේ සංචාරයක යෙදුණා. (බාධා කිරීම්) එතකොට අපට අවාසනාවන්ත සිදු වීමක් - පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට මමත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීම මොකක්ද කියලා මට කරුණාකරලා කියන්නකෝ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඔව්. ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ මොකක්ද වරප්‍රසාද කඩ වීම? ඔබතුමා සභාවේ කාලය ගන්න එපා මන්ත්‍රීතුමා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, කිසිම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය ගන්න එපා. ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් වුණේ නැහැ නේ කණ්ඩායමක් ගියාට. මේ බොරු ප්‍රකාශ කරන්න එපා මන්ත්‍රීතුමා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මට (බාධා කිරීම්) බැන්නා. අවස්ථාව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න දෙයක් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

නැහැයි කියන්නේ කොහොමද? අපට මරණීය තර්ජන එල්ල කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා මේ 36(1) කිය කියා තව කථා කරන නිසා මට න්‍යාය පත්‍රයට යන්න බැහැ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, දැන් නැවත මගේ වරප්‍රසාදයක් අහිමි වෙන ලකුණු යනවා. වරප්‍රසාද මුවාවෙන් සිංහල මුස්ලිම් අහිංසක ජනතාවගේ මේ ප්‍රශ්නයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා 36(1) කිය කියා කන්දෙ විහාරෙයි අරෙහෙ ගියයි. මෙහේ ගියයි කියලා කියනවා. මට ඕවා -

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මට කියන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වෙච්ච -

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඉතින් ඔබතුමාද දන්නේ? මමද? මම නේ ගියේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වුණු වරප්‍රසාද කඩ වීම කරුණාකරලා මට කියන්න.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඒක නේ. ඉතින් ඔබතුමා කථා කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරු කණ්ඩයමක් ගියා. අහවලා ගියා කියලා වැඩක් නැහැ. ඔබතුමා වාගේ කතන්දර කියන්න මට කැමැති නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඉතින් මට කියන්න අවස්ථාව දෙන්න. මට ඉතින් කියන්න අවස්ථාව දෙන්නේ නැතිව මම කියන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඉතාමත් කෙටියෙන් මම කියන්නේ. අපි කළුතර ගියාම, අපි බේරුවලට ගියාම අපේ ඉෆ්තිකාර් මන්ත්‍රීතුමාත් අපිත් සමග ගියා. ඉෆ්තිකාර් මන්ත්‍රීතුමා අපට යෝජනා කළා, සිංහල ජාතික එක නිවසකට හානියක් වෙලා තිබෙනවා. අපි ඒක බලන්න යමු කියලා. එතකොට අපි සියලුම මන්ත්‍රීවරු එතැනට ගියා. එතැන පොලීසියෙන් හිටියා. එතැන එස්.ටී.එෆ් එකෙන්, විශේෂ කාර්ය බලකායෙන් හිටියා. අපි ඒ සිදු වුණු හානිය දිහා බලාගෙන ඒ හිමිකරුත් සමඟ කථා කරමින් ඉන්න කොට කණ්ඩායමක් ආවා. ඒ කණ්ඩායම ඇවිල්ලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ කතන්දර කිය කියා ඉන්න එපා. මට අහගෙන ඉන්න බැහැ ඕවා. කෙටියෙන් කියන්න. (බාධා කිරීම්) 36(1) කියලා ඔහොම දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න. (බාධා කිරීම්) වාඩි වෙන්න. දෙන්න බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මගේ වරප්‍රසාදයක් කඩ වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද නොවෙයි. සභාවේ කටයුතු -

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

එතකොට ඒ අය ඇවිල්ලා අපට තර්ජනය කරන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමන්ලා මේ 36(1) කියමින් විහිළු කරන්න එපා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

පොලීසිය නිකම් බලාගෙන හිටියා. එස්.ටී.එෆ් එක නිකම් බලාගෙන හිටියා. අන්න ඒකයි අපට තිබෙන ගැටළුව. පොලීසිය බලාගෙන හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. මේ 36(1) කිය කියා විකාර කථා කියන්න එපා ගරු මන්ත්‍රීතුමා.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අපට මන්ත්‍රීවරුන් හැටියට එහෙම දෙයක් වුණා නම්, එතකොට හිතා ගන්න පුළුවන් අර සිංහල ජාතීන්ට, මුස්ලිම් ජාතීන්ට පොලීසිය ඉන්දැද්දී වුණු දේවල්. පොලීසිය බලාගෙන හිටියේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් සිද්ධ වුණේ නැහැ නේ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් නම්, මම සොයලා බලන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

කරුණාකරලා මේ කාගේ වැරැද්දද කියන එක නොවෙයි මෙතැන තිබෙන්නේ. මේක සිංහල ජාතියටද, එහෙම නැත්නම් මුස්ලිම් ජාතියට ද, එහෙම නැත්නම් ද්‍රවිඩ ජනතාවට ද කියන එක නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා -

**ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ශ්‍රී ලාංකිකයන් හැටියට අපි සියලු දෙනාටම මේ අවසානාවන්ත තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ. කරුණාකරලා ඒක නතර කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. මට ඉඩ දෙන්න බැහැ.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න. මම කාලය දෙන්නම්. පොඩ්ඩක් ඉන්න. ඔබතුමා වාඩි වෙන්න කෝ. මම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ විධියට ගියොත්, මෙහෙම 36(1) හැමදාම කියන්න ගියොත් එහෙම මේ සභාවේ න්‍යාය පත්‍රයට යන්න බැහැ මට. තවම සභාවේ න්‍යාය පත්‍රය අවසන් නැහැ. ඔබතුමන්ලා මේ 36(1) කියමින් දෙපැත්තෙන්ම මේ - 36(1) කියලා කථා කරන්න ගියාම මට සභාව ගෙනියන්න බැහැ මේ විධියට. ඒ නිසා කරුණාකරලා පුළුවන්තරම් ඔබතුමන්ලා මේ 36(1) යටතේ තමන්ට වුණු ප්‍රශ්නයක් ගැන විතරක් කථා කරන්න. ඔබතුමා කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

ගරු සභාපතිතුමනි, මට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපනය කරලා තිබෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොවෙයි. පළාත් සභාව ගැන කථා කරන්න ඔබතුමා. (බාධා කිරීම්) මේ 36(1) මොකක්ද කියන්න කෝ?

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

කියන්න දෙන්නේ නැහැ නේ ඉතින්. ඔබතුමා අහන්නෙත් නැහැ. අරගොල්ලෝ කියන්න දෙන්නෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන්න.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

පළාත් සභාවේ 36(1) යටතේ මන්ත්‍රීවරයෙකුට තියෙන වරප්‍රසාදමය අයිතිය කඩ වීමක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමන් කැමැති තැනකට යාම් ඊමේ තිබෙන නිදහස කඩ වීමක් පිළිබඳව නවක මන්ත්‍රීවරයෙක් විධියට මට වුණු අසාධාරණය කියන්න ඔබතුමා ඇහුම්කන් දෙන්නය කියලා පළමුවෙන් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම ඇහුම්කන් දෙනවා. ඔබතුමා කියන්න.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

ගරු සභාපතිතුමනි, මට ආරාධනයක් තිබුණා අලුත්ගමත් මතුගමත් අතර ප්‍රදේශයේ විහාරස්ථානයක තිබෙන උත්සවයකට සම්බන්ධ වෙන්නය කියලා මේ කියන දවසේ. මතුගම පාරේ අලුත්ගමින් යන්න හදන කොට සිවිල්

ආරක්ෂක බලකායට අයිති උදව්ය පාර හරස් කරලා වේදිකාවක් ගහනවා. ඒ ගහන වේදිකාව නිසා එතැනින් පාරේ යන්න බැරි නිසා අහනකොට බලපත්‍රත් නැහැ. ශබ්ද විකාශන යන්ත්‍රත් සකස් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඒවා අදාළ නැහැ. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ? ඔබතුමා මේ Stage ගහන ඒවා කථා කරන්න ඕනෑ නැහැ මෙතැන. ඔබතුමාගේ 36(1) කියන්න. ඔබතුමාට වුණු ප්‍රශ්නය කෙටියෙන් කියන්න.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

තාම මම මතුගමින් හැරුණා විතරයි. මම මේ අලුත්ගම පාරෙන් හැරුණා විතරයි තාම. මම මතුගම පාරේ හැරෙනවා මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැරි හැරි එහෙම යන්න බැහැ. ඉක්මණට කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාම පාරේ යනවා.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

මට කියන්න, මට හැරෙන්න දෙන්න එපැයි. මම තාම හැරුණේ නැහැ. ගරු සභාපතිතුමා මට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා පාරේ යනවා තාම.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

මට අලුත්ගමින් හැරෙන්න දෙන්නේ නැහැ. පොඩ්ඩක් මට හැරෙන්න දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාම මතුගම පාරේ යනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා මතු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවම මෙතුමා කථා කරනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

හරි. ඒක ඉවර වුණාම ඉදිරිපත් කරන්න අවසර ඉල්ලනවා. සභාව යන්නේ නැහැ නේ? සභාව නිකම් පිස්සු කෙළිනවා.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

ගරු සභාපතිතුමනි, දැන් ඒ යන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

දැන් ඒ හැරෙන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න කෝ? ගරු මන්ත්‍රීවරු පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. සභාව මේ විධියට යන්න බැහැ.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

මට හැරුණාට පස්සේ තමයි කඩවීම සිද්ධ වෙන්නේ. ඒ නිසා හැරෙන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා 36(1) කියලා කෙළින්ම කියන්න. වංගුවලින් හැරි හැරි යන්න එපා. කන්දෙ විහාරේ නගින්නත් එපා. කෙළින්ම ප්‍රශ්නය කියන්න ඔබතුමා.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

මට හැරෙන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැරෙන්න බැහැ. හැරි හැරි ඉන්නත් බැහැ. කෙළින්ම එක පාරට ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයට එන්න. ඕවා අහගෙන ඉන්න බැහැ. මේ සභාව යන්න ඕනෑ තව. (බාධා කිරීම්)

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

දැන් මේ මගේ වරප්‍රසාද කඩ වීම ගැන මම කියන්නේ නැහැ. මම කියන්නේ එක දෙයයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න. ඔබතුමාට හැරි හැරි යන්න විධියක් නැහැ.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

හැරෙන්නේ නැහැ. මම නවත්වන්නම්. බෞද්ධ දඩ මීමාව, කුළු මීමාව හික්මවන්න ඕනෑ. අපේ සරත් ෆොන්සේකා මහත්තයාට බලපත්‍ර අරගෙනත් වේදිකා ගහලා රැස්වීම් තියන්න දුන්නේ නැති රටේ අර බෞද්ධ - (බාධා කිරීම්)

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, ඒ ගැන කියන්න ද වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා කථා කරන්නේ. මේ අනවශ්‍ය දේවල් කථා කරන්නේ. ගරු සභාපතිතුමනි, 36(1) කියලා -

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

සිංහල මුස්ලිම් භේද ඇති කරලා, වාද්දුව නගරයේ තිබුණු කඩයකට බෝම්බ ගැහුවා. ඒ දක්වා මේක ආවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

අපි ජීවත් වෙන්නේ මේ ප්‍රදේශවල. මුස්ලිම් උදවිය ඉන්න තැන්වල. ඒ නිසා අපට අයිතියක් තිබෙනවා. මේක අටළුගමට, බණ්ඩාරගමට, එළුවිලට, පරත්තට, කෙසෙල්වත්තට එන්නේ නැතිව මේක නවත්වා ගන්න මන්ත්‍රීවරයෙක් විධියට අයිතියක් තිබෙනවා. ඒකයි වරප්‍රසාදය. ඒ නිසා මේ කුළු මීමන්ව මේ ආරක්ෂක ලේකම්වරයාගේ ආරක්ෂාව යටතේ - (බාධා කිරීම්) අපේ ගමේ අපට ඡන්දය දීපු අපේ උදවියගේ වරප්‍රසාද කඩ වෙනවා කියන්නේ අපේ වරප්‍රසාද කඩ වීමක්. ඒ උදවියගේ වරප්‍රසාද කඩ වෙනවා නම් ඒක අපේ වරප්‍රසාද කඩ වීමක්. ඒ නිසා මේක අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ වැඩේ සිද්ධ වුණාට පස්සේ -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, කථා පවත්වන්න දෙන්න එපා. සභාව -

[සභාවේ ඝෝෂා]

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

අටළුගම කියලා කියන්නේ, එළුවිල කියලා කියන්නේ පරත්ත කියලා කියන්නේ විශාල මුස්ලිම් පිරිසක් ඉන්න - ඒ ප්‍රදේශ නිසා මේ කුළුමීමාව නිශ්ශබ්ද කරන්න කියන ඉල්ලීමයි ඔබතුමාගෙන් කරන්නේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. ගරු සභාපතිතුමනි, 36(1) යොදාගෙන සභාව දිගින් දිගටම කාලය ගත කරනවා. ගරු සභාපතිතුමනි, සභාවේ තව කටයුතු කරන්න ගොඩක් දේවල් තිබෙනවා. ඒ අනුව අපේ වරප්‍රසාද කඩ වෙනවා. ඒ නිසා ඔබතුමාගේ බලතල පාවිච්චි කරලා 36(1) යටතේ අදාළ ප්‍රශ්නය පමණක් යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා පොඩ්ඩක් වාඩි වෙන්න. කරන්න බැහැ, මේ විධියට.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, අලුත් මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව අවබෝධයක් ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) කිය කියා හැම තිස්සේම කථා කරන්න ගියාම මට න්‍යාය පත්‍රයට යන්න බැහැ. න්යාය පත්‍රයේ තව ගොඩක් දේවල් තිබෙනවා. කරුණාකරලා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

නවක මන්ත්‍රීවරයෙක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ එක එක්කෙනෙක්ගේ ප්‍රශ්නයක් නිසා -

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

Point of order. රීති ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති ප්‍රශ්නයක් වුණත් දිගින් දිගට ඉඩ දෙන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

දිගට යන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රීති අංකය කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මට පොඩි ප්‍රශ්නයක් අහගන්න අවස්ථාව දෙන්න. කාලය ගන්නේ නැහැ. මේ සභාවේ ගරු මන්ත්‍රීවරයෙක්, ප්‍රශ්නයක් අදහසක් ඉදිරිපත් කරන කොට ඒ අදහස වැරදි අදහසක් නම්, බොරුවක් නම් ඒ ගැන මන්ත්‍රීවරයෙක් හැටියට අපට අයිතියක් තිබෙනවා. ඒ රීතිය මොකක්ද කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හැමෝටම තිබෙනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

කොහොමද ඒ ගැන අපි එතුමා එක්ක වාද වෙලා හරි ඒක නිවැරදි කරන්නේ?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

20 වැනිදාට.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට දිගින් දිගටම මේ සභාවේ කාලය මෙහෙම නාස්ති කරන්න දෙන්න බැහැ.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

ගරු සභාපතිතුමනි, ඉතාමත් ගෞරවයෙන් මම ඉල්ලා සිටිනවා, මට අවස්ථාව දෙන්නය කියලා. 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්නේ. පළාත් සභා මන්ත්‍රීවරයකුට තම කටයුතු කර ගෙන යාමට අවහිර වන ආකාරයේ ක්‍රියාවක් හෝ බලපෑමක් හෝ ඇති වුවහොත් එය වරප්‍රසාද ප්‍රශ්නයක් ලෙස සලකලා තිබෙනවා. කවුරුත් දන්නවා ගරු සභාපතිතුමනි, මම රක්ෂිත බන්ධනාගාරයේ ඉන්නේ. දැන් මගේ මේ හතර වැනි මාසේ යන්නේ.

[ගරු රොයිස් විජිත ප්‍රනාන්දු]

මේ 21 වැනිදාට. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ මාව මාස තුනක් රඳවාගෙන හිටියා. මම මේ සභාවට එන්නේ මීගමුව බන්ධනාගාරයේ ඉඳලා. සිකුරාදා මට ෆැක්ස් පණිවුඩයක් එවනවා බන්ධනාගාර මූලස්ථානයේ කොමසාරිස්වරයාගෙන්. මීගමුව බන්ධනාගාරයේ සිට මේ සභා ගැබට ඒමේදී වියදම් වන ඉන්ධන ගාස්තුත්, මට ආරක්ෂාව සපයන ආරක්ෂක නිලධාරීන්ගේ පඩිත් මම ගෙව්වායින් පස්සේ මේ සභාවට මාව ගේන්නය කියලා. මම හිතනවා, ජනතා පරමාධිපත්‍ය විසින් මාව පත් කරලා තිබෙනවා. ඒ ජනතා පරමාධිපත්‍යයට අපි ගරු කළ යුතුයි. එම ෆැක්ස් පණිවුඩයේ තවදුරටත් තිබෙනවා, එම ගෙවීම් කටයුතු කළායින් පස්සේ මාව අරන් එන්නය කියලා. ඊයේ මගේ බිරිඳ ඒ මුදල බන්ධනාගාරයට ගෙව්වා. මම දන්නේ නැහැ, ඒ මුදල කුමන නීතිමය තත්ත්වයක් තුළ, කුමන නීතිමය ප්‍රතිපාදන යටතේ භාර ගත්තාද? මොන විධිවිධාන යටතේ අය කර ගත්තාද? ඒක මහා භාණ්ඩාගාරයට කුමන බිල්පතක් යටතේ ගෙවනවාද කියන එක මම දන්නේ නැහැ. නමුත් මීට පෙර කිසිම පූර්වාදර්ශයක් තිබුණේ නැහැ. නගර සභාවල, ප්‍රාදේශීය සභාවල අදටත් මන්ත්‍රීවරු රක්ෂිත බන්ධනාගාර ගත වෙලා ඉන්නවා සැකකරුවන් හැටියට. ඉතින් මට විතරක් වෙන හැන්දකින් බෙදීම සාධාරණයි කියලා මම හිතන්නේ නැහැ. මටත් ඒ ආණ්ඩුවේ අයට බෙදන හැන්දෙන්ම බෙදන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අතීතයේ අපි දන්නවා හෙලිකොප්ටර්වලින් ගියා. දිවංගත ආරක්ෂක ඇමතිවරු. බෝගම්බර ඉඳලා. උඩතලවින්න සිද්ධිවලදී හෙලිකොප්ටර්වලින් ගියා. ඒවාට ගෙවීම් කටයුතු කරද්දී බන්ධනාගාරයෙන්ද මුදල් අමාත්‍යාංශයෙන්ද කියලා මතභේද ඇති වුණා. බන්ධනාගාරය කිව්වා අපට බස් එකක්වත් ගන්න සල්ලි නැතිව අපි කොහොමද හෙලිකොප්ටර්වලට ගෙවන්නේ කියලා. ඉතින් මගෙන් ඊයේ රුපියල් පන් දාහකට ආසන්න මුදලක් අය කර ගත්තා. මම බන්ධනාගාර නිලධාරීන්ට දොස් කියන්නේ නැහැ. මේක පරිපාලනයට කොහෙන් හරි ආපු දෙයක්. මම ඉන්නේ ඔබතුමා භාරයේ. මම හිතනවා, මේක වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා. ඉතාමත් ගෞරවයෙන් මම මෙය ඔබතුමාගේ අවධානයට යොමු කරලා මට සහනයක් ලබා දෙන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සඳහන් කළ කාරණය පිළිබඳව මම හිතන්නේ මීට පෙර අපට ඒ වාගේ ප්‍රශ්නයක් මේ සභාවට ආවේම නැහැ. කවදාවත්ම ආවේම නැහැ. මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක වැරදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. මටත් තේරෙනවා. මම ඒ ගැන සොයා බලන්නම්. අපි ඒ ගැන සොයා බලන්නම්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ මෙය ඉතාම නරක පූර්වාදර්ශයක් වෙමින් පවතිනවා. මේ රටේ අපරාධ නීතියක් තිබෙනවා. ඒ නීතිය තිබෙන්නේ දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව. මම නීතිඥවරයෙක් වශයෙන් අවුරුදු 16 ක් 17 ක් වැඩ කරලා තිබෙනවා. මම කිසිම තැනක කවදාවත් අහලා නැහැ මේ වාගේ නරක ආදර්ශයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මමත් අහලා නැහැ. මමත් ඒක පිළිගන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ සභාවටත් ආදර්ශයක් වෙමු. මම හිතන්නේ ඉතාමත් ක්ෂණික පියවරක් ගත යුතුයි. මේ මන්ත්‍රීතුමා කරන ලද කටයුත්ත කුමක් වුවත් එය අධිකරණයට භාර දෙමු. නමුත් මීට අදාළ කටයුත්ත සොයා බලන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ගැන සොයා බලන්නම්. කරුණාකරලා මට ෆැක්ස් එකේ කොපියක් දෙන්න කෝ. මට, සභා ලේකම්තුමා -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක දෙන්නේ නැහැ. මෙතුමාට දෙන්නෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට දෙන්නෙත් නැහැ නේද? හරි අපි ඒ ගැන සොයා බලන්නම්. මම දැන් ඉතාමත්ම ගෞරවයෙන් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. අපි දැන් 36(1) ටික වෙලාවකට නවත්වමු. 36(1) නවත්වලා න්‍යාය පත්‍රයට අපි දැන් යමු. නැත්නම් මට මේ වැඩේ කරන්න බැහැ. 1.15 යි දැන් වෙලාව. සභාවේ කටයුතු සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු සභා කටයුතු අමාත්‍යතුමාට අවස්ථාව.

## පළාත් සභාවේ කටයුතු
## PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි. *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය අනුව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු ප්‍රමුඛතාවයට ගැනෙනවා. පොදු කටයුතු යටතේ කෘෂිකර්ම, ගොවි ජන සේවා, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු හා සංස්කෘතික ගරු අමාත්‍යතුමාට අවස්ථාව.

## බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය : පළමුවර කියවීම
## MINOR IRRIGATION STATUTE OF WESTERN PROVINCE: FIRST READING

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, *"2013 අංක .... දරන බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය"* මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

මෙහි 2013 යන්න ඉදිරි සංශෝධන ඉදිරිපත් කරන අවස්ථාවේදී 2014 වශයෙන් සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන බව වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීති ප්‍රකාරව මීළඟට තිබෙන්නේ, ලේකම්තුමා විසින් අසුනින් නැගී සිට ප්‍රඥප්තියේ පූර්විකාව සභාවට ඉදිරිපත් කිරීම. මම ඔබතුමාට ආරාධනා කරනවා පූර්විකාව ඉදිරිපත් කරන ලෙස.

**හේමන්ත සමරකොන් - සභා ලේකම්**
Hemantha Samarakoon - Council Secretary

ගරු සභාපතිතුමාගේ නියමය පරිදි, ප්‍රඥප්තියේ පූර්විකාව ලෙසින් වූ,

"පළාත් එකකට වැඩි සංඛ්‍යාවක් හරහා දිවෙන ගංගාවලට අදාළ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර බස්නාහිර පළාත තුළ වූ සියලුම සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළුව සුළු වාරි කර්මාන්ත ඉදි කිරීම, පුනරුත්තාපනය කිරීම හා නඩත්තු කිරීමට අදාළ නීතිය සංස්ථාපනය කිරීම පිණිස ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තියේ විධිවිධාන 453 වන අදිකාරිය වූ වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන සමග අනනුකූල වේ" යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් කරුණක් ඉදිරිපත් කරනවා. මෙම ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන්නය කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ගේනවා ගේනවා. ඉදිරිපත් කරනවා. අපි ඊළඟට ගේනවා ඒක. සභා රීති ප්‍රකාරව ප්‍රඥප්තිය පළමුවර කියවීමේ වැඩ කටයුතු දැන් අවසන් වුණා. මීළඟට එම ප්‍රඥප්ති කෙටුම්පත දෙවන වර කියවීමට දිනයක් නියම කර

[ගරු සභාපතිතුමා]

ගැනීම සහ ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කිරීම සඳහා දිනයක් අපි වෙන් කර ගැනීමට අවශ්‍යව තිබෙනවා.

***අනතුරුව, ප්‍රඥප්ති කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.***
*Accordingly, it was ordered that the Statute be forwarded to the Committee on Statutes and Laws.*

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම මෙතැන අද දවසේ විශාල විවාදයකට බඳුන් වුණා. එකක් වරප්‍රසාද ප්‍රශ්න පිළිබඳවත්, ඒ වාගේම පැහැදිලි කිරීම් පිළිබඳවත්. දැන් මම ඔබතුමාට මතක් කරන්නේ, ඔබතුමාම ප්‍රකාශ කළා, පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී කාලය වෙන් කරලා තිබෙන හැටි. මිනිත්තු 30 යි. ඒකෙන් 20 ක් ආණ්ඩු පක්ෂයටත්, මිනිත්තු 10 ක් විපක්ෂයටත් කියලා. දැන් මම මතක් කරන්න කැමැතියි V වන පළාත් සභාවේ, පසුගිය පළාත් සභාවේ විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම ලෙස අපට හිටියේ 33 දෙනයි. එතකොට විපක්ෂයේ හිටියේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 30 කුත්, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු තුන් දෙනෙකුත් පමණයි. අද විපක්ෂයේ වෙනත් පක්ෂ ගණනාවක් සැදිලා තිබෙනවා. නමුත් එදා තිබුණු වෙලාවම තමයි තාමත් අදත් උපයෝගී වෙන්නේ. ආණ්ඩු පක්ෂයට මිනිත්තු 20 යි. අපට 10 යි. ඒ නිසා අපේ මන්ත්‍රීවරු 33 මේ වන විට වැඩි වෙලා තිබෙනවා 45 දක්වා. මම ඒ ගැන ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. සභා කටයුතු අවස්ථාවේදී සාකච්ඡාවට බඳුන් කරලා ඒ වෙලාව පිළිබඳව පොඩ්ඩක් අපට එහෙ මෙහේ කරලා දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි සාකච්ඡා කරමු. සාකච්ඡා කරලා කාලය වෙන් කර ගනිමු. අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ පෞද්ගලික මන්ත්‍රී කටයුතු යෝජනා දෙකකුත් තිබෙනවා. ඒත් එක්කම මට ඉදිරිපත් කරලා තිබෙනවා, රීති අත්හිටුවීමේ යෝජනා දෙකක්. විපක්ෂයෙන් සහ ආණ්ඩු පක්ෂයෙන්. නමුත් කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසා සභාව මින් ඉදිරියට යන්න මට කාලය මදි. ඒ නිසා මම මේ අවස්ථාවේදී සභා කටයුතු ගරු අමාත්‍යතුමාට ආරාධනා කරනවා සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන ලෙස. අපට කාලය මදී අනිත් යෝජනා ගන්න.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.19 ට, 2014 ජූලි මස 08 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.19 p.m till 9.30 a.m. on 08.07.2014*